**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජා.ජ.ස.ජ.ම) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 **විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 32 ට පටහැනි ලෙස ජංගම වත්කම් නියෝජනය කරනු ලබන වෙළෙඳ ලැබිය යුතු දැ හි රු.8,506,031ක අසාමාන්‍ය බැර ශේෂය බැරකම් වලට හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට සමානව ජංගම වගකීම් නියෝජනය කරන රු. 1,078,112 ක රඳවා ගැනීම් හර ශේෂයක් ලැබිය යුතු දැට එරෙහිව හිලව් කොට සමාලෝචනය කළ වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට අමතරව දෙහිවල කළමනාකාර කාර්යාලයට සහ මොරටුව ප්‍රදේශයේ ඉංජිනේරු කාර්යාලයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ බොල් ණය ලෙස කපා හැර තිබූ රු.51,411,173 ක් සහ රු.65,226,954 ක් වෙනත් මෙහෙයුම් වියදම් ලෙස හඳුනා ගැනීමකින් තොරව මනු ගත විකුණුම් වලට එරෙහිව හිලව් කොට තිබුණි. | හස්තපොත් පද්ධතිය පරිගණකගත කරමින් තිබීම හේතුවෙන් මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට පැවතෙමින් පවතී. මෙම ගැටළුව නිවැරදි කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලද අතර එහි කටයුතු සිදු වෙමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| ii. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 60 ට පටහැනි ලෙස තොග, ණය ගැති, අත්තිකාරම් සහ මුදල් පොත් ශේෂයන් ඇතුලත් වන රු. 149,681,812 ක ක්‍රියාකාරී නොවන වත්කම් | හස්තපොත් පද්ධතිය පරිගණකගත කරමින් තිබීම හේතුවෙන් මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට පැවතෙමින් පවතී. | -එම- |

| | | | |
|---|---|---|---|
| | වට්නාකමක් හඳුනා ගෙන තිබූ අතර එකිනෙක අයිතමයන්ගේ ද්‍රවශීලතාවය වෙන වෙනම සැලකිල්ලට ගැනීමකින් තොරව එය ඉතා ඉහළ අද්‍රවශීලී අයිතමයන් ලෙස දක්වා තිබුණි. | | |
| iii. | තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 02) 9 වෙනි ඡේදයට පටහැනිව, වසර තුනකට වඩා වැඩි කාලයක් චලනය නොවූ මුළු වටිනාකම රු. 632,408,899 ක් වූ තොග ඒවායෙහි ශුද්ධ උපලබ්ධි වටිනාකම තක්සේරු නොකර එහි පිරිවැයට වාර්තා කර තිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 02 හි 06 වන වගන්තියට අනුගතව එය ගණනය කිරීම ප්‍රායෝගික නොවේ. මෙම සියලු අයිතම අඛණ්ඩව වසර තුනක කාලයක් තුළ චලනය නොවන ලෙස සටහන් වී ඇතැයි පැවසිය නොහැක. එබැවින්, එම චලනය නොවන කොටස් සඳහා ශුද්ධ උපලබ්ධි වටිනාකම තක්සේරු කිරීම අවශ්‍ය නොවේ. | තොග වටිනාකම් හඳුනාගැනීමට අදාලව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 02) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| iv. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 07) 07 වන වන වගන්තියට පටහැනිව ,ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කරනු ලැබූ රු.1,455,412 ක් සහ එස්ක්‍රො ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කර තිබූ රු.මිලියන 11,828.23 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුල මූල්‍ය වත්කම් හා ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබුණි. කෙසේ වෙතත්, එස්ක්‍රෝ ඉතුරුම් ගිණුමේ ශේෂයෙන් රු.මිලියන 2,065.8 කට සමාන මුදලක් වර්ෂය තුළ උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. | ලංකා බැංකුවේ ඉතුරුම් ගිණුමේ තැන්පතුව කෙටි කාලීනව භාවිතා කිරීමේ අදහසින් සිදු කර නොමැත. එබැවින් මෙය මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉවත් කළ හැකිය. | වත්කම්, ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| v. | ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) 41 සහ 42 ඡේදවලට පටහැනිව, 2020 වර්ෂය සඳහා ජල සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 3,797,412 ක කුලී ආදායම සහ 2020 වර්ෂයට අදාළව සීතාවක කළමණාකාර කාර්යාලයෙන් සහ ගාල්ල කළමණාකාර කාර්යාලයෙන් ලද පිළිවෙලින් රු. 354,080 ක සහ රු. 1,078,301 ක මලාපවහන ආදායම සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද, මහ කොළඹ මලාපවහන අංශයට අදාළව 2020 පෙබරවාරි 07 වන දින සිදු වූ දෝෂය නිවැරදි කිරීම සඳහා වර්ෂය තුළ මලාපවහන ආදායම | ජල සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබෙන කුලී ආදායම නිවැරදි වර්ෂයේදී ගැලපුම් කරනු ඇත. රු. 22,696,939 ක නිවැරදි කිරීම් ජ'නලය 2021 පෙබරවාරි මාසය සඳහා නිකුත් කරන ලද වැරදි බිල්පත් ගැලපීම සඳහා සකස් කර ඇත. | වැරදි සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු. 436,090 කින් හර කර තිබූ අතර කල් බදු ඉඩම්වල පිරිවැයට පූර්ව වර්ෂයේ ගැලපීමක් ලෙස හඳුනාගත යුතුව තිබූ රු. 700,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ කල් බදු ඉඩම් මාරුකිරීමක් ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. ඊට අමතරව බස්නාහිර-මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට (මාලිගාවත්ත) අදාළව නිකුත් කල වැරදි බිල්පත් හේතුවෙන් පසුගිය වර්ෂවල බිල්පත් ආදායම ලෙස හඳුනාගෙන තිබූ රු. 22,696,939 ක් සමාලෝචිත වර්ෂයේ අඩු කළ හැකි ගැලපුම් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) 41 සහ 42 ඡේදයට අනුව එය ගැලපීම් කිරීමට කටයුතු නොකර එය වර්ෂයේ මනුගත ආදායමට ගලපා තිබුණි. | | |
| vi. | වක්වැල්ල ජල පවිත්‍රාගාරයේ සහ ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා සඳහා 2018 සහ 2019 වර්ෂයන් තුළදී දැරූ රු. 5,855,591 ක අළුත්වැඩියා වියදම කල වැඩ වටිනාකමක් ලෙස වරදවා හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, නිවැරදි කිරීම සිදු කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ(ශ්‍රී.ලං. ගි.ප්‍ර 08) 42 වැනි වගන්තිය ප්‍රකාරව ගැලපීම් සිදු කිරීම වෙනුවට ඊට සමාන මුදලක් වර්ෂය තුළ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, අංක 80836249 දරන ස්ථාවර තැන්පතුවට අදාළව පොලී වශයෙන් 2017 වර්ෂය තුළ ලැබුණු රු. 1,224,986 ක් වැරදියට 2017 වර්ෂයේදී මාර්ගස්ථ මුදල් ගිණුමට බැර කොට තිබුණි. කෙසේ වෙතත්, ඉහත ප්‍රතිපාදනයට අනුව වසර ආරම්භයේ රඳවා ගත් අලාභයට ගැලපීම වෙනුවට වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන සමාලෝචිත වර්ෂය තුළ එය නිවැරදි කර තිබුණි. | එය පූර්ව වර්ෂයේ ගැලපීමක් ලෙස 2022 වර්ෂයේදී ගලපනු ඇත. | වැරදි සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| vii. | ස්ථාවර වත්කම් අටක (08) වර්ගීකරණයන් පහක් (05) වෙනස් කිරීම හේතුවෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර | මණ්ඩලය විසින් අදාළ පසුගිය වර්ෂයන් සඳහා ගැලපිය යුතු මුළු වටිනාකම් දැනටමත් තක්සේරු කර ඇති රු.මිලියන 4.8ක් වටිනා වත්කම් ගලපා | වැරදි සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) සමඟ |

| | | | |
|---|---|---|---|
| | 08) 42 වැනි වගන්තිය ප්‍රකාරව හඳුනාගැනීම වෙනුවට ක්ෂයවීම් සඳහා රු.293,125 ක අතිරේක ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබුණි. තවද, වර්ෂය තුළ ජංගම නොවන වත්කම්වලට එකතු කරන ලද එකතු කිරීම් ඉක්මවන රු.මිලියන 1,252.33 ට සමාන මුදලක් ඉහත ප්‍රමිතියේ 42 වැනි වගන්තිය ප්‍රකාරව හඳුනා ගැනීමකින් තොරව දේපල පිරියත සහ උපකරණවල පිරිවැයෙන් මාරු කර තිබුණි. ඊට අමතරව විගණනය මගින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව ස්ථාවර වත්කම් අටක (08) වර්ගීකරණයන් පහක් (05) වෙනස් කිරීම සඳහා ප්‍රත්‍යාවර්තී ගැලපීම් ලෙස වර්ෂය ආරම්භයේ අලාභයට රු.845,272 ක ඌන ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබුණි. එබැවින් වසර ආරම්භයේ රඳවාගත් අලාභය සහ ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ඊට සමාන ප්‍රමාණයකින් අවතක්සේරු වී තිබුණි. | ඇති අතර ඉතිරි ප්‍රමාණය 2022 මූල්‍ය ප්‍රකාශනයන්හි පෙර වසරවලට ඇතුලත් කරනු ඇත. | අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| viii. | දේපල,පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 16) 51 වන වගන්තිය ප්‍රකාරව, වත්කම් වල ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් ඒ ඒ ගිණුම් වර්ෂය අවසානයේදී සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තු සමග වෙනස් වේ නම් එම වෙනස ශ්‍රී.ලං. ගි.ප්‍ර 08 ට අනුව ගිණුම්ගත කල යුතුය. කෙසේවෙතත්, තවමත් භාවිතයේ පවතින ස්ථාවර වත්කම් කාණ්ඩ 17 කට අයත් වටිනාකම රු. 2,604,392,336 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම් ගත කර නොතිබුණි. ඊට අමතරව වසර 20කට වැඩි කාලයක් පවතින රු. 396,328,070 ක් වූ ප්‍රධාන අමතර කොටස් ද ඒවායේ අපේක්ෂිත ඵලදියී ජීවිත කාලය සමාලෝචනය නොකර සියයට 5ක අනුපාතයක් යොදා ගනිමින් ක්ෂය කර තිබුණි. | අතිවිශාල වත්කම් පදනමක් රට පුරා විසිරී ඇති බැවින් මණ්ඩලයේ වත්කම් පදනම අගය කිරීම ප්‍රායෝගික නොවේ . | මණ්ඩලය විසින් දැනටමත් භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| ix. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 15 කට වඩා වැඩි කාලයක් තුළ ක්‍රමක්ෂය කිරීමෙන් තොරව පැවති ව්‍යාපෘති 29 කට අදාළව එකතුව රු.මිලියන 10,445.59 ක් වූ විදේශ | ශ්‍රී.ලං.ගි.ප්‍ර 20 හි 14 ඡේදයට අනුකූලව, අදාළ ප්‍රදාන අරමුදල් සහිත වත්කම් කාලසීමාව පුරා ක්‍රමක්ෂ කර ඇත. | විදේශ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදාන ශේෂයන්ද, වසර 12 කට වඩා වැඩි කාලයක් තුළ ක්‍රමක්ෂය කිරීමෙන් තොරව පැවති ව්‍යාපෘති 05 කට අදාළව එකතුව රු.මිලියන3,258.98 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන්ද 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එම විදේශීය ප්‍රදානවලට අදාළ තොරතුරු කිසිවක් නොමැති හෙයින් මූල්‍ය ප්‍රකාශන සඳහා ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි විය. තවද, ප්‍රමිතයේ 12 වන ඡේදයට පටහැනිව එක් එක් විදේශ ප්‍රදානයට අදාළ නිශ්චිත ව්‍යාපෘතිය වෙන වෙනම හඳුනා නොගෙන ස්ථාවර වත්කම් අයිතම කාණ්ඩ 13 කට අදාල ක්ෂය වීම් ලෙස රු. 110,142,908 ක් ක්‍රමක්ෂය ලෙස වෙනම විදේශ ප්‍රදාන ගිණුමකට හර කොට තිබුණි. එබැවින් විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකමෙහි රු.110,142,908 ක අසාමාන්‍ය හර ශේෂයක් නිරීක්ෂණය විය. | | |
| x. | හම්බන්තොට කළමනාකරණ කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ සිදුකල භාණ්ඩ සමීක්ෂණය තුලදී හඳුනාගත් රුහුණුපුර ජල සම්පාදන ක්‍රමයේ කොන්ත්‍රාත්කරුගෙන් ලද රු.27,669,420 ක් වටිනා තොග අයිතමයන්ද අක්කරෙපත්තු කළමනාකරණ කාර්යාලයට ප්‍රදාන ලෙස ලද රු. 52,739,979 ක් වටිනා තොග අයිතමයන්ද රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) 03 වන වගන්තිය ප්‍රකාරව මූලාශ්‍රය විධිමත්ව හඳුනා ගැනීමකින් තොරව විදේශ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනා ගෙන තිබුණි. | එබැවින් රු.27,669,420.00 ක තොගයේ වටිනාකම ප්‍රදාන ගිණුමට එරෙහිව ගිණුම් ගත කොට ඇත. | විදේශ ප්‍රදානයන්හි ප්‍රභවය හඳුනා ගැනීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| xi. | ආයෝජන දේපල පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) විධිවිධාන වලට පටහැනිව, ධාරණ අගය රු. 328,259,619 ක් වූ ආයෝජන දේපළ 2021 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපළ ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි. තවද, ප්‍රමිතියේ 75 (ඊ) (i) සහ 79 වගන්තිවලට අනුව, ආයෝජන දේපල වලින් ලැබෙන ආදායම හෙළිදරව් කර නොතිබූ අතර ක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය වීමේ අනුපාතය, දළ ධාරණ වටිනාකම | ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 හි 14 වන ඡේදය අනුව ජල සම්පාදන අමාත්‍යාංශය දැනට පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ආයෝජන දේපළ ලෙස හඳුනාගැනීම විනිශ්චය මත පදනම් වේ. එබැවින් ඉහත ප්‍රමිතයේ 75 (ඇ) ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනයේ එවැනි ගැලපීම් අවශ්‍ය නොවේ. | ආයෝජන දේපළ හඳුනාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සහ කාල පරිච්ඡේදය ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරව්කිරීම් සිදු කර නොතිබුණි. | | |
| xii. | මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතියේ (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09) 5.5 වගන්තියට පටහැනිව, අපේක්ෂිත ණය අලාභය හඳුනා නොගෙන ස්ථාවර අනුපාතයක් මත මලාපවහන ණය ගැතියන් සහ අනෙකුත් ණයගැතියන් සඳහා රු.30,617,873 ක අපහායන වෙන්කිරීම් සිදු කර තිබුණි. | ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 9 හි මෙම අපේක්ෂිත ණය අලාභ ක්‍රමවේදය ශේෂයන්ට සැලකිය යුතු වෙනසක් සිදු නොකරයි. | ණයගැති අපහායනය සඳහා වෙන්කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09) සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| xiii. | අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) 12 වැනි වගන්තියට පටහැනිව, මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අදාලව පසුගිය වර්ෂවලදී ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්, වෙනත් උපකරණ, පිරියත සහ උපකරණ ආදිය ලෙස හඳුනාගෙන තිබූ රු. 9,593,438 ක් හඳුනාගත හැකි අස්පෘශ්‍ය වත්කම්හි නිර්ණායකයන් නිසි පරිදි සැපිරීමකින් තොරව අස්පෘශ්‍ය වත්කම් ලෙස වර්ෂය තුළදී හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) නියම කර ඇති පරිදි ඉහත අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය වෙනස් කිරීමේ බලපෑම පිළිබිඹු කිරීම සඳහා පිරිවැය, සමුච්චිත ක්ෂයවීම් සහ වර්ෂය ආරම්භයේදී රඳවා ගත් අලාභයන්ට අදාලව නිසි ගැලපීම් සිදු කිරීමකින් තොරව එය සමාලෝචිත වර්ෂයේ අස්පෘශ්‍ය වත්කම්වලට එකතු කිරීම් ලෙස දක්වා තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ පිරිවැය අංශය මගින් අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලැබේ. | අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) හි විධිවිධාන සමඟ අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට තක්සේරු කළ යුතු වේ. කෙසේ වෙතත්, තොග | තොග කළමනාකරණ පද්ධතිය මුළුමනින්ම සම්පූර්ණ වන තුරු පද්ධතිය හරහා පැන නගින ඉහළ මිල විචලනය, | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල විය යුත වීම. |

| | | | |
|---|---|---|---|
| | ලැබීම් සහ නිකුත් කිරීම් අතර අසාමාන්‍ය මිල අපගමනයන් හේතුවෙන් කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ලබාගත් තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුකූල වී නොමැති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් තොග ශේෂයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | තොග ගැලපුම් ගිණුම හරහා නිවැරදි කරනු ඇත. | |
| ii. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, තොග ශේෂ වටිනාකමින් යල් පැන ගිය සහ සෙමින් චලනය වන තොග සඳහා වෙන් කිරීම් සිදු කල යුතු වේ. කෙසේ වෙතත්, ගිණුම් පොත්වලට අනුව සෙමින් චලනය වන තොග සඳහා කිසිදු වෙන් කිරීමක් සිදු කිරීමකින් තොරව යල් පැන ගිය සහ භාවිතයට ගත නොහැකි තොග සඳහා රු. 236,958,510 ක් පමණක් වෙන් කර තිබුණි. | තොග ප්‍රතිපාදන සඳහා සලකනු ලබන්නේ යල්පැන ගිය සහ සේවා කළ නොහැකි අයිතම පමණි. | -එම- |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂය සඳහා සත්‍ය ආදායම් බදු වියදම හඳුනාගැනීමට විස්තරාත්මක අදායම් බදු ගණනය කිරීමක් සිදු කිරීමකින් තොරව 2019 වර්ෂය තුළ ගෙවන ලද රු.138,860,749 ක ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. | 2021.12.31 වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනයන්හි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා), වියදම් ලෙස පැහැදිලිව දක්වා ඇත. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම්වල නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |
| ii. | 2016 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 0.5 දක්වා අනුපාත සංශෝධනය කර තිබුණද 2016/2017 තක්සේරු වර්ෂය සඳහා වූ ආර්ථික සේවා ගාස්තුව සියයට 0.25 ක් පදනම් කරගෙන ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය දෙපාර්තමේන්තුව විසින් දඩ මුදලක්ද ඇතුළුව රු. මිලියන 128.76 ක තක්සේරු දැන්වීමක් ඉදිරිපත් කර තිබුණි. මණ්ඩලයේ වාර්තා වලට අනුව අනුපාත වෙනස්වීම් හේතුවෙන් රු. මිලියන 66.37 ක මුදලක්(දඩ මුදල් රහිතව) මණ්ඩලය විසින් ගෙවිය යුතු ව ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවිය යුතු ඉතිරි බදු සඳහා ගිණුම් පොත්වල කිසිදු ප්‍රතිපාදනක් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කෙරෙමින් පවතී. | ආ.සේ.ගා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කිරීමට හා ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iii. | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 16 කට අදාළ එකතු වටිනාකම රු.65,852,393 ක් වූ ස්ථාවර වත්කම් භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින අතර දිගු කාලයක් තිස්සේ ස්ථාවර වත්කම් ලෙස පවතින බව 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒවා ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.තවද, විගණනය විසින් සිදු කල ගණනය කිරීම් අනුව, වටිනාකම රු.40,605,148 ක් වන ක්ෂය කල හැකි අයිතම 42 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මෙන්ම ඉකුත් වර්ෂයේදී ද රු.851,398 ක ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබූ බව විගණනයට අනාවරණය විය. | අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම වත්කම් වල වටිනාකම් අපගේ ගිණුම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන්නෙමු. | භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කොට ඒවා ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට පියවර ගත යුතු වීම. |
| iv. | රු. 4,900,000 ක් වටිනා සොයිසාපුර සහ කොළොන්නාව මලාපවහන අංශයන්ට අයත් අංක 252-7905,252-8054 සහ PA-2052 දරන වාහන තුනක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොතිබුණි. තවද, විගණනය විසින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව එම වාහන සඳහා වාර්ෂිකව රු.445,000 ක ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වෙන්කල යුතුව තිබුණි. | මේවා 2022.06.30 දිනට ගිණුම්වලට ගෙන ඇත. | ගිණුම් පොත්වල සටහන් කර ඇති ස්ථාවර වත්කම් වල නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය සහ පැවැත්ම තහවුරු කල යුතු වීම. |
| v. | මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනවල හෝ ගිණුම් පොත්වල සටහන් කර නොතිබූ ස්ථාවර වත්කම් අයිතම හතරක් සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කර තිබුණි. කෙසේ වෙතත්, මිලදී ගත් දිනය සැලකිල්ලට ගැනීමෙන් පසු ක්ෂයවීම් වෙනුවෙන් නිසි පරිදි පූර්ව වර්ෂය සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකර, ඉවත් කිරීමෙන් ලද විකුණුම් ආදායම රු. 1,178,000 ක් වර්ෂය සඳහා ලාභය ලෙස හඳුනාගෙන තිබුණි. | 46-5186ට්‍රේලරයේ පිරිවැය අංක 49-0557 දරන ට්‍රැක්ටරයට එකතු වී ඇත. ඉතිරි වාහන තුන පොදු ලෙජරයෙහි සටහන් කර නොතිබූ අතර ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සිදුකර නොතිබුණි. ඒ අනුව, විකුණුම් ආදායම වත්කම් ඉවත් කිරීමෙන් ලැබෙන ලාභය ලෙස ආදායම් ප්‍රකාශයට අය කර ගෙන ඇත. | ඉවත් කිරීමේ ලාභය ගණනය කිරීමේ නිරවද්‍යතාවය සහතික කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| vi. | භෞතික සමීක්ෂණ වාර්තා සහ ස්ථාවර වත්කම් ලේඛනයන් අනුව අම්පාර, යාපනය, මඩකලපුව සහ උතුරු මැද ප්‍රාදේශීකයන්හි පිරිවැය මධ්‍යස්ථාන පහකට (05) අදාලව එකතු වටිනාකම රු.24,797,847 ක ස්ථාවර වත්කම් සත්‍යාපනය කර ගත නොහැකි වූ අතර භෞතිකව නොතිබුණි. කෙසේ වෙතත්,ඒවා පොත් වලින් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂය තුලදී ක්ෂය වීම් සඳහා රු.605,749 ක ප්‍රතිපාදන සිදු කර තිබුණි. | භෞතික සමීක්ෂණ වාර්තා අනුව මෙම ස්ථාවර වත්කම් සත්‍යාපනය කරනු ලබන අතර භෞතිකව පවතී. ක්ෂය වීම් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුලදී සිදු කර ඇති අතර කිසිවක් අත හැරී නැත. | ගිණුම් පොත්වල සටහන් කර ඇති ස්ථාවර වත්කම් වල නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය සහ පැවැත්ම තහවුරු කල යුතු වීම. |
| vii. | මධ්‍යම උතුර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය,වව්නියාව,යාපනය,නැගෙනහිර, අම්පාර,අක්කරෙපත්තු සහ මඩකලපුව ප්‍රාදේශිකයන්හි භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව පිරිවැය මධ්‍යස්ථාන විසි දෙකකට අදාල එකතු වටිනාකම රු.52,399,850 ක් වන සින්නක්කර ගොඩනැගිලි, ආකෘතීන්, යටිතල පහසුකම්, පරිගණක සහ අනෙකුත් උපකරණ,මිනුම් උපකරණ, ජංගම උපකරණ ආදිය හානියට පත්ව, භාවිතයෙන් ඉවත් කර හා කඩා දමා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඒවා පොත් වලින් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂය වීම් සඳහා රු.1,637,717 ක ප්‍රතිපාදන සිදු කර තිබුණි. | ඉවත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා මහා භාණ්ඩාගාර එකගතාවය මගින් අධිකාරිය දෙනු ලබයි.මෙය සාමාන්‍යෙන් සැලකිය යුතු කාලයක් ගනු ලබයි. | -එම- |
| viii. | මධ්‍යම උතුරු ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය, මාතලේ, කටුගස්තොට, වවුනියාව සහ යාපනය යන ප්‍රාදේශිකයන්හි ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී පැහැදිලිව හඳුනාගෙන නොතිබූ රු.946,780,882ක ස්ථාවර වත්කම් අයිතම හැට හයක් (66) ස්ථාවර වත්කම් ලේඛනයන්ට හා ගිණුම් පොත් වලට ඇතුළත් කර තිබූ අතර ඒවා සඳහා ක්ෂය ප්‍රතිපාදන ලෙස රු.39,211,284 ක් වෙන් කර තිබුණි. | මෙය මීලග ස්ථාවර වත්කම් සත්‍යාපනයේදී නිවැරදි කරනු ඇත. | -එම- |
| ix. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට නව සම්බන්ධතා ණයගැතියන් ද ඇතුළුව වෙළෙඳ ණයගැති ශේෂය රු. 7,733,111,838 ක් විය. කෙසේ වෙතත්, වටිනාකම රු.7,662,021,591 ක් වන ණයගැතියන් සඳහා පමණක් අපාහනය වෙන්කිරීම් කර තිබුණි. එබැවින් එකතු වටිනාකම රු.71,090,247ක් වන ණයගැතියන් සඳහා ප්‍රතිපාදනය සිදු කර නොතිබුණි. ඊට | අපාහන ගණනය කිරීම් වාණිජ අංශයෙන් ලබා දෙන ලද සත්‍ය වටිනාකම් මත පදනම් විය. | ණයගැති අපාහනය වෙන්කිරීම්හි නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අමතරව මූල්‍ය ප්‍රකාශනවල වූ ක්‍රියාකාරී නොවන වත්කම්වල ඇතුළත් සහ වසර 5 කට වැඩි කාලයක් ගිණුම් පොත්වල තිබූ රු. 3,743,920 ක අනෙකුත් ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | | |
| x. | 2021 අප්‍රේල් මස රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් කපා හැරීමට අනුමත කර තිබූ රු. 1,243,209 ක වෙළඳ ණය ගැතියන් සමාලෝචිත වර්ෂයේ ලාභයට අය කිරීම වෙනුවට වර්ෂය ආරම්භයේ රඳවා ගත් අලාභයන්ට පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස ගලපා තිබුණි. එබැවින් වර්ෂය සඳහා ලාභය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි. | පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස 685 ලෙජර ගිණුමට හර කිරීම සඳහා ජ'නල වවුචරය පිළියෙල කරමින් පවතී. | බොල් ණය කපා හැරීම් ලෙස ලාභයට අය කරනු ලබන වටිනාකමෙහි නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |
| xi. | ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු වශයෙන් මණ්ඩලය ගෙවූ රු.12,697,619 ක් ඒවා මණ්ඩලයේ නිමැවුම් මත වන එකතු කළ අගය මත බදු වලට එරෙහිව දැනටමත් හිමිකම් ලබා තිබූයෙන් ඒවා ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස ගිණුම් ගත නොකර වැරදි ලෙස කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් ඒ සමාන අගයකින් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ශේෂය වැඩියෙන් දක්වා තිබූ අතර ලැබිය යුතු එකතු කළ අගය මත බදු අඩුවෙන් දක්වා තිබුණි. | එය නිවැරදි කරනු ඇත. | සැපයුම්කරුවන්ට ගෙවන ලද වැට් නිවැරදිව ගිණුම්ගත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| xii. | ලැබී ඇති තොරතුරු වලට අනුව, රු.මිලියන 70,625.98 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති එකසිය දහ හතරක (114) පිරිවැය ප්‍රාග්ධනිත ගත නොකර 2021 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ තුළ පැවතුණි. | ඒවා වත්කම්වලට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත. | සම්පූර්ණ කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| xiii. | නැවත අයකර ගැනීමේ වැඩ සඳහා ලද අත්තිකාරම් අතරින් අක්කරෙපත්තු සහ අම්පාර ප්‍රාදේශිකයට, බටහිර මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට, බටහිර දකුණ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අයත් ව්‍යාපෘති 44 කට අදාල රු.171,985,691 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිම කර තිබුණි. කෙසේවෙතත්, 2022 අප්‍රේල් 30 වන විටත් ඒවා ප්‍රාග්ධනිතගත කිරීමට හෝ පවතින ශේෂය අදාල ආදායම් ගිණුමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඒවා 2022 වර්ෂයේදී අවසන් කරනු ඇත. | ව්‍යාපෘති අවසන් වූ පසු නැවත අය කර ගැනීමේ වැඩ සඳහා ලැබුණු අත්තිකාරම් අදාළ ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| xiv. | 2018, 2019 සහ 2020 වර්ෂවලට අදාළව 2020 සහ 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය විසින් පෙර වර්ෂයේ ගැලපුම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසර අවසානයට වූ සමුච්චිත අලාභය රු. මිලියන 123.22 කින් විකෘති වී තිබුණි. එබැවින්, ඉදිරි වර්ෂය තුළදී සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කර නොහැකි විය. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 ට අනුව පූර්ව වර්ෂයට අදාළ දෝෂ නිවැරදි කිරීම නියාමන අවශ්‍යතාවයකි. එබැවින් මණ්ඩලය එම අවශ්‍යතාවයට අනුකූල වී ඇත. | භාවිතයක් ලෙස සිදු කරන පෙර වර්ෂයේ ගැලපීම් මගින් ලාභ විකෘති වීම වළක්වා ගැනීමට පියවර ගත යුතු වීම. |
| xv. | ව්‍යාපෘති හතක් (07) සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ මුළු ශේෂ වටිනාකම රු.198,729,791 ක් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සඳහා විමර්ශනය නොකර වසර දොළහකට වඩා වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. | විවිධ අදියරයන්හීදී නිම කිරීම සඳහා තක්සේරුව සහ අනුමැතිය ලබා ගත යුතු වේ. මෙම ව්‍යාපෘති තවමත් ඉහත ක්‍රියාවලිය තුළ පවතී. | සම්පූර්ණ කර ජනතා අයිතියට පත්කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතු වීම. |
| xvi. | සුභසාධන අරමුදලේ රු. 12,506,980 ක් මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් මූලික ගාස්තු අයකර ගැනීමේ ආදායම් ප්‍රභවයට එරෙහිව කිසිදු හේතුවක් නොමැතිව ගලපා ඇති බව නිරීක්ෂණය වූ අතර එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, 2020 වර්ෂය සඳහා ආයතනික සමාජ වගකීම් අරමුදලට ලද රු. 1,199,700 ක් ද ඒ තුල ඇතුලත් බව නිරීක්ෂණය විය. | මෙය, මෙම ගනුදෙනුව හෙළිදරව් කිරීම සඳහා කාලාන්තරයක් තිස්සේ නොකඩවා සිදු කරන ගිණුම්කරණ ගැලපීමකි. | සිදු කරන ලද ගිණුම්කරණ ගැලපීම් වල සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ නිවැරදි භාවය තහවුරු කර ගත යුතු වීම. |
| xvii. | විසල් කුරුණෑගල මලාපවහන පද්ධතිය නඩත්තු කිරීම සඳහා 2021 මාර්තු මාසයේදී කුරුණෑගල නගර සභාව සහ මණ්ඩලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමට අනුව නගර සභාවෙන් රු. මිලියන 2.5ක මාසික ආදායමක් ලැබිය යුතු වේ. කෙසේ වෙතත්, 2021 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාස පහක් සඳහා වන රු. මිලියන 12.5 ක ආදායම ගිණුම් පොත්වල හඳුනාගෙන නොතිබුණි. | මලාපවහන ගාස්තු අය කිරීම සඳහා ණය ගැති ලේඛනය පවත්වාගෙන යාමට සහ මාසිකව පසු විපරම් කිරීමට උපදෙස් ලබා දී ඇත. | හඳුනාගනු ලැබූ මලාපවහන ආදායමේ නිරවද්‍යතාවය සහතික කල යුතු වීම. |
| xviii. | වෙනත් ණයගැතියෝ, අත්තිකාරම්, වෙළඳ ණයහිමියෝ, ඉල්ලුම් නොකළ වේතන යනාදිය ඇතුලත් දීර්ඝ කාලීනව පැවත එන පිළිවෙලින් රු.149,748,448 ක හා රු.71,927,749 ක වත්කම් හා වගකීම් ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ක්‍රියාකාරී නොවන වත්කම් හා ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන | හස්තපොත් පද්ධතිය පරිගණකගත කරමින් තිබීම හේතුවෙන් මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට පැවතෙමින් පවතී. | ක්‍රියාකාරී නොවන වත්කම් හා වගකීම් ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. තවද, රු.95,796,513 ක හඳුනා නොගත් පූර්ව වර්ෂ ශේෂයක්ද, රු.22,007,307 ක ප්‍රාදේශික හතරක තොග ශේෂය සහ රු.5,906,882 ක බැංකු ශේෂයක් ද විමර්ශනය කොට නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ඉහත සඳහන් ශේෂය තුල ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස පැවතුනි. | | |
| xix. | මීට වසර හයකට පෙර කැලණිය ප්‍රාදේශිකයේ රු.2,549,788 ක සොරකම් කරන ලද තොග ශේෂය සහ බටහිර මධ්‍යම සහය සේවා මධ්‍යස්ථානයේ (කොහුවල) රු. 1,211,323 ක හා කිලිනොච්චි ඉංජිනේරු කාර්යාලයේ රු.1,633,256 ක තොග ඌනතාවය 2021 දෙසැම්බර් 31 දිනටද තොගයට ඇතුළත් කර තිබුණි. කෙසේවෙතත්, එම අලාභයන් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කෙරීගෙන යන පරීක්ෂණයක් හේතුවෙන් මෙම තොග ශේෂයන් පැවතුනි. පරීක්ෂණය අවසන් වූ පසු ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරේ.<br>කොහුවල තොග ඌනතාවය රු.218,857.64 ක් වටිනා තොග, පොත් තැබීමේ වැරදි ලෙස හඳුනා ගෙන ඇත. රු. 270,572.40 ක් වටිනා තොග සඳහා පොලිස් පරීක්ෂණ ක්‍රියාත්මක වන අතර නඩු තීන්දුව බලාපොරොත්තුවෙන් සිටී. රු. 721,893.47 ක ශේෂය වැඩිදුර විමර්ශන යටතේ පවතී. | ගිණුම් පොත්වලින් එම තොග ශේෂයන් ඉවත් කිරීමට සහ වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභය පියවා ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| xx. | 2020 ජූලි 02 දින ගත් කැබිනට් මණ්ඩල තීරණය ප්‍රකාරව, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් රු.බිලියන 30 ණය මුදල සඳහා පොලී පිරිවැය මහා භාණ්ඩාගාරය විසින් දරා ගනු ලබන අතර පසුගිය වර්ෂය තුලදී එම ණය සඳහා පොලිය වශයෙන් රු.699,702,314ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලද රු.659,277,279 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් වශයෙන් හඳුනාගෙන තිබූ අතර 2022 මාර්තු අවසානය වන විටත් එය භාණ්ඩාගාරයෙන් අය කර ගෙන නොතිබුණි. | කැබිනට් තීරණයට අනුව එම පිරිවැය භාණ්ඩාගාරය විසින් දරනු ලැබේ. තවද, මණ්ඩලය විසින් ගෙවන ලද පොලී ගිණුම්ගත කර ඇත. | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් හඳුනාගැනීමේ දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. |
| xxi. | දැනට ක්‍රියාත්මක විදේශ අරමුදල් ව්‍යාපෘති හයකට අදාලව පූර්ව වර්ෂය සඳහා පොලී වියදම ලෙස (මණ්ඩලයේ සහ භාණ්ඩාගාරයේ කොටස ඇතුළුව) හඳුනාගත යුතුව තිබූ රු. 821,996,056 ක් වැරදි ලෙස සමාලෝචිත වර්ෂය සඳහා පොළිය ලෙස හඳුනාගෙන | අදාළ ව්‍යාපෘතිවලට අදාළ සත්‍ය පොලී වියදම් මූල්‍යායතනයේ පොලී ගෙවීමේ දැනුම්දීම ලද පසු හඳුනාගෙන ඇති අතර 2021 වර්ෂයට අදාළ | මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන ඇති පොලී වියදමේ නිරවද්‍යතාවය සහතික කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එබැවින් වර්ෂය ආරම්භයේ කෙරීගෙන යන වැඩ වටිනාකම ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | ඇස්තමේන්තුගත පොලී වියදම් උපචිත පොලී වියදම් ලෙස අය කර ඇත්තෙමු. | |
| xxii. | දේශීය හා විදේශ මූල්‍යාන ව්‍යාපෘති දහහතක (17) උපචිත ණය පොළියට අදාලව බැංකුවලින් ලද තහවුරු කිරීම් සැසඳීමේදී, රු. 318,850,651 ක ඌන ප්‍රතිපාදනයක් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ වර්ෂය අවසානයට උපචිත පොළිය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | බැංකුව විසින් 2021.12.30 දිනට පොලී මුදල දන්වා ඇති අතර මෙම මුදල මුදල් වර්ෂය අවසානයේ උපචිත කොට ඇත. නමුත් බැංකු තහවුරු කිරීම සඳහා සත්‍ය පොලී 2021.12.31 දින සඳහා ලබා දී ඇත. | ණය සඳහා උපචිත පොලිය නිවැරදිව ගණනය කිරීම සහතික කල යුතු වීම. |
| xxiii. | බියගම සහ සීතාවක කළමනකරණ කාර්යාලවලට අදාළව, සැප්තැම්බර් මාසය සඳහා රු. 5,013,530 ක මලාපවහන ආදායම සහ අගෝස්තු මාසය සඳහා රු. 8,040,601 ක මලාපවහන ආදායම දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය අඩුවෙන් දක්වා වර්ෂය අවසානයට මලාපවහන ණයගැතියන් රු.13,054,131 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සීතාවක සම්බන්ධව, එම වැඩියෙන් දක්වා ඇති ජනලය නිවැරදි කිරීම සඳහා පූර්ව වර්ෂ ගැලපීම් කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල මලාපවහන ආදායම හඳුනාගැනීමේ නිරවද්‍යතාවය සහතික කල යුතු වීම. |
| xxiv. | විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන මත ලැබිය යුතු පොලී ශේෂය රු. 1,500,542 කින් වැඩියෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වර්ෂය ආරම්භයේදී රඳවා ගත් අලාභය සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය පිළිවෙලින් රු.1,476,322 කින් සහ රු. 24,220 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එය 2022 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති පොලී ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කල යුතු වීම. |
| xxv. | අංක 85304025 දරන ස්ථාවර තැන්පතුව සම්බන්ධයෙන් 2020 (28/12/2020 සිට 31/12/2020 දක්වා) වර්ෂයට අදාල රු.302,055 ක පොළිය, ලැබිය යුතු පොළියේ ආරම්භක ශේෂයෙන් අයකර ගැනීම වෙනුවට වර්ෂයේ පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද, අංක 85304053 දරන ස්ථාවර තැන්පතුවට ආරම්භක ලැබිය යුතු පොලියෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 86,302 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි. | අංක 85304053 දරන ස්ථාවර තැන්පතුවට අදාළ වන රු. 86,301.37ක ඉතිරි ලැබිය යුතු පොලිය ආපසු අය කර ගෙන ඇති අතර 2022 වර්ෂයේදී වරද නිවැරදි කර ඇත. 85304053 වන ස්ථාවර තැන්පතුවට අදාල සත්‍ය පොලී ආදායම රු.302,054.79 ක ලැබිය යුතු පොලිය 2021 දෙසැම්බර් 29 දින යලි නිවැරදි කිරීමෙන් පසු නිවැරදිව වාර්තා කර ඇත. | පොළී ආදායම අදාළ කාලසීමාවට නිවැරදිව සටහන් කර ඇති බවටත්, ලැබිය යුතු පොලී ශේෂයේ ආරම්භක ශේෂය වර්ෂය තුළදී අයකර ගන්නා බවටත් සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| xxvi. | අංක 83641912 දරන ස්ථාවර තැන්පතුවට අදාලව 2021 සැප්තැම්බර් 30 සිට 2021 දෙසැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් රු. 4,986,301 ක පොලියක් සමාලෝචිත වර්ෂය තුළ පොලී ආදායම ලෙස හඳුනාගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | එය 2022 ජනවාරි 31 වන දින සටහන් කර ඇත. | වර්ෂය තුළ හඳුනාගත් පොලී ආදායමේ නිරවද්‍යතාවය සහතික කල යුතු වීම. |
| xxvii. | මහ කොළඹ ජල සහ අපජල වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනට අදාළව දරන ලද රු. 2,816,590 (රු. 80,198 විශේෂ අත්තිකාරම් ඇතුළුව) පොදු වියදම් මණ්ඩලයේ කෙරීගෙන යන වැඩ තුල සහ මුදල් අග්‍රිම ගිණුමේ (00/2/59/ 289/1) දෙවරක් ගිණුම් ගත කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් අග්‍රිම ගිණුමේ රු.2,816,590 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරීක්ෂණය විය. ඒ හා සමානව, වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ශේෂය සමාන මුදලකින් (රු. 80,198 විශේෂ අත්තිකාරම් ද ඇතුළුව) වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීම් ජනලයන් දැනටමත් අදාළ ලෙජර් ගිණුම් වලට ගෙන ඇත. | සිදු කරන ලද වියදම් පොදු ලෙජරයේ නිවැරදිව ගිණුම් ගත කොට ඇති බවට සහතික විය යුතු වීම. |
| xxviii. | ප්‍රාදේශීය හතළිහක රු.131,828,414 ක් වූ වෙන්දේසි කල යුතු තොග අයිතමයන් අපහරණය කිරීමට පියවර නොගෙන, එය මූල්‍ය ප්‍රකාශනවල තොග ලෙස ද හඳුනාගෙන තිබුණි. | මේවා දැනටමත් වෙන්දේසිය සඳහා යවන වෙන්දේසි හැකි අයිතම නියෝජනය කරන අතර තොග සත්‍යාපන කාල සීමාව තුළ ගබඩා පරිශ්‍රයේ නොපැවතුණි. | වෙන්දේසි කළ හැකි තොග අයිතම අපහරණය කිරීමට සහ තොගයෙන් ඉවත් කිරීමට පියවර ගත යුතු වීම. |
| xxix. | 2000 වර්ෂයට පෙර මිලදී ගෙන බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන ගබඩාවේ තිබූ රු. 2,000,000 ක පිරිවැයකින් යුතු නල කපන යන්ත්‍රයක් ප්‍රාග්ධනිත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තොග අයිතමයක් ලෙස හඳුනාගෙන තිබුණි. | එය නිකුත් කරන විට එය ප්‍රාග්ධනිත කරනු ලැබේ. | හඳුනාගැනීමේ නිර්ණායක සපුරා ඇති මිලදී ගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන කළ යුතු වීම. |
| xxx. | කළුතර ප්‍රාදේශිකයේ වර්ෂය තුළ අපහරණය කරන ලද රු. 3,197,000 ක් වටිනා ජල බවුසරයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ක්ෂයවීම් වශයෙන් රු. 159,850 ක ප්‍රතිපාදනයක් පොත්වල සිදුකර තිබුණි | සඳහන් කර ඇති අයිතම තක්සේරු කිරීම සඳහා කණ්ඩායමක් පත් කර ඇති අතර 2022 වර්ෂයේදී ගිණුම් වලට ගනු ඇත. | ගිණුම් පොත්වල සටහන් කර ඇති ස්ථාවර වත්කම් වල නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය සහ පැවැත්ම තහවුරු කල යුතු වීම. |
| xxxi. | බස්නාහිර දකුණ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය යටතේ වන වස්කඩුව ගබඩාවට | ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම් පොත්වල ඇති තොග ශේෂයේ නිරවද්‍යතාවය සහ |

| | | | |
|---|---|---|---|
| | 2018 නොවැම්බර් මාසය තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද තොග අයිතමයන්හි වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම් පොත්වල සටහන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. කෙසේ වෙතත් තොරතුරු නොමැති වීම හේතුවෙන් එම මගහැරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇති වූ බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | | සම්පූර්ණත්වය සහතික කල යුතු වීම. |
| xxxii. | සමාලෝචිත වර්ෂය අවසානයට තොග ගැලපුම් ගිණුමේ වූ රු.155,974,054 ක ශේෂය නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනයන්හි තොග ලෙස සලකා තිබුණි.කෙසේ වෙතත්, නියැඳි විගණන පරීක්ෂාවට අනුව මාතලේ, කොහුවල, යාපනය කිලිනොච්චි ගබඩාවන්හි, බණ්ඩාරගම වැඩභාර නිලධාරී කාර්යාලයේ සහ වාරියපොළ භූගත ජල අංශයේ රු.2,086,329ක හඳුනාගත් තොග ඌනතාවයක් විධිමත් විමර්ශනයකින් පසු ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට පියවර නොගෙන ඊට ඇතුළත් කර තිබූ බව නිරීක්ෂණය විය.තවද, මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට අදාළ රු. 81,407,868 ක තොග ගැලපුම් ශේෂයෙන් රු. 41,739,680 ක විචලනය පෙර වර්ෂවල තොග ගනුදෙනු වාර්තා නොකිරීම හේතුවෙන් වූ බවට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නිරවුල් කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකොට එය මූල්‍ය ප්‍රකාශනවල තොග ලෙස හඳුනාගෙන තිබුණි. | 2021 තොග සත්‍යාපනයේදී හඳුනාගත් ඉහළ මිල විචලනය, සත්‍ය විචලනය සැසඳුම් කරන තෙක් තොග ගැලපුම් ගිණුමට මාරු කර ඇති අතර පසුව ජනල ප්‍රෙවේශයන් සැසඳුම් කොට නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. ගබඩා කිහිපයක තොග ඌනතාවයක් හඳුනාගෙන ඇති අතර ඒවා විමර්ශන ක්‍රියා පටිපාටිය අවසන් වන තුරු ගිණුම් පොත්වල සටහන් කර ඇත. රු. 81,407,868 ක තොග ඌනතාවය නිවැරදි කිරීමට කමිටුවක් පත් කර තිබේ. කොහුවල සත්‍යාපිත තොග ශේෂවල පිටපතක් පරීක්ෂණයක් පැවැත්වීමට අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වෙත යවන ලදී. සිදු කරමින් පවතින විමර්ශනයක් හේතුවෙන් කැලණියේ තොග ශේෂයන් ඉතිරිව පවතී. | වෙනස්කම් ඇතිවීමට හේතු හඳුනාගෙන එය සැසඳුම් කර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| xxxiii. | "සැමට ජලය" ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද තොග සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 23,805,258 ක මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් දරා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ ඒ සඳහා ගිණුම් පොත්වල වෙන් කිරීම් සිදු කොට නොතිබුණි. | අසම්භාව්‍ය සිදුවීම් පිළිබඳ සියලු තොරතුරු අදාළ පාර්ශ්වවලින් කැඳවා එම තොරතුරු වාර්තා කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දීමට පෙර සියලු අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන වාර්තා කර ඇති බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| xxxiv. | විගණනයට සපයා ඇති තොරතුරුවලට අනුව, කිරම කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත හම්බන්තොට ප්‍රදේශයේ පිහිටි ඉඩම් 2013 සහ 2014 වර්ෂයන් තුළ මණ්ඩලය විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගෙන තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම ඉඩම් සඳහා ගෙවා තිබූ රු. 6,626,000 ක අත්තිකාරම් මුදල, ඉඩම් අත්තිකාරම්වල මෙන්ම මණ්ඩලයේ ස්ථාවර වත්කම්වලද ගිණුම්ගත කර තිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2022 පෙබරවාරි මාසයේදී පමණි. එබැවින්, එය නියමිත වේලාවට ප්‍රාග්ධනිත කරනු ඇත. | අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවන අත්තිකාරම් ප්‍රාග්ධනිත කර ඇති බවට සහතික විය යුතු වීම. |
| xxxv. | 2014,2017 සහ 2020 වර්ෂවල මිල දී ගත් රු. 1,234,790 ක් වටිනා තොග රත්නපුර ප්‍රාදේශිකයේ තොග කළමනාකරණ පද්ධතියට සහ ගිණුම් පොත් වලට ගෙන නොමැති බව අහඹු විගණන පරීක්ෂණයට අනුව නිරීක්ෂණය විය. එබැවින් වසර අවසානයේ තොගයේ වටිනාකම ඒ සමාන ප්‍රමාණයකින් අවතක්සේරු වී තිබුණි. | එය මේ වන විට හඳුනාගෙන ඇති අතර තොග කලමනාකරණ පද්ධතිය වෙත ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. | ගිණුම් පොත්වල ඇති තොග ශේෂයේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කල යුතු වීම. |
| xxxvi. | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (ව්‍යාපෘති 01) කොන්ත්‍රාත් අත්තිකාරම් වලට අදාලව මාස තුනක කාලය සඳහා ගොඩනැගිලි කුලිය රු. 900,000 වැඩියෙන් ගලපා ඇති බවත් රු. 3,029,984 ක විනිමය ලාභය දෙවරක් ගිණුම්ගත කර ඇති බවත් නිරීක්ෂණය විය. එබැවින් වර්ෂය අවසානයට කොන්ත්‍රාත් අත්තිකාරම් සහ කෙරීගෙන යන වැඩ ශේෂය පිළිවෙලින් රු. 2,129,984 කින් සහ රු. 900,000 කින් වැඩියෙන් දක්වා තිබූ අතර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ෂය සඳහා අලාභය රු. 3,029,984 කින් අඩුවෙන් දක්වා තිබුණි. ඊට අමතරව නුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් වර්ෂයේ තුන්වන කාර්තුවේදී ඉදිරිපත් කරන ලද අන්තර්කාලීන බිල්පත්වලින් අයකරගෙන තිබූ රු.32,933,980ක අත්තිකාරම මණ්ඩලයේ ගිණුම් පොත්වල දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින් ඒ සමාන වටිනාකමකින් කොන්ත්‍රාත් අත්තිකාරම් ශේෂය අඩුවෙන් දක්වා තිබූ අතර කෙරීගෙන යන වැඩ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | නිවාස කුලී අත්තිකාරම් නිවැරදි කිරීම සඳහා අපි අදාළ ජර්නල් ප්‍රවේශය ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර ඇත. කොන්ත්‍රාත් අත්තිකාරම් නිවැරදි කිරීම 2022 පෙබරවාරි මාසයේදී සිදු කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල කොන්ත්‍රාත් අත්තිකාරම් හා කෙරීගෙන යන වැඩ ශේෂයේ නිරවද්‍යතාවය සහතික කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| xxxvii. | නුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතියට අදාලව කොන්ත්‍රාත්කරු වර්ෂයේ තුන්වන කාර්තුව සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් වලින් මණ්ඩලය විසින් සිදු කල රඳවා ගැනීම් රු.52,336,400 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවා ගැනීම් සහ කෙරීගෙන යන වැඩ ශේෂය ඒ හා සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ නිවැරදි කිරීම් ප්‍රවේශය 2022 වර්ෂයේදී සිදු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු රඳවා ගැනීම් හා කෙරීගෙන යන වැඩ ශේෂයේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කල යුතු වීම. |
| xxviii. | 2012 පෙබරවාරි 13 වැනි දින රත්නපුර ප්‍රාදේශීය ගබඩාවට ලැබුණු රුපියල් 2,902,933 ක මුදලකින් යුත් මෝටරයක් ප්‍රාග්ධනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයේ පවා ඉන්වෙන්ටරි අයිතමයක් ලෙස හඳුනාගෙන තිබුණි. | මෙම අයිතමය නිකුත් කරන තෙක් එය තොගයේ අයිතමයක් වනු ඇත. | මණ්ඩලයේ සියලුම ස්ථාවර වත්කම් ගිණුම් පොත්වල නිසි පරිදි ගිණුම්ගත කර ඇති බවට සහතික විය යුතු වීම. |
| xxxix. | ඉඩම් තුනක (03) වටිනාකම, අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද අත්තිකාරම්, වන්දි සහ ඉඩම් නවය (09) සඳහා ගෙවන ලද රුපියල් 3,340,603 ක පොලී මුදල ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට වසර අවසානයේදී දෙසැම්බර් ආදායම ඇස්තමේන්තු කර ඇති අතර එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත. ඒ අනුව එම මාසයට සත්‍ය ආදායම වාර්තා නොවේ. | අත්පත් කරගත් ඉඩම්වල වටිනාකම ප්‍රාග්ධනිතගත කර ඇති බවට සහතික විය යුතු වීම. |

### 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් හා මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණ උපලේඛනයේ සඳහන් ශේෂයන් අතර වෙළඳ ණයගැතියන්ගේ රු. 56,043,212 ක සහ නව සම්බන්ධතා ණයගැතියන්ගේ රු.127,184,503 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | නව සම්බන්ධතා ලෙජර ගිණුම් සැසඳුම් කිරීමට ප්‍රාදේශීය ගණකාධිකාරීවරුන්ට උපදෙස් ලබා දී ඇත. | පද්ධති දෙක අතර වෙළඳ සහ නව සම්බන්ධතා ණය ගැතියන් සැසඳුම් කිරීමට සහ මූල්‍ය ප්‍රකාශන වල වෙළඳ ණයගැතියන්ගේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | මනුගත විකුණුම්, තොග විකුණුම් සහ බවුසර් සැපයුම් වටිනාකමෙහි වාණිජ අංශ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ වටිනාකම් අතර රු. මිලියන 3,939.7 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය. | වාණිජ අංශයේ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන අතර නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය කරන ලද දැනටමත් සැසඳුම් කොට නිවැරදි කිරීමේ ජනලයන් ප්‍රාදේශීය ගිණුම් වල වාර්තා කොට ඇත. | මූල්‍ය ප්‍රකාශන, වාණිජ පද්ධතිය සහ වැට් බදු ප්‍රකාශනවල ප්‍රකාශිත ආදායමේ ශේෂයන් සැසඳුම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iii. | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අදාළ ඒ ඒ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සමඟ සන්සන්දනය කිරීමේදී වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ, යාපනය කිලිනොච්චි ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ සහ කළුගඟ ජල සැපයුම වැඩිදියුණු ව්‍යාපෘතියේ විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකම රු.මිලියන 12,316.62 ක වෙනසක් නිරීක්ෂණය විය. | **යාපනය කිලිනොච්චි අපජල සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය** ව්‍යාපෘතිය විසින් සවිස්තරාත්මක කෙරීගෙන යන වැඩ සැසඳුම් ප්‍රකාශයක් වාර්ෂිකව සකස් කර ඉදිරිපත් කරයි. | මණ්ඩල මූල්‍ය ප්‍රකාශන සහ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන වල විදේශ ප්‍රදානයන්හි ඇති වෙනස්කම් සැසඳුම් කිරීමට සහ අවශ්‍ය විට ජර්නල ප්‍රවේශ සම්මත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| iv. | සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යන ව්‍යාපෘති හයක (06) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අනුරූප ශේෂයන් අතර එකතු වටිනාකම රු. මිලියන 10,633.08 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘතිය i, ii සහ iii)- ඒඩීබී සහ මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- ඒඑෆ්ඩී සඳහා සකස් කරන ලද සැසඳුම් විශ්ලේෂණය කිරීමේදී ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා වර්ෂයේදී වෙන් කරන ලද සහ ගෙවන ලද රු.මිලියන 15.48 ක පාරිතෝෂික මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | **මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘතිය I) ඒඩීබී** 2021 වර්ෂයේ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල එය ගෙවිය යුතු පාරිතෝෂිත ගිණුම සඳහා රු. 7,777,092.28 ක් ලෙස ව්‍යාපෘති 02 යටතේ ඇතුළත් කරන ලදී. කෙරීගෙන යන වැඩෙහි වෙනසට හේතු ලෙස වැට්,ඒඩීබී පොලිය සහ බැඳීම් ගාස්තු සහ එජඩො ප්‍රත්‍යාගණනය සමන්විත වේ. | යටකී වෙනස්කම් නිවැරදිව සැසඳුම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| v. | සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව බැංකු ගිණුම් පහක් (05) ක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ පිළිවෙලින් රු.6,292,288 ක සහ රු.361,841 ක හඳුනානොගත් හර ශේෂයන් සහ බැර ශේෂයන් නිරවුල් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මහජන බැංකුවේ රත්මලානේ අංක 6149 දරන ගිණුමේ වූ රු. 368,055 ක හර ශේෂයෙන් රු. 183,242.86 ක් නිවැරදි කර ඇත. අනෙකුත් ශේෂයන් 2022.12.31 ට පෙර නිරවුල් කරනු ඇත. | හඳුනා නොගත් හර හා බැර ශේෂය සැසඳුම් කර නිරවුල් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| vi. අනුරාධපුර ජල සම්පාදන ව්‍යාපෘතියට (අදියර 1) අදාළව මුදල් අග්‍රිම ගිණුමේ පැවති රු.7,351,693 ක හඳුනා නොගත් බැර ශේෂයක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | සැසඳුම් ප්‍රකාශනය ඉදිරිපත් කරනු ලැබේ. | හඳුනානොගත් හර ශේෂයන් නිරවුල් කර ඇති බව සහතික කල යුතු වීම. |

## 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2015 ජූලි 08 දිනැති ඔහුගේ පීඊ/ඩබ්එස්/එන්ඩබ්එස්ඩීබී/ජීඊඑන්/2015 ලිපිය මඟින් ලබා දුන් උපදෙස් මත සහ 2016 පෙබරවාරි 04 දින ගත් කැබිනට් තීරණය ප්‍රකාරව, හිඟ ණය ශේෂය රු. 100,263,323,220 ක් 2015 වසරේ සිට බලපැවැත්වෙන පරිදි වර්ෂය අවසානය දක්වා රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තා වලට අනුව රු.75,388,884,922 ට සමාන මුදලක් මණ්ඩලයට දුන් ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් විදේශීය ණය වශයෙන් මණ්ඩලය විසින් ගෙවිය යුතු රු. 24,874,438,298 ට සමාන මුදලක් කිසිදු අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබූ බව නිරීක්ෂණය විය. | රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් ණය ස්කන්ධයට පරිවර්තනය කරන ලදී. ඒ අනුව 2014.12.31 දිනට ඉතිරිව තිබූ ණය ශේෂය ස්කන්ධය බවට පරිවර්තනය කරන ලදී. තවද, පසුව ගන්නා ලද කැබිනට් පත්‍රිකාවේ අනුමැතිය පරිදි ඒ ඒ ඒ ණය සඳහා 2014.12.31 දිනෙන් පසු ලැබීම්ද ද ස්කන්ධය ලෙස පරිවර්තනය කරන ලදී. | රජයේ ස්කන්ධය ලෙස මාරු කරන ලද ශේෂය මහාභාණ්ඩාගාරය සමඟ සැසඳුම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| ii. මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2020 ජූනි 18 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා, ව්‍යාපෘති සහ මූල්‍ය බැඳීම් මූල්‍යනය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු. බිලියන 30 ක ණයක් ලබා ගැනීමට 2020 ජූනි 24 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඉහත තීරණයට පටහැනිව 2019 සිට 2021 දක්වා අවස්ථා තුනකදී රු. බිලියන 32 ක ණය මුදලක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් මණ්ඩලය ලබාගෙන තිබුණි. තවද, එම ණය මුදල සඳහා පොලී ගෙවීම ලෙස රු. මිලියන 2,181.17 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ අතර එම පොලියෙන් එම ණය මුදලෙන් සිදු කල ණය සේවාකරණ සඳහා පොලිය ලෙස රු. 2,080.58 ට සමාන මුදලක් වැය කර තිබුණි. ඊට අමතරව මණ්ඩලයේ වාර්ෂික අයවැය තුල රු.බිලියන 17ක් දැනටමත් වෙන් කර තිබුණද, ලබා දුන් ණය මුදලින් ණය අරමුණුවලට පටහැනිව "සැමට ජලය | 2020 මාර්තු 19 දිනැති යොමු අංක AMP/20/0501/206/018 දරන කැබිනට් තීරණ අනුව, ජල සම්පාදන ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම සහ මණ්ඩලයේ අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය බැඳීම් සපුරාලීම ඇතුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මණ්ඩලය වෙත ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ණය ලබා දෙන ලදී. ඒ අනුව, ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුවට ගෙවිය යුතු රු.492,382,118 ක ණය සේවාකරණ ගෙවීම් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ණය | ණය හරහා ලැබෙන මුදල් පරිහරණය සම්බන්ධයෙන් එළඹි කැබිනට් තීරණයට අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය'' සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 66.6ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය මුදලින් සැමට ජලය ව්‍යාපෘතිය සඳහා දැරූ මුදල වෙනුවෙන් රු.මිලියන 10.43ක් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කිරීමට සිදු ව තිබුණි. | මුදලින් මණ්ඩලය විසින් පියවන ලදී. | |
| iii. ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 806 වගන්තියට අනුව නිසි අනුමැතියක් නොමැතිව ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට දෙන ලද රු. මිලියන 31.06 ක් වටිනා ඩීඅයි පයිප්ප සහ උපාංග ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණය පදනම මත වූ භාණ්ඩවල ගෙවීම පියවීමට ලිපියක් යවා ඇත. | අදාළ පාර්ශවයන්ගෙන් භාණ්ඩ හෝ අදාල වටිනාකම අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| iv. 2021 ජනවාරි 20 වැනි දින විසල් රත්නපුර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද ඉල්ලීමකට අනුව රත්නපුර ප්‍රාදේශීය ගබඩා තොගවලින් රු.79,603,030 ක වටිනාකමින් යුත් නල සහ උපාංග 2021 අප්‍රේල් 01 දින නිකුත් කර තිබුණි.කෙසේ වෙතත්, ප්‍රාදේශීය කළමනාකරුගේ අනුමැතිය මාස 8 ක කාලයකින් පසු 2021 දෙසැම්බර් 08 දින ලබාගෙන තිබුණි. | මෙය විසඳා ඇත. | ගබඩාවලින් මාරු කරනු ලබන සියලුම ද්‍රව්‍ය සඳහා අදාළ පූර්ව අනුමැතීන් ලබාගෙන ඇති බව සහතික කර ගන්න. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වෙනත් ණයගැතියන් | 102,867,223 | විස්තරාත්මක උපලේඛන | (අ,ආ,ඉ,උ,ඌ,එ,ඒ,ක, ග,ච) විස්තරාත්මක උපලේඛන විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | (i) පසු විපරම් කටයුතු සඳහා ඒ ඒ ණය ගැතියන්ගේ සහ ණයහිමියන්ගේ, දේශීය බැංකු ණය, රඳවා ගැනීම් බදු, කෙටි කාලීන තැන්පත්, කොන්ත්‍රාත් අත්තිකාරම්, ආරක්ෂිත තැන්පතු යනාදියෙහි විස්තරාත්මක උපලේඛන දත්ත පද්ධතියක් තුළ පවත්වා ගෙන යාමට පියවර ගත යුතු වීම. |
| (ආ) | වෙනත් ණය හිමියන් | 342,938,996 | විස්තරාත්මක උපලේඛන | | |
| (ඇ) | චලනය නොවන හා සෙමින් චලනය වන තොග | 1,315,539,477 | වයස් විශ්ලේෂණය | (ඇ) මණ්ඩලයේ තොගයේ අධික බව හේතුවෙන් මෙය ලබා දීමට නොහැකි විය. | |
| (ඈ) | බදු වියදම | 138,860,749 | වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් බදු ගණනය කිරීම් | (ඈ) | |
| (ඉ) | වෙනත් ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පත් | 12,779,730 | විස්තරාත්මක උපලේඛන | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | නිවාස ණය සඳහා එච්ඩීඑෆ්සී ආයෝජන | 434,368 | බැංකු සනාථ කිරීම් | මෙය ආදායම් බද්දක් නොව මූල්‍ය ප්‍රකාශන අනුව ආර්ජික සේවා ගාස්තුවකි. | (ii) විස්තරාත්මකව බදු ගණනය කිරීමකින් පසුව වර්ෂයේ වියදම ආදායම් ප්‍රකාශයේ හඳුනාගත යුතු වීම.<br><br>(iii) මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට පෙර බැංකු ණය සනාථ කිරීම් ලබාගත යුතු වීම.<br><br>(iv)සියලුම උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වීම.<br><br>(v) රජයේ දෙපාර්තමේන්තු වලින් පවරා ගත් වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වීම.<br><br>(vi) අතිරික්ත හෝ අපහරණය කල යුතු අයිතම හදුනාගැනීමට සෙමින් චලනය වන සහ චලනය නොවන අයිතමයන්හි වයස් විශ්ලේෂණය පිළියෙල කළ යුතු වීම.<br>(vii) ක්‍රියාකාරී නොවන වත්කම් හා බැරකම්වල එක් එක් අයිතමයේ සවිස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතු වීම. |
| (උ) | දේශීය බැංකු ණය | 26,254,511 | බැංකු සනාථ කිරීම් | | |
| (ඌ) | රඳවා ගැනීම් බදු | 111,540,855 | විස්තරාත්මක උපලේඛන සහ සහතික | (ඊ)<br>තහවුරු කිරීම සඳහා නිවාස සංවර්ධන මූල්‍ය අධිකාරිය වෙත ලිපියක් යවා ඇත. | |
| (එ) | ආරක්ෂිත තැන්පතු (රජයේ නිල නිවාස) | 2,354,032 | විස්තරාත්මක උපලේඛන (සේවකයින් අනුව) | | |
| (ඒ) | කොන්ත්‍රාත් අත්තිකාරම් | 5,772,482 | විස්තරාත්මක උපලේඛන | | |
| (ඔ) | පුනුරුත්ථාපන බදු | 1,757,515 | විස්තරාත්මක බදු ගණනය, උපලේඛන | | |
| (ඕ) | රජයේ දෙපාර්තමේන්තු වෙතින් පවරා ගත් වත්කම් | 185,480,387 | පවරා ගත් විස්තරාත්මක වත්කම් වාර්තාව | | |
| (ක) | භාණ්ඩාගාර ප්‍රදාන | 98,979,261,620 | ප්‍රදානයන්ට සම්බන්ධ ව්‍යාපෘති සමග විස්තරාත්මක උපලේඛන | | |
| (ග) | ප්‍රාග්ධන ප්‍රදාන- පළාත් පාලන ආයතන | 854,660,910 | ප්‍රදානයන්ට සම්බන්ධ ව්‍යාපෘති සමග විස්තරාත්මක උපලේඛන | | |
| (ච) | විදේශීය ප්‍රාග්ධන ප්‍රදාන | 7,347,045,563 | ප්‍රදානයන්ට සම්බන්ධ ව්‍යාපෘති සමග විස්තරාත්මක උපලේඛන | | |
| (ජ) | අඩුකල ණය හිමියෝ | 2,321,570 | විස්තරාත්මක උපලේඛන | | |
| (ට) | ක්‍රියාකාරී නොවන වගකීම් | | | | |
| | (i) වෙළඳ ණය හිමියන් | 4,131,522 | විස්තරාත්මක උපලේඛන | | |

| | | |
|---|---|---|
| (ii) හිමිකම් නොපෑ වැටුප් සහ වැටුප් ලේඛන නිෂ්කාශනය | 20,639,944 | විස්තරාත්මක උපලේඛන |
| (ඩ) ක්‍රියාකාරී නොවන වත්කම් | | |
| (i) වෙනත් ණය හිමියෝ | 3,743,920 | විස්තරාත්මක උපලේඛන |
| (ii) අත්තිකාරම් | 15,274,131 | විස්තරාත්මක උපලේඛන |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | එකතුව රු. මිලියන 1,992.88 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලාපවහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් ආපසු අයකර නොගෙන වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. ඉහත ණයගැතියන් අතරින් සියයට 59 ක් කොළඹ, කැලණිය, කෝට්ටේ සහ හම්බන්තොට ප්‍රාදේශිකයන් නියෝජනය කරනු ලැබේ. නව සම්බන්ධතා ණය ගැතියන් වාරික 3 කින් අයකර ගැනීමට නියමිතව තිබුණද, රු.7,359,256 ක් අයකර නොගෙන වසර 3කට වැඩි කාලයක් පැවතුනි. | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සංචරණ සීමා පැනවීම නිසා විසන්ධි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. හිඟ මුදල් අයකර ගැනීමට දැන් කටයුතු කර ඇත. | ණය ගැතියන්ගෙන් නියමිත මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් හා අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| ii. | බිල්පත් වටිනාකම රු.50,000 වැඩි සහ 2021 නොවැම්බර් 30 දිනට දින 365ක් අඛණ්ඩව නොගෙවූ පාරිභෝගික කාණ්ඩ 20කට අදාළව වෙළෙඳ ණය ගැතියෝ 1975 දෙනෙකුගෙන් රු.මිලියන 244.63ක මුදලක් හිඟව පැවතුණි. ඉහත ශේෂයෙන් රු. මිලියන 4.57 ක් අමාත්‍ය කාර්යාල නිල නිවාස 8 (අටක්) නියෝජනය කරයි. | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සංචරණ සීමා පැනවීම නිසා විසන්ධි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. හිඟ මුදල් අයකර ගැනීමට දැන් කටයුතු කර ඇත. | දිගුකාලීන වෙළඳ ණය ගැතියන්ගෙන් නියමිත මුදල අය කර ගැනීමට හෝ හැකි සෑම විටම විසන්ධි කිරීමේ වැඩසටහන කඩිනම් කිරීමට ප්‍රමාණවත් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iii. | බිල්පත් වටිනාකම රු.5,000 ට වැඩි සහ දින 365ක් අඛණ්ඩව නොගෙවූ අමාත්‍ය නිල නිවාස සඳහා ලබාදී ඇති ජල සම්බන්ධතා 42ක් සම්බන්ධයෙන් රු.6,996,050 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර නොගෙන පැවතුනි. එම සම්බන්ධතා අතරින්, | අදාළ අමාත්‍යාංශවලින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර අභාවප්‍රාප්ත වූ අමාත්‍යවරුන්ගේ හිඟ මුදල් කපා හැරීමට ද කටයුතු කර ඇත. | අමාත්‍ය නිල නිවාසවලින් හිඟ ශේෂ අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.2,277,723 ක බිල්පත් වටිනාකමක් ඇති සම්බන්ධතා 33 ක් අක්‍රියව තිබූ අතර වසර තුනකට වඩා වැඩි කාලයක් ගෙවීම් කර නොතිබුණි. | | |
| iv. | ගාල්ල නගර සභාවේ අනවසර සම්බන්ධතා දෙකකට අදාලව වසර 19 ක ජල පරිභෝජනය සඳහා වූ රු. 1,765,352 ක හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. තවද, ගාල්ල ප්‍රාදේශිකයේ පුද්ගලික කුටුම්භයන්ගේ නීත්‍යානුකුල නොවන සම්බන්ධතා තුනකට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී, රු. 921,097 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | මේ වන විට ගාල්ල ප්‍රාදේශිකය විසින් ආදායමට වූ අලාභය අයකර ගැනීමේ කටයුතු පසු විපරම් කරමින් පවතී. | අනවසර ජල සම්බන්ධතා නිසා සිදුවන පාඩුව අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| v. | කොළඹ මහ නගර සභාවෙන් අයවිය යුතු රු.28,519,949 ක මුදලක් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | එම තැන්පතු අදාළ ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. | කොළඹ මහ නගර සභාවෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| vi. | 2021 දෙසැම්බර් 31 වන විට විසන්ධි කල හිඟ ණයගැති ශේෂය රු.1,334,585,928 ක් විය. ඒ අතරින් රු.461,330,874 ක ණයගැතියන් හෙවත් සියයට 85 කට සමාන ප්‍රමාණයක් අයකර ගැනීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා පියවර ගත යුතු වීම. |
| vii. | අහඹු ලෙස තෝරාගත් හිඟ බිල්පත් ශේෂය රු. 100,000 ඉක්මවන වටිනාකම රු. 142,277,148 ක වාණිජ අංශයේ සහ රාජ්‍ය අංශයේ වෙළෙඳ ණය ගැතියන් 134 ක් සඳහා සෘජුවම ශේෂ තහවුරු කිරීම් කැඳවා ඇති අතර රු. 24,009,302 ක් වන ණය ගැතියන් තහවුරු කිරීම් සමඟ එකඟ වන අතර රු. 26,656,777 ක් වන ණය ගැතියන් තහවුරු කිරීම් සමඟ එකඟ නොවීය. 2022 ජූනි 30 දින දක්වා රු. 91,611,069 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් තහවුරු කිරීම් ලැබී නොතිබුණි. | ජල ණය ගැතියන් මාසිකව වාර්තා කිරීම සඳහා නිකුත් කිරීම් පද්ධතිය භාවිතා කරයි. | පවත්නා පාරිභෝගික දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය සමාලෝචනය කිරීමට පියවර ගත යුතු වීම. |
| viii. | මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ බේරුවල මහ නගර සභාව ඇතුළු බාහිර ආයතනවල තබා ඇති රු. 53,408,746 ක කෙටිකාලීන තැන්පතු ආපසු අයකර නොගෙන වසර තුනකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි.තවද, රේඛීය | නල එළීම සම්පූර්ණයෙන් අවසන් කර මාර්ග සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් කළ පසු තැන්පතුව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තැන්පතු සහ අත්තිකාරම්වල පැවැත්ම සමාලෝචනය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශයේ තබා තිබූ රු.4,378,829 ක අත්තිකාරම් අයකර නොගෙන වසර නවයකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ බැරකම් ප්‍රකාශයේ පෙන්වා නොතිබීම නිසා මෙම අත්තිකාරම් ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිතය. | | |
| ix. | ආපසු ගෙවිය හැකි තැන්පතු වලට අදාල ව්‍යාපෘති දැනටමත් අවසන්ව තිබුණද, වයඹ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය විසින් මීට වසර දෙකකට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ තබා තිබූ රු.7,068,327 ක ආපසු ගෙවිය හැකි තැන්පතු අයකර ගැනීමට සැලකිය යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ආයතනවලින් තැන්පතු අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | දැනටමත් අවසන් කර ඇති ව්‍යාපෘති සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ තබා ඇති ආපසු ගෙවිය හැකි තැන්පතු ආපසු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| x. | රු.245,893,002 ක මුදලක් ආපසු ලබා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන වසර තුනකට වැඩි කාලයක් ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ලෙස පැවතුනි. කෙසේ වෙතත්, රු.111,540,855 ක සවිස්තරාත්මක උපලේඛන විගණනය වෙත සපයා නොතිබුණු බැවින් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා ශේෂය තහවුරු කර නොතිබීම හේතුවෙන් ශේෂයේ පැවැත්ම තහවුරු කරගත නොහැකි විය. | මණ්ඩලය විසින් ආදායම් බදු වාර්තාව ඉදිරිපත් කිරීමේදී ලැබිය යුතු රඳවා ගැනීමේ බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලදී. | රඳවා ගැනීමේ බදු වලට අදාළ බදු බැර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සත්‍යාපනය කර හැකිතාක් ඒවා ආපසු ලබා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| xi. | වසර 5ක් සහ වසර 6ක් ඇතුළත අයකර ගැනීමට සේවකයන්ට ලබාදී ඇති රු.2,509,328,912ක ආපදා ණයවලින් සේවකයින් 187 දෙනෙකුට ලබාදී තිබූ රු. 13,773,945ක ණය ශේෂය නියමිත දින තුළ අයකරගෙන නොතිබුණි. ඒ හා සමානව, 2011 සිට 2020 දක්වා කාලය තුළ සේවකයින් 123 දෙනෙකුට ලබා දුන් රු. 599,250 ක උත්සව අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. | විධිමත් ලෙස විශ්‍රාම ගොස් ඇති හා මියගිය ඇතැමුන්ගේ මුදල් ගිලෙන අරමුදලින් හෝ අදාළ සේවකයන්ගෙන් අය කර ගනු ලබන ඇති අතර තනතුර හැර ගිය අයගෙන් සහ වැඩ තහනමට ලක්ව ඉල්ලා අස් වූ අයගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට නියමිතය. ඉතිරි සේවකයින් පරීක්ෂා කර අනාගතයේදී සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත. | නියමිත දිනට අයකර නොගෙන ඉතිරිව ඇති සේවකයින්ට ලබා දී ඇති ණය සහ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| xii. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අවශ්‍ය අරමුදල් ලබා නොගෙන ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා මණ්ඩලයේ උතුරු මැද ප්‍රාදේශිකය විසින් රු.1,417,916 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දරන ලද පිරිවැය ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ මූලික අදියරේදී අරමුදල මාරු නොකර ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව විවිධ සංවර්ධන කටයුතු සිදු කරන ලෙස අමාත්‍යාංශය ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන වෙතින් ඉල්ලා සිටින අවස්ථා ඇති අතර කාර්ය නිමවූ පසු අමාත්‍යාංශයට බිල්පත් ඉදිරිපත් කරනු ලැබේ. | මණ්ඩලය විසින් දරන ලද වියදම් අදාළ අමාත්‍යාංශවලින් ප්‍රතිපූරණය කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. මහනුවර, මහනුවර උතුර, මහනුවර දකුණ සහ දෙහිවල යන ප්‍රාදේශිකයන්හි රු. 43,267,366 ක වෙළෙඳ ණයහිමි ශේෂය වසර 5කට වැඩි කාලයක් නිරවුල් කිරීමට පියවර නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයටත් පැවතුනි. කෙසේ වෙතත්, විගණනයට ලද තොරතුරු අනුව, ගිණුම් පොත්වල නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණද, ඉහත සියලු ණයහිමියන්ට ගෙවිය යුතු මුදල් ගෙවා ඇති බව අනාවරණය විය. | හේතුන් සවිස්තරාත්මකව හඳුනාගෙන දෝෂ නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | ණය හිමි දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමටත් දිගු කාලීන ණය නිරවුල් කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| ii. නැගෙනහිර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය , බටහිර දකුණ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය, වයඹ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය, සබරගමුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය, රුහුණුපුර ජ.ස.ව සහ සිතුල්පව්ව ජල යෝජනා ක්‍රමයට අදාලව අවලංගු කරන ලද ව්‍යාපෘති හයක් (06) සහ අවසන් කරන ලද ව්‍යාපෘති හතරක් (04) සම්බන්ධයෙන් කොන්ත්‍රාත් රඳවාගැනීම් ලෙස තබා ගෙන තිබූ පිළිවෙලින් රු. 1,963,560 ක් සහ රු. 666,375 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ පාර්ශ්ව වෙත නිදහස් කිරීමට හෝ නිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෝෂ වගකීම් කාලය අවසන් වූ විට ඔවුන්ගේ ඉල්ලීම මත පදනම්ව මෙම රඳවා තබා ගැනීම් මුදා හරිනු ලැබේ. | කොන්ත්‍රාත්කරුගේ රඳවා ගැනීම් අදාළ පාර්ශ්ව වෙත මුදා හැරීමට හෝ නිසි ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iii. රු.4,466,358 ක් වන ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු අදාළ පාර්ශ්වයන් වෙත මුදා නොහැර වසර තුනකට වැඩි කාලයක් පැවතුනි. තවද, ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(2) වගන්තියට අනුව පියවීමට ක්‍රියා නොකර දැනටමත් ආදායමට මාරු කර ඇති තැන්පතු ආපසු ගෙවීම හේතුවෙන් රත්නපුර ප්‍රදේශිකයේ ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතුවෙහි රු.188,808 ක අසාමාන්‍ය හර ශේෂයක් පැවතුනි. කෙසේ වෙතත්, වර්ෂය අවසන් වන විටත් අසාමාන්‍ය හර ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිම කිරීමෙන් පසු මණ්ඩලය විසින් අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත රඳවාගැනීම් නිදහස් කරනු ඇත. | කොන්ත්‍රාත්කරුවන්ගේ ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පත් අදාල පාර්ශව වෙත නිදහස් කිරීමටත් අසාමාන්‍ය හර ශේෂයන් විමර්ශනය කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv. | විදේශීය මූල්‍යාන ව්‍යාපෘති පහකට (05) අදාලව කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගන්නා ලද රු. 321,662,628ක ජාතික ගොඩනැගීමේ බද්ද 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මණ්ඩලය විසින් ගෙවා නොතිබුණි. | මෙම මුදල පියවීමට මණ්ඩලය මහා භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා ඇතත් මෙතෙක් අරමුදල් ලැබී නැත. | සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රමාදයකින් තොරව ගෙවා ඇති බවට සහතික විය යුතු වීම. |

## 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය සහ හම්බන්තොට ප්‍රදේශිකයේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා තැන්පතු සහ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ පිළිවෙලින් රු. 103,259,692 ක් සහ රු. 28,969,283 ක් විමර්ශනය කර අයකර ගැනීමට පියවර නොගෙන වසර පහකට වැඩි කාලයක් ගිණුම් පොත්වල පැවතුනි. තවද, මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අදාලව ගෙවන ලද ඉඩම් අත්තිකාරම් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අත්පත් කර ගෙන ඇත්ද හෝ නැද්ද යන්න පිළිබඳව විගණනයට තොරතුරු සැපයීමට වගකිවයුතු නිලධාරීන්ට නොහැකි විය. | අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ තත්ත්වය ප්‍රධාන කාර්යාලයේ සහයෝගය ඇතිව හඳුනාගෙන අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කරන ලද ඉඩම ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කරනු ඇත. | ඉඩම් අත්තිකාරම්වල දිගුකාලීන ශේෂයන් විමර්ශනය කිරීමටත් කඩිනමින් ඒවා පියවීමටත් කටයුතු කළ යුතු වීම. |
| ii. | හිටපු සේවකයන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් රු. 17,535,788 ක් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන වසර අටකට වැඩි කාලයක් ගිණුම් වල පැවතුනි.කෙසේ වෙතත්, විගණනය මගින් සිදු කරන ලද නියැදි පරීක්ෂාව අනුව, ණය සහ අත්තිකාරම් ලබා ගෙන ඇති ඉහත සේවකයින්ගෙන් සියයට 90 කට වැඩි පිරිසකගෙන් නියමිත මුදල අය නොකර විශ්‍රාම ලබා දී ඇති බව නිරීක්ෂණය විය. | මූල්‍ය අංශය, කාර්මික සබඳතා අංශය, මානව සම්පත් අංශය සහ තොරතුරු තාක්ෂණ අංශය එක්ව මේ ප්‍රශ්නය සොයා බලා හැකි ඉක්මනින් ගැටලුවට විසඳුම් සෙවිය යුතු වේ. | හිටපු සේවකයින්ගෙන් හිඟ මුදල් අය කර ගැනීමට ගත් පියවර කඩිනම් කළ යුතු වීම. |
| iii. | මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා 2008 වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන් තිදෙනකුට ලබා දුන් එකතුව රු. 9,278,335 ක අත්තිකාරම් 2022 අප්‍රේල් 30 වන විටත් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම අත්තිකාරම්වල නීතිමය ක්‍රියාමාර්ග වල තත්වය විමසා මණ්ඩලයේ නීති නිලධාරී වෙත ලිපියක් යවා ඇත. | දිගු කාලීන අත්තිකාරම් සඳහා ප්‍රමාදයකින් තොරව නීතිමය පියවර ගත යුතු වීම. |
| iv. | ප්‍රධාන කාර්යාලයට අදාළව අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා 2010-2016 කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති එකතුව රු.මිලියන 41.11ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දිගු කාලයක් ශේෂය පැවතීමට හේතු සොයා ගැනීමෙන් පසු නිවැරදි කිරීමේ පියවර ගනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| v. | මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ට ලබා දී ඇති අත්තිකාරම් වලින්, එකතු වටිනාකම රු. 210,863 ක් මහනුවර දකුණු ප්‍රදේශයේ සහ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (උතුරු මැද) වසරකට වැඩි කාලයක් අයකර නොගෙන ගිණුම් පොත්වල පැවතුනි. | 2022 දී මෙය නිවැරදි කරනු ඇත. | සැපයුම් අත්තිකාරම් හැකි ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 සම්බන්ධිත පාර්ශව සහ හෙළිදරව් නොකල සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 24) 8 වැනි වගන්තියට අනුව මණ්ඩලයේ මෙහෙයුම් ඇගයීමට බලපාන සම්බන්ධිත පාර්ශ්ව සම්බන්ධතා මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවල හෝ එහි වාර්ෂික වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනාගෙන හෙළිදරව් කිරීමේ ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි. එබැවින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ස්වභාවය සහ ප්‍රමාණය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | 2021 නොවැම්බර් මාසයේදී වන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නව මාර්ගෝපදේශයට අනුව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයන් සිදු කර ඇති අතර අවශ්‍ය හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවෙන් සිදු කරනු ඇත. | සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (ශ්‍රීලංගිප්‍ර 24) අනුව සම්බන්ධිත පාර්ශ්ව සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගෙන ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෝ එහි කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ | | | |
| i. | 2015 අගෝස්තු 12 දිනැති පාලන/ 12/2015 | විසන්ධි කිරීමෙන් මාස 3 ක් ඇතුලත හිඟ හිටි ණය ගැති ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත යුතු වේ. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.මිලියන 431.5 ක් වන රු.50,000 වඩා වැඩි බිල්පත් වටිනාකමක් සහිත විසන්ධි කරන ලද පාරිභෝගිකයින් 3,846 ක් සම්බන්ධයෙන් හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. තවද, රත්නපුර දිස්ත්‍රික්කයේ රු. 439,371 ක හිඟ | විසන්ධි කිරීමේ වැඩසටහන් මගින් ගෘහස්ථ පාරිභෝගිකයින්ගේ හිඟ ශේෂයක් අය කර ගෙන ඇත. | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | බිල්පත් වටිනාකමක් ඇති රජයේ නිල නිවාස 12 ක් සඳහා ජල සැපයුම විසන්ධි කර වසර 3 සිට 11 ක් ගතවී ඇතත් නැවත සම්බන්ධතාවය ලබාගෙන නොතිබුණද ජල සැපයුම ප්‍රධාන නලයෙන් විසන්ධි කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| ii. | 2018 සැප්තැම්බර් 26 දිනැති පාලන/ 09/2018 චක්‍රලේඛය සහ මණ්ඩලයේ නිල නිවාස කාර්ය සංග්‍රහයේ 8.1.1 සහ 8.2.2 වැනි ඡේදය | වෙළඳපල කුලියට සමාන මාසික කුලියක් සහ වැටුපෙන් සියයට 12.5 ක අධිභාරයක් වසර 5 කට වඩා වැඩි කාලයක් නිල නිවාසයන්හි පදිංචි සේවකයින්ගෙන් අය කල යුතු වේ. කෙසේවෙතත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන හයක සහ ප්‍රධාන කාර්යාලයේ සේවකයින් හැට හය (66) දෙනෙකු වසර 5 කට වඩා වැඩි කාලයක් නිවාසයන්හි පදිංචිවී සිටියද, වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු.29,996,237 ක දඩකුලිය (වෙළෙඳපොල කුලිය හැර), 2022 පෙබරවාරි අවසානය වන විටත් අය කර ගෙන නොතිබුණි. | අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු නිල නිවාසවල අනුමත කාල සීමාව ඉක්මවා රැඳී සිටින අයගෙන් අධිභාරය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| iii. | මණ්ඩලයේ නිල නිවාස කාර්ය සංග්‍රහයේ 11.2 වැනි ඡේදය | සේවා ස්ථානයේ සිට නිල නිවාස දක්වා කිලෝමීටර් 25 කට අඩු දුරකින් ස්ථිර ලිපිනයන් පිහිටි බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ සේවකයින් හය දෙනෙකු සඳහා නිල නිවාස හයක් වෙන් කර තිබුණි. තවද, සේවා ස්ථානයේ සිට නිල නිවාස දක්වා කිලෝමීටර් 25 කට අඩු දුරකින් ස්ථිර ලිපිනයන් පිහිටි සේවකයන් හය දෙනෙකුට 2019 පෙබරවාරි සිට 2021 නොවැම්බර් දක්වා රු. 2,997,000 ට සමාන මුදලක් අඹතලේ බලශක්ති ඉතුරුම් කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල්වලින් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇත. විමර්ශන වාර්තාවෙන් අනාවරණය කර ගත් කරුණු අනුව පිළිබඳව වාර්තා කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | -එම- |
| iv. | 2020 සැප්තැම්බර් 02 දිනැති පාලන/ 16/2020 හි 2.1 සහ 2.3 ඡේද | බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත නිලධාරීන් දහහත් දෙනෙකු (17), අම්පාර ප්‍රාදේශිකයට අනුයුක්ත නිලධාරීන් දෙසිය තුන් දෙනෙකු (203) සහ අක්කරෙපත්තු ප්‍රාදේශිකයට අනුයුක්ත නිලධාරීන් එකසිය තිස් අටදෙනෙකු දෙනෙකු (138) | වසර 05කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරන අයට තම අභිමතය පරිදි ස්ථාන මාරුවීම් සඳහා අවස්ථාව හිමිවේ. රටේ පවතින | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිවෙලින් වසර 06 සිට 27 දක්වාත්, වසර 05 සිට 38 දක්වා සහ වසර 05 සිට 16 දක්වා වූ කාල පරාසයක් එම සේවා ස්ථානයේම සේවය කරනු ලබයි. | තත්ත්වය සහ ඉන්ධන හිඟය හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම ඉතා දුෂ්කර වී ඇත. | |
| v. | මණ්ඩලයේ නිල නිවාස කාර්ය සංග්‍රහයේ 12.2 වැනි ඡේදය සහ 2015 නොවැම්බර් 30 දිනැති අංක පා18/2015 දරන මණ්ඩල චක්‍රලේඛයේ 3 ඡේදය | ජල බිල්පත් හිඟ සේවකයින්ගෙන් වැටුපෙන් සියයට 10 ක අධිභාරයක් සහිත මාසික බිල්පත් වටිනාකම අය කළ යුතු වේ. කෙසේ වෙතත්, හිඟ ජල බිල්පත් වටිනාකම මාස තුනක කාල සීමාවක් පුරා රු.1,000 ඉක්මවූ ජල සම්බන්ධන 201 කින් එකතු වටිනාකම රු.1,710,387 ක් වන හිඟ ජල බිල්පත් ගාස්තුව අධිභාරය සමග අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් 9 දෙනෙකුගෙන් පදිංචි දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජල පරිභෝජනය සඳහා කිසිදු ගාස්තුවක් අය කර නොතිබූ අතර එම නිසා මණ්ඩලයට දළ වශයෙන් රු. 255,600 ක පාඩුවක් දැරීමට සිදු ව තිබුණි. | අදාළ පුද්ගලයින්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර මානව සම්පත් අංශය සහ මූල්‍ය අංශය සම්බන්ධීකරණයෙන් මෙම ණය අයකර ගැනීමට කටයුතු කර ඉදිරියේදී ප්‍රගතිය වාර්තා කිරීමට නියමිතය. | -එම- |
| (ආ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ, රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2(i) වගන්තිය | මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා 2022 මාර්තු අවසානය වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ වන විට වෘත්තීය සමිති විසින් ඉදිරිපත් කරන ලද කරුණු ඇතුළත් කර අවසන් පෝරමය සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2022.06.06 දින අමාත්‍යාංශය විසින් ලබාගෙන ඇත. | කළමනාකරණ සේවා චක්‍රලේඛ හා පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තු වේ මාර්ගෝපදේශ සමඟ දැඩිව අනුගත වන බව සහතික විය යුතු වීම. |
| (ඇ) | 2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| | i. 1.2 ඡේදය | සමාලෝචිත වර්ෂයේ දී සභාපතිවරයා සඳහා වාහන දෙකක් වෙන් කර තිබුණි. | වාහන ප්‍රතිපත්තියට අනුව සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට වාහන | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛවලට දැඩි ලෙස අනුකූල |

| | | | | |
|---|---|---|---|---|
| | ii. 1.4 ඡේදය | සමාලෝචිත වර්ෂයේ දී උප සභාපතිවරයා සඳහා වාහන දෙකක් වෙන් කර තිබුණි. | 02ක් වෙන් කර ඇත | වන බවට සහතික විය යුතු අතර වාහන ප්‍රතිපත්තිය රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛවලට අනුකූලව සකස් කළ යුතු වීම. |
| (ඇ) | 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.3 වගන්තිය | මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කළ හැකි අවදානම් තක්සේරු කිරීමට, මූල්‍ය හා මූල්‍ය නොවන එවැනි අවදානම් වල බලපෑම ගණනය කිරීමට අවදානම් කමිටුවක් 2022 මාර්තු අවසානය වන විටත් පත් කර නොතිබුණි. | මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් සමන්විත අවදානම් කමිටුවක් 2022.02.09 දින පත් කර ඇත. අවදානම් කමිටුවේ සභාපතිවරයාගේ පරීක්ෂාව සඳහා කෙටුම්පත් යොමුකිරීමේ අනුදේශයක් ඉදිරිපත් කර ඇත. | පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ සමඟ දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| (ඉ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 2.3.2 වගන්තිය | මාතර අදියර (iv) ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා 2021 සැප්තැම්බර් මාසයේ සිට 2022 මාර්තු 31 දක්වා පවා පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු පත් කර නොතිබුණි. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විශ්‍රාම යාම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතින බැවින් ආවරණය දකුණු අතිරේක සාමාන්‍යාධිකාරීවරයා වෙත ලබා දෙන ලදී. | කළමනාකරණ විගණන චක්‍රලේඛ සමග දැඩිව අනුකූල වන බව සහතික විය යුතු වීම. |
| (ඊ) | 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.5 වගන්තිය | 2021 දෙසැම්බර් 31 වන විට රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් විසිඑක් (21) දෙනෙකුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 28.73 ක් සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2021 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද සේවකයින් සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් රු. මිලියන 216.12 ක් ප්‍රතිපූරණය කළ යුතු වේ. | ඉල්ලීම් ද සැලකිල්ලට ගෙන ඇති අතර මණ්ඩලයේ සේවකයින් කිහිප දෙනෙකු අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇත. මෙම සේවකයින් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ඔවුන්ගේ වැටුප් ප්‍රතිපූරණය කළ නොහැකි බව අමාත්‍යාංශය දැනුම් දී ඇත. | පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ සමඟ දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 06 වැනි වගන්තිය | 2016 වර්ෂයෙන් පසුව වාහන හැර ස්ථාවර වත්කම් එකතු කිරීම් සහ අපහරණයන් 2022 මාර්තු 30 දින වන විටත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි. | තොරතුරු රැස් කිරීමට වැඩි කාලයක් අවශ්‍ය වේ. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛවලට දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| (ඍ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | (i)XIX පරිච්ඡේදයේ 5 වන වගන්තිය | සිදු කල නියැදි විගණන පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන හයකට සහ ප්‍රධාන කාර්යාලයට අදාලව රු.85 සිට රු.4000 පමණක් දක්වා වූ පරාසයක මාසික කුලියක් අයකරන බවත් සේවකයින් 20 දෙනෙකුගෙන් කිසිදු කුලියක් අය නොකරන බවත් නිරීක්ෂණය විය. | නිල නිවාසවල කුලිය එකතු කිරීමේ නව ක්‍රමවේදයට නිල නිවාස කමිටුවෙන් අනුමැතිය ලැබී ඇති අතර නිල නිවාස සඳහා වන ආචාරධර්ම සංග්‍රහය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව එය ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. | නිල නිවාසවල කුලිය අයකිරීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන සමග දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| | (ii)VII පරිච්ඡේදයේ 1.8,4.6 සහ 7.4 වන වගන්තිය | සේවය හැර ගිය (තනතුරෙන් ඉවත් වූ), ඉල්ලා අස් වූ සහ සේවයෙන් පහ කළ සේවකයින් දාහතක් (17) සම්බන්ධයෙන් පිළිවෙලින් රු.328,276 ක්, රු.442,815 ක් සහ රු.197,426 කින් සමන්විත එකතු වටිනාකම රු.968,517 ක් ඔවුන් සිය පුද්ගල පඩිනඩි සඳහා හිමිකමක් නොලැබුවද, වසර තුනකට වැඩි කාලපරිච්ඡේදයක් පුරා ගිණුම්වල වෙන්කොට තිබුණි. | මෙම ගැටලුවට මූලික හේතූන් දැනටමත් හඳුනාගෙන ඇති අතර මෙම ගැටළුව නිවැරදි කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 113 වන ඡේදය | මැදිරිගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාළව ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන්, කොළඹ නගර සභාව, කොළඹ නගරය දකුණ, කොළඹ නගරය උතුර (මට්ටක්කුලිය), කළමනාකරු කෝට්ටේ (බත්තරමුල්ල), දෙහිවල කළමනාකාර කාර්යාලය, පානදුර ( හොරණ) කළමනාකාර කාර්යාලය, අමාත්‍ය නිල නිවාසයන්ගෙන් ලැබිය යුතු රු.75,868,821 ක හිඟ ජල බිල්පත් ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර අනුමැතියක් ලබා | පසුව භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | මූල්‍ය රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත පදනම්ව පමණක් කපා හැර තිබුණි. | | |
| (ඒ) | 2017 පෙබරවාරි 27 දිනැති අංක 17/0453/714/008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 මාර්තු 13 දිනැති අංක සීඑෆ්17/0453/714/008 දරන ලිපියේ වූ මුදල් අමාත්‍යවරයාගේ 03 වන නිරීක්ෂණය | අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුවෙන් ලබාගත් ණය සඳහා අදාල වන 492,381,118 ක පොලී ගෙවීමට අදාළව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය සඳහා පොලී මූල්‍යයනය කිරීමට භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල්වලින් රු. 29,912,098 ක් වැය කර තිබුණි. | මාර්තු 19 දිනැති යොමු අංක ඒඑම්පී/20/0501/206/018 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ජල සම්පාදන ව්‍යාපෘති මූල්‍යනය සහ මණ්ඩලයේ අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය බැදීම් සපුරාලීම ඇතුළුව කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මණ්ඩලය වෙත ජාතික ඉතිරිකිරීම් බැංකු ණය ලබා දෙන ලදී. ඒ අනුව ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුව වෙත ගෙවිය යුතු ණය සේවාකරණ ගෙවීම් මණ්ඩලය විසින් පියවන ලදී. | මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පිළිපදින බවට සහතික විය යුතු වීම. |

## 1.9 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1999 සිට 2006 දක්වා වර්ෂයන් තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කරන ලද රු.මිලියන 246.64 ක මුදල් වංචාවන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය හා සම්බන්ධව රු. මිලියන 171.9 ක මුදල් වංචාව අතරින් රු.මිලියන 24.15 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණය ගැතියන් ලෙස වාර්තා කොට තිබුණි. තවද, 2001 වර්ෂය තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ සිදු කළ රු. 272,735 ක තවත් මුදල් වංචාවක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි. | ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර කාර්යාලවල සිදුවූ මූල්‍ය වංචා සම්බන්ධයෙන් තවදුරටත් ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා ඇති අතර නීතිපති උපදෙස් අනුව ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතය. එමෙන්ම හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ට එරෙහිව පවරා ඇති නඩුවට අදාළව එම නඩු තීන්දුවලට අනුව ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | අනාගතයේ දී ඉහත සඳහන් තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බවට සහතික විය යුතු වීම. |

**1.10** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන සංශෝධිත එකතු කල අගය මත බදු පනත | | | |
| i. | 22 (i) ඡේදය | 2021 ජනවාරි මාසය සඳහා රු. 26,123,533 ක මලාපවහන ආදායමට (සැපයුමේ වටිනාකම) අදාළ රු.2,081,107 ක එකතු කළ අගය මත බද්ද ජනවාරි මාසයේදී ගිණුම්ගත කර නොතිබූ අතර එබැවින් 2021 පෙබරවාරි මාසය අවසන් වීමට පෙර ගෙවා නොතිබුණි. | මුදල් ලැබුණු අවස්ථාවේදී නිවැරදි කිරීම සිදු කරනු ලැබේ. | එකතු කළ අගය මත බදු පනතේ ඇති විධිවිධාන දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| ii. | 21(i) ඡේදය | 2021 වර්ෂයේ මුළු කාර්තු හතර සඳහාම වන එකතු කල අගය මත බදු වාර්තා මාස තුනේ සිට මාස හතර දක්වා ප්‍රමාදයකින් යුතුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. | බදු වාර්තා අවසන් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැතිකම, සීමිත කාර්ය මණ්ඩලය, ප්‍රාදේශිකවල වැට් බදු උපලේඛන ලැබීමේ ප්‍රමාදය යනාදිය මෙයට හේතු විය. | -එම- |
| (ආ) | 2019 ජූලි 09 දිනැති අංක සීජීඅයිආර්/2019/3වී( අයිඑන්එස් ඇන්ඩ් සීඅයිආර්) දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.4 ඡේදය | සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, වැට් බදු අක්‍රිය සැපයුම්කරුවන් පහළොස් (15) දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ අවස්ථා පනස් දෙකකදී රු. 2,465,952 ක එකතු කළ අගය මත බදු මුදලක් ගෙවා තිබුණි. | මුළු අක්‍රිය සැපයුම්කරුවන්ගෙන් රු. 2,112,048.74 ක් අය කර ගෙන ඇත්තෙමු. ඉදිරියේදී ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | වැට් බදු අක්‍රිය සැපයුම්කරුවන්ට ගෙවන ලද වැට් බද්ද අයකර ගැනීමට සහ අනාගතයේදී ගෙවීම් කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල විධිවිධානයන්ට දැඩි ලෙස අනුකූල වන බවට සහතික වීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2002 අංක 14 දරණ එකතු කළ බදු පනතේ 2 ඒ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අති විශේෂ ගැසට් නිවේදන ප්‍රකාශය | ප්‍රදේශික 08 ක ගෘහස්ථ, රජයේ නිල නිවාස, වාණිජ ආයතන සහ රාජ්‍ය ආයතනවල මනුගත විකුණුම් මත 2021 ජනවාරි මාසය තුළ සියයට 8 ක් වෙනුවට අඩු ප්‍රතිශතයක් අය කර ගෙන තිබුණි. එබැවින් වැට් බද්දෙහි ව්‍යවස්ථාපිත ප්‍රතිශතයට වඩා රු.2,088,094 අඩු මුදලක් මණ්ඩලය විසින් ප්‍රකාශ කර ගෙවා තිබුණි. තවද, | මෙය පද්ධති දෝෂයක් වන අතර එය 2022 වර්ෂයේදී නිවැරදි කරනු ඇත | එකතු කළ අගය මත බදු පනතේ ඇති විධිවිධාන වලට දැඩි ලෙස අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2021 වසරේ මුල් කාර්තු දෙක සඳහා ගම්පහ, කොළඹ සහ අම්පාර ප්‍රාදේශිකයන්ට අදාළව මනුගත විකුණුම් මත වන රු.10,268,679 ක එකතු කළ අගය මත බදු මුදලක් 2021 ජූලි 31 අවසන් වන විටත් මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර ගෙවා නොතිබුණි. | | |
| (ඈ) | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2019 ජූලි 09 දිනැති අංක සීජීඅයිආර්/2019/3වී/( අයිඑන්එස් සහ සීඅයිආර්) චක්‍රලේඛයේ 01 වගන්තිය | එකතු කළ අගය මත බදු ගෙවන සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී වලංගු බදු හැඳුනුම් අංකයක් සන්තකයේ තබාගෙන ඇති බවට මුදල් ගෙවීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැට් බදු ගෙවීමට පෙර සැපයුම්කරුවන්ගේ වැට් බදු ලියාපදිංචි සහතිකය පරීක්ෂා කරන ලෙස සියලුම ගණකාධිකාරීවරුන්ට උපදෙස් දී ඇත. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ විධිවිධායන්ට දැඩි ලෙස අනුගත වන බවට සහතික විය යුතු වීම. |
| (ඉ) | අංක එස්ඊසී/2012/04 දරන සරල කරන ලද එකතු කළ අගය මත බදු පද්ධති මාර්ගෝපදේශයේ 14 වන ඡේදය | 2021 වසර සඳහා පිළිවෙලින් පළමු හා දෙවන කාර්තුවලට අදාළව රු. 3,531,056 ක් සහ රු. 3,248,019 ක් වූ සරල කළ අගය එකතු කළ බදු (SVAT) වවුචර 2022 මාර්තු 30 වන විටත් එකතු කර ගෙන නොතිබුණි. | විගණනය කරන ලද කාල සීමාව තුළ සියලුම වවුචර ලැබී නොතිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වැට් බදු වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර අපි රැමිස් පද්ධතිය හරහා වවුචර්වල විස්තර ලබා ගත්තෙමු. | ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශය න්ට දැඩි ලෙස අනුගත වන බවට සහතික විය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ වටිනාකම රු.2,996,686,249 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු. 642,781,124 (නැවත සඳහන්කර ඇති) ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,639,467,373 ක් වන ලාභයේ දැවැන්ත පිරිහීමක් නිරීක්ෂණය විය.මනුගත විකුණුම් ආදායම සංසන්දනාත්මකව අඩු වීම, පිරිපහදු ජල නිෂ්පාදනයට අදාල පිරිස් පිරිවැය වැඩිවීම, නිෂ්පාදනයට අදාල අනෙකුත් පිරිවැය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස දළ ලාභ අනුපාතය සියයට 6 කින් ඉහළ යාමත් පසුගිය වසර සමඟ සැසඳීමේදී පරිපාලන වියදම් හා මූල්‍ය පිරිවැය වැඩි වීමත් මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | විචලන වටිනාකම වැඩි වීම/ (අඩු වීම) (රු.මි.) | විචලනය % | විචලනයට හේතු |
|---|---|---|---|
| මනුගත විකුණුම් | 1,174 | 4 | දී ඇති නව ජල සම්බන්ධතා වැඩි වීම, ගෘහස්ථ පරිභෝජනය වැඩිවීම, බවුසර් ජල සැපයුම වැඩි වීම ආදිය |
| විකුණුම් පිරිවැය | 2,408 | 14 | පිරිස් පිරිවැය, පොම්ප කිරීමේ පිරිවැය, රසායනික පිරිවැය, අලුත්වැඩියා හා නඩත්තුව, වරිපනම් හා කුලී යනාදිය ඉහළ යාම |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා ඉපැයීම් | 314 | 21 | මළාපවහන, භූගත ජල ආදායම, දඩ හා අධිභාර ඇතුළු විවිධ ආදායම් ඉහළ යාම ආදිය |
| පරිපාලන වියදම් | 1,622 | 10 | කාර්ය මණ්ඩල පිරිවැය, අලුත්වැඩියා, නඩත්තු හා ආයතන පිරිවැය වැඩි වීම |
| මූල්‍ය පිරිවැය | 209 | 38 | පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ණය ගැනීම් හා සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වාරික ඉහළ යාම |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මණ්ඩලයේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | 2021 | 2020 |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 33.77 | 39.65 |
| ශුද්ධ ලාභ ආන්තිකය | (10.83) | 1.9 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.39 | 1.84 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 1.22 | 1.63 |
| මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන) | 0.04 | 0.04 |

ඉහත තොරතුරු වලට අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය අනුපාතයන් හි (මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය හැර) අහිතකර තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 1.9 ක් වූ ශුද්ධ ලාභ ආන්තිකය සමාලෝචිත වර්ෂයේදී සියයට 10.83 ක ශුද්ධ අලාභ ආන්තිකයක් දක්වා දැඩි ලෙස පහල බැස තිබුණි. පසුගිය වර්ෂය හා සංසන්දනය කිරීමේදී ඉදිරි වසර තුළදී ගෙවිය යුතු ණය ප්‍රමාණය වැඩි වීම, කොන්ත්‍රාත් රඳවා ගැනීම් හා උපචිත

වියදම් වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස ජංගම අනුපාතය සහ ද්‍රවශීලතා අනුපාතයද පිළවෙලින් 0.45 ක හා 0.41 ක වාර ගණනකින් පිරිහී තිබුණි. තව ද ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් ඉකුත් වර්ෂය හා සංසන්දනය කිරීමේදී මණ්ඩලයේ මුළු හිඟ ණය ශේෂය සියයට 19 කින් හෙවත් රු. බිලියන 201.09 සිට රු. බිලියන 240 දක්වා වැඩිවී තිබුණි. එබැවින් පසුගිය වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදි ණය ස්කන්ධ අනුපාතය (තෝලන) සියයට 53 සිට සියයට 58 දක්වා සියයට 5 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මණ්ඩලය විසින් මාතර අදියර (IV) ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාගෙන තිබූ ණය සඳහා ගෙවිය යුතු ණය වාරික ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු.162,900ක ප්‍රමාද පොලී ගෙවීමට සිදු වී තිබුණි. තවද, බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් 2020 අප්‍රේල් සිට 2021 ඔක්තෝබර් දක්වා කාල පරිච්ඡේදයට අදාල විදුලි බිල් ගෙවීම ප්‍රමාද වීම් හේතුවෙන් රු.1,815,460කට සමාන ප්‍රමාද පොලියක් ගෙවා තිබුණි. | ජාතික සංවර්ධන බැංකුව විසින් ඉදිරිපත් කරන ලද ණය සේවාකරණ දැනුම් දීම් හි රු.162,900ක ප්‍රමාද පොලී ඇතුලත් වී නොතිබුණි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විදුලි ගෙවීම් සිදු කල නොහැකි විය. | ප්‍රමාද පොලී අයවීම වැලැක්වීම සඳහා නිසි වේලාවට ණය සේවා ගෙවීම් හා අනෙකුත් ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුවීම. |
| ii. | ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ (බටහිර නිෂ්පාදන) නිල නිවාස වල පදිංචි නිලධාරීන් 11 දෙනෙකුගෙන් නියමිත නිවාස කුලියට වඩා අඩු කුලියක් අය කිරීම හේතුවෙන් රු.1,432,839ක මුදලක් මණ්ඩලයට අහිමි වී තිබුණි. | නිල නිවාස සංග්‍රහය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව අනු කමිටුවේ නිර්දේශ අනුගමනය කරමින් සෑම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයකම නිවාස කුලී ක්‍රියාත්මක කරනු ලැබේ. | නිල නිවාස වල පදිංචි නිලධාරීන්ගෙන් නියමිත කුලියට වඩා අඩු කුලියක් අය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| iii. | බටහිර නිෂ්පාදන ප්‍රාදේශීකය යටතේ ලබා දී තිබූ ජල සම්බන්ධතා 7112 සම්බන්ධව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී 2021 නොවැම්බර් මස මනු කියවීම පෙර මාසයට වඩා අඩු ව තිබූ බව නිරීක්ෂණය වූ අතර එබැවින් ජල බිල්පත් ඒකක 2,435,948ක අඩු වීමක් හෝ රු.29,231,376ක සාමාන්‍ය පාඩුවක් වී ඇති බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ විස්තරාත්මක පරීක්ෂාවක් සිදු කෙරේ. කෙසේ වෙතත් ඊළඟ මාසයේදී මෙය නිවැරදි කරනු ලැබේ. | පාරිභෝගිකයන් ඔවුන්ගේ ජල පරිභෝජනය වෙනුවෙන් නිවැරදිව බිල් කරන බව තහවුරු කර ගත යුතු වීම. |
| iv. | 2021 ජනවාරි 01 සිට 2021 නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය තුළ මහරගම, කෝට්ටේ , රත්නපුර, පානදුර,හොරණ ආදී ඇතුළු ප්‍රාදේශික 31ක් විසින් අනු පිටපත් බිල්පත් 41,546ක් නිකුත් කර ඇති බව නියැදි විගණන | තොරතුරු තාක්ෂණ අංශයේ සහය ලබාගෙන මෙම වැරදි නිවැරදි කොට ඇත. | වාණිජ මෙහෙයුම් පද්ධතිය තුල අනු පිටපත් බිල්පත් නිකුත් වීම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එම සම්බන්ධතා සඳහා රු.69,351,972 කට සමාන මුදලක් 2021 නොවැම්බර් 30 දින වන විටත් අය කර නොගෙන හිඟව පැවතුණි. තවද ඒ අතරින් මහරගම,කෝට්ටෙ, කැළණිය, හම්බන්තොට, කෑගල්ල, ගාල්ල හා අනුරාධපුර යන ප්‍රාදේශිකයන් වලට අදාලව එක් ප්‍රාදේශිකයකට අනු පිටපත් බිල්පත් 2000කට අධික ප්‍රමාණය බැගින් නිකුත් කර තිබුණි. | | |
| v. | පරිවාස කාලයේ පසු වූ මනු සටහන්කරුවකු (සේවක අංක 2031868) විසින් මනු සටහන් කිය වීමේදී සිදු කළ විෂමාචාර හේතුවෙන් ඔහු සේවයෙන් පහ කිරීමට මණ්ඩලයේ කළමණාකාරිත්වය අපොහොසත්වීම හේතුවෙන් එම මනුසටහන්කරු විසින් ගොනු කරන ලද නඩුවක් සම්බන්ධයෙන් රු.559,746ක වන්දි මුදලක් ගෙවීමට මණ්ඩලයට සිදු වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඔහු විසින් වැරදි මනු සටහන් ඉදිරිපත් කිරීම හේතුවෙන් මණ්ඩලයට සිදු වූ අලාභ අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අංශ ප්‍රධානීන් ඔහුගේ තනතුර ස්ථිර කිරීම නිර්දේශ කර නොමැති අතර නියමිත දිනයට තනතුර ස්ථිර කිරීම කළ නොහැක. එය දැනුම් දී ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කල යුතුව තිබුණද, එවැනි ලිපියක් ඔහුගේ පුද්ගලික ලිපි ගොනුවට අනුව නිකුත් වී නොමැත. තවද, ඒ අවස්ථාවේදී මෙම ලිපි ගොනුව භාරව සිටි නිලධාරීන් මේ වන විට විශ්‍රාම ගොස් ඇත. | ඉදිරියේදී මණ්ඩලයට මෙවැනි පාඩු සිදු වීම වලක්වා ගැනීමට පරිවාස කාලයෙන් පසු සේවකයින් ස්ථිර කිරීම හෝ සේවයෙන් පහ කිරීම සහතික කිරීම සඳහා නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් ඇති බවට සහතික විය යුතු වීම. |
| vi. | කටුගස්තොට ජල පවිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අත්පත් කර ගත් ඉඩමේ හිමිකරුට වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් 2012 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.2,050,962ක මුදලක් වන්දි සඳහා පොලිය ලෙස ගෙවා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | වන්දි මත පොලිය ගෙවීම වැලැක්වීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට පෙර වන්දි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් බව තහවුරු කර ගත යුතු වීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තිය අනුව නව ජල සම්බන්ධතාවය ලබා දුන් දිනයේ සිට දින 30ක් ඇතුළත පාරිභෝගිකයාට පළමු බිල්පත නිකුත් කල යුතු වේ. කෙසේ වෙතත් 2021 නොවැම්බර් 30 දින වන විට කොළඹ, දකුණ, මහරගම, කැස්බෑව, කළුතර හා මාතර යන ප්‍රාදේශිකයන්ට අදාලව අවස්ථා 149කදී පළමු බිල්පත ලබා දීම සඳහා දින 37 සිට දින 329 දක්වා වූ පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | මෙය රට තුල පැවතුනු කොවිඩ් සීමා කිරීම් නිසා සිදු වූ නමුත් අද වන විට පාරිභෝගිකයාට පළමු බිල්පත ප්‍රමාදයකින් තොරව ලබා දීමට පියවර ගෙන ඇත. | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තියට අනුකූලව කටයුතු කරන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | කළුතර කළමනාකරු කාර්යාලයට අදාලව නව සම්බන්ධතා ලබා දුන් දිනය හා පාරිභෝගිකයාට පළමු බිල නිකුත් කළ දිනය අතර දින 57 සිට 186 දක්වා වූ පරාසයක සැලකිය යුතු කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | මෙම ප්‍රමාදය මගහැරීම සඳහා වාණිජ මෙහෙයුම් කළමණාකරන පද්ධතිය සංවර්ධනය කර තිබේ. | -එම- |
| iii. | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තිය අනුව ගිවිසුම් අත්සන් කොට අදාල ගෙවීම් සිදු කර දින 1ත් 4ත් අතර කාලය තුල නව සම්බන්ධතා ලබා දිය යුතු වේ. කෙසේ වෙතත් 2022 ජනවාරි 28 දින වන විට පොතුවිල් හා පරගහ කැලේ ජල සම්පාදන ක්‍රමයන්හි අවස්ථා 6ක් තුල දින 24 සිට දින 59 දක්වා කාල ප්‍රමාදයක් ගත වන තුරුත් 2022 ජනවාරි 28 දිනට කාර්තිව් හා අක්කරෙයිපත්තු ජල සම්පාදන ක්‍රමයන්හි (වැඩ භාර නිලධාරී කාර්යාල) අවස්ථා 26ක් තුලදී මාස 01 සිට මාස 07 දක්වා වූ කාල ප්‍රමාදයක් ගත වන තුරුත් අදාල පාරිභෝගිකයන්ට ජල සම්බන්ධතාවය ලබා දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබූ බව විගණනය විසින් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම ගැටළුව විසඳීමට අදාලව ප්‍රමාදය අවම කිරීම සඳහා උපදෙස් ලිපියක් නිකුත් කර ඇත. | -එම- |
| iv. | ඉදිකිරීම් කටයුතු සඳහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් වල යෝග්‍යතාවය මණ්ඩලය විසින් පත් කරන ලද තාක්ෂණික කමිටුවක් හරහා නිසි ලෙස ඇගයීමට ලක් කර නොතිබූ අතර, එබැවින් ලබුගම ජලාශය හා දංකොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජල ටැංකියක් ඉදිකිරීම සඳහා වූ ඉඩම් දෙකක් රු.41,920ක මුදලක් දැරීමෙන් පසු අත හැර දමා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | සැලසුම් අදියරයේදී තාක්ෂණික කමිටුවක් හරහා අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් වල යෝග්‍යතාවය නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු වීම. |
| v. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධීක්ෂණය හා පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් ඉඩම් 03ක් අත්පත් කර ගැනීමට හෝ පැවරුම් සහතික ලබා ගැනීමට අවුරුදු 11 සිට අවුරුදු 17 දක්වා වූ පරාසයක සැලකිය යුතු කාල ප්‍රමාදයක් ගත වී ඇති බව නිරීක්ෂණය විය. | එල්ඒ/1784 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට නියමිතය.<br>එල්ඒ/656 එය පදියතලාව ජල සම්පාදන ක්‍රමය යටතේ ජල ටැංකිය ඉදි කිරීම සඳහා භාවිතා කර ඇත. මෙම ඉඩමේ පවරා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලබයි.<br>ප්‍රාදේශීය ලේකම් (පදියතලාව) විසින් දැනටමත් අදාල පැවරුම් සහතික නිකුත් කර තිබේ.<br>එල්ඒ/1366 ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිමකිරීමට ආසන්නව ඇත. | ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් ඇති බවටත් පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදු වන බවටත් තහවුරු කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| vi. | මණ්ඩලය විසින් 1981 වර්ෂයේදී නිල නිවාස හා ගබඩාවක් ඉදි කිරීම සඳහා කළුතර ප්‍රදේශයේ ඉඩමක් අත්පත් කර ගෙන තිබූ අතර 1991 වර්ෂයේදී එම ඉඩමේ හිමිකරුවන්ට වන්දි ගෙවීම සඳහා රු.531,000ක් කළුතර දිස්ත්‍රිකකයේ ආණ්ඩුකාරවරයාට හා රු.106,980 ක මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුවටත් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් ඉඩම ආරක්ෂා කිරීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වීම හේතුවෙන් එම ඉඩමෙහි දැනටමත් අනවසරයෙන් පවුල් කිහිපයක් පදිංචි වී තිබුණි. කෙසේ වෙතත්, වසර 41 ක් තිස්සේ මෙම ඉඩමේ හිමිකාරීත්වය ආරක්ෂා කර ගැනීමට මණ්ඩලයේ නීති නිලධාරීන් දෙදෙනාගේ කිසිදු ක්‍රියාකාරී මැදිහත්වීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.ඒ වෙනුවට මෙම කරුණ මෙහෙයවීමට සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,472,875ක වියදමක් දරා බාහිර නීතිඥයෙකු ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, 2022 ජූලි අවසානය වන විටත් එහි සිටින පදිංචිකරුවන් ඉවත් කර ඉඩමේ හිමිකාරීත්වය තහවුරු කර ගැනීමට මණ්ඩලය අසමත් වී තිබුණි.තවද, දෙහිවල ජලාශය දිගු කිරීම සඳහා ලබා ගන්නා ලද තවත් ඉඩමක් සඳහා 1981 දී භුක්තියේ හිමිකම ලැබීමත් ඉඩම සුරක්ෂිත කිරීමට පියවර ගැනීමට කළමනාකාරීත්වය අසමත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි අනවසර පදිංචිකරුවන් 08 දෙනෙකු පදිංචි වී තිබුණි. | කළුතර ඉඩම<br>----------------<br>මානව සම්පත් අංශය මඟින් බාහිර නීතිඥයකු බඳවා ගෙන ඇති අතර මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.<br>දෙහිවල ඉඩම<br>-----------------<br>ක්‍රියාත්මක කිරීමේ ආඥාව ක්‍රියාත්මක වෙමින් පවතී. අනවසර පදිංචිකරුවන් ඉවත් කරන ලෙස ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් නිකුත් කර ඇත. | මණ්ඩලයේ වත්කම් වල හිමිකාරීත්වය ආරක්ෂා වී ඇති බව සහතික විය යුතු වීම. |
| vii. | බලංගොඩ ජල සම්පාදන ක්‍රමයට භූගත ජල ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කිසිදු තක්සේරුවක් ලබා නොගෙන 2013 වර්ෂයේදී මණ්ඩලය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණය කොමිෂන් සභාව වෙත ඔවුන් සතු ඉඩමක් ලබා ගැනීමට රු.1,675,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි.කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩමේ අයිතිය සඳහා පැවරීමේ සහතිකයක් හෝ සින්නක්කර ඔප්පුවක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද, ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් මණ්ඩලයට එරෙහිව අධිකරණ නඩුවක් ගොනු කර තිබුණි. කෙසේ නමුත් නීති ගැටළු විසඳීම සඳහා මණ්ඩලයේ නීති නිලධාරීන් දෙදෙනෙකු | ගැනුම් මිලෙන් කොටසක් ගෙවා ඇති අතර හිමිකම් ඔප්පුව නිකුත් කිරීම අපේක්ෂාවෙන් සිටී. කඩිනමින් ඔප්පුව නිකුත් කරන ලෙස මණ්ඩලය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් කිහිප වතාවක්ම ඉල්ලා සිටින ලදී. | නිසි ඔප්පුවක් හෝ පැවරුම් සහතිකයක් මඟින් මණ්ඩලයේ වත්කම් වල අයිතිය තහවුරු කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සේවයේ යෙදී සිටියදීත් මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටීම සඳහා බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන වලින් බාහිර නීතිඥයෙකුගේ සහය ලබා ගෙන තිබුණි. | | |
| viii. | මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරියකුගේ නිර්දේශය මත ගාල්ල ප්‍රදේශයේ අප ජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අප ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට 2014 අප්‍රේල් මසදී අත්තිකාරම් ලෙස තක්සේරු වටිනාකමෙන් සියයට 30ක් හෙවත් රු. මිලියන 21.45ක් මණ්ඩලය විසින් ඉඩම් අයිතිකරුවන්ගෙන් එක් අයෙකුට ගෙවා තිබුණි.අනතුරුව ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක් හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල අයකර ගැනීමට අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. තවද, ඉඩම විකිණීම සඳහා ඉඩම් හිමිකරුගේ කැමැත්ත අදාල ඔප්පුවේ දිනයට පෙර දිනයකදී ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. ඊට අමතරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පවුල් කිහිපයක් මෙම ඉඩමේ පදිංචි වී තිබූ බව නිරීක්ෂණය විය.කෙසේ නමුත් 2022 ජුලි 31 දින වන විටත් ඉඩම් හිමියාගෙන්, ගෙවන ලද අත්තිකාරම් හා ඒ මත දඩ මුදල් අය කර ගැනීමටත් මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිඳු පියවරක් ගැනීමටත් මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අත්තිකාරම් මුදල අය කර ගැනීමට අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. | මණ්ඩලයේ වත්කම් වල හිමිකාරීත්වය ආරක්ෂිත බවට තහවුරු කර ගත යුතු වීම හා ඉඩම් නිර්දේශ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| ix. | මණ්ඩලය විසින් වර්ෂය අවසාන වන විට ආදායම් නොලබන ජලය සියයට 23.09 දක්වා අඩු කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ සමස්ථ ආදායම් නොලබන ජල ප්‍රතිශතය මුළු නිෂ්පාදනයෙන් සියයට 25.82 ක් ලෙස සැලකේ. පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 1.19කින් ඉහළ ගොස් තිබුණි.කාන්දු වීම්, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා, නොමිලේ ජලය සැපයීම් සහ පරිපාලන අකාර්යක්ෂමතා යනාදිය හේතුවෙන් මණ්ඩලයට සැලකිය යුතු අලාභයක් සිදු වුවත් ආදායම් නොලබන ජල වටිනාකම වෙනම ගිණුම් තැබීම වෙනුවට සාමාන්‍ය පිරිවැයක් ලෙස ගිණුම් ගත කර තිබුණි.තවද, කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කිරීමේ අරමුණින් රු.මිලියන 59,767ක පිරිවැයක් දරා විශාල විදේශ මූල්‍යන ව්‍යාපෘති 03ක් ක්‍රියාත්මක කර තිබුණත් වර්ෂය අවසාන වන විට කොළඹ | පසුගිය වසර දෙක තුල පැවති කොවිඩ් - 19 වසංගත තත්වය ප්‍රගතියට බලපාන ලදී. තවද, එකී කාලච්ඡේදයේදී පැවතුණු කොවිඩ් වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා එක් එක් ප්‍රාදේශික සඳහා මණ්ඩලයේ වාර්ෂික මෙහෙයුම් අයවැයෙන් වෙන් කල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන වල ආ.නො.ජ ක්‍රියාකාරකම් සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ආදායම් නොලබන ජලය අඩු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීමටත් ඒ වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීමටත් ක්‍රියා මාර්ග ගත යුතු වීම. |

නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 34.75ක් වැනි ඉහලම ප්‍රතිශතයක් වාර්තා කර තිබුණි. කොළඹ දිස්ත්‍රික්කයට අමතරව දෙහිවල, නුවර උතුර, නුවර දකුණ , ගාල්ල වැනි අනෙකුත් ප්‍රාදේශික 04ක ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 30 ඉක්මවා වාර්තා කර තිබූ අතර කෝට්ටේ, කැළණිය, කළුතර, කෑගල්ල, මාතර, බණ්ඩාරවෙල සහ මොනරාගල යනාදී ප්‍රාදේශික 07ක ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 30ට වඩා අඩු නමුත් සියයට 25 ඉක්මවා තිබුණේ සමාලෝචිත වර්ෂයේදී ආදායම් නොලබන ජලය අඩු කිරීමට කැපී පෙනෙන උත්සාහයක් ගෙන නොතිබෙන බව පෙන්වමිනි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොගය (දේශීය ගැණුම්) හා ආනයනික මාර්ගස්ථ තොගය පිළිවෙලින් රු. 61,113,682 ක් හා රු. 2,224,233,337 ක් විය. එම තොග වටිනාකමෙන් රු. 454,921,682 ක් වූ තොග වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ කිසිදු විමර්ශනයකින් තොරව පැවතුනි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෙළඳ තොග කිසිවක් නොමැත. පරිභෝජනයට අදාලව තොග පවත්වාගෙන යන අතර අවශ්‍යතාවය මත පදනම්ව ඒවා උපයෝජනය කරනු ලැබේ. | දිගු කාලීනව පවතින මාර්ගස්ථ තොග ශේෂයන් විමර්ශනය කිරීමට ක්‍රියාමාර්ගත යුතු වීම හා මූල්‍ය ප්‍රකාශන වල මාර්ගස්ථ තොග හඳුනාගැනීමේ නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |
| ii. බණ්ඩාරවෙල, මොනරාගල, මාතර හා ගාල්ල යන ප්‍රාදේශික වල වෙළඳ ණය හිමියන් තුළ වූ රු. 149,109,651 ක් වූ අසාමාන්‍ය හර ශේෂය නිරවුල් කිරීමට හෝ විමර්ෂනය කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ගිණුම්වල පැවතුනි. එම ශේෂයෙන් රු.17,482,910ක ශේෂයක් බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ 2015 හා 2016 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි. | බණ්ඩාරවෙල<br>-----------------<br>එම ශේෂයන් නිරවුල් කිරීමේ ක්‍රියාවලියේ සිටින්නෙමු.<br><br>ගාල්ල ප්‍රාදේශිකය<br>-----------------------<br>කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ණය හිමි ගිණුම් තැබීමේ යම් ප්‍රමාදයක් ඇති විය. කෙසේවෙතත්,මේ වන විට ඒවා නිවැරදි කර ඇති අතර ගාල්ල ප්‍රාදේශිකයේ ණය හිමි | වෙළඳ ණය හිමි ශේෂයන් තුළ ඇති දිගු කාලීන අසාමාන්‍ය හර ශේෂයන් විමර්ශනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ශේෂය 2022.06.30 දිනට පවතින්නේ අසාමාන්‍ය හර ශේෂයක් නොවේ. | |
| iii. | පානදුර ප්‍රාදේශිකයට අදාලව නව සම්බන්ධතා ණය ගැති ශේෂය තුල පැවති රු.5,545,062ක අසාමාන්‍ය බැර ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශනය කොට හා නිරවුල් කොට නොතිබුණි. | 2022 වර්ෂයේදී වාණිජ අංශයේ සහාය ලබා ගෙන මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබේ. | නව සම්බන්ධතා ණය ගැති ශේෂයන් තුල පවතින දිගු කාලීන අසාමාන්‍ය බැර ශේෂයන් විමර්ශනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| iv. | ඌව ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ මාර්ගස්ථ මුදල් ශේෂය තුල පැවති රු.858,379ක අසාමාන්‍ය බැර ශේෂය වසර අවසානය වන විටත් විමර්ෂනය කිරීමකින් හා නිරවුල් කිරීමකින් තොරව පැවතුනි. | 2022 ජනවාරි මසදී මෙම වටිනාකම සඳහා නොගෙවූ වවුචරයක් සකස් කර ඇත. වර්තමානයේ මෙම ගිණුම තුල ශේෂයක් නොමැත. | මාර්ගස්ථ මුදල් ශේෂය තුල පවතින අසාමාන්‍ය බැර ශේෂයන් විමර්ශනය කිරීම සඳහා ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| v. | ව්‍යාපෘති අටකට අදාලව (00/0/07/242/0 හා 00/0/05/242/0) කොන්ත්‍රාත් අත්තිකාරම් ශේෂය තුල වන රු.1,202,772ක අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ශනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වන විට පවතින බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේදී මෙය නිවැරදි කරනු ලැබේ. | කොන්ත්‍රාත් අත්තිකාරම් තුල පවතින දිගු කාලීන අසාමාන්‍ය බැර ශේෂයන් විමර්ෂනය කිරීමට ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| vi. | අම්පාර කළමනාකරු කාර්යාලයේ වාහන ලයිස්තුවට ඇතුලත් නොවූ වාහන 08ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.480,000ක් වන ඉන්ධන අග්‍රිම නිදහස් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | හිමිකාරීත්වය ඇති වාහන සඳහා පමණක් ඉන්ධන අග්‍රිම නිදහස් කරන බවට තහවුරු කර ගත යුතු වීම. |

**3.4 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ලබා දෙන ලද රු.මිලියන 983.5 ක සමස්ථ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට උපයෝජනය කර තිබුණේ රු.මිලියන 441.97ක් පමණි. කෙසේ වෙතත් නිදන්ගත වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ වල ජලයෙන් බෝ වන රෝග වැලැක්වීම සඳහා සහ ත්‍රිකුණාමලය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා ලැබුණු රු.මිලියන 227.0ක් හා රු.මිලියන 79.39ක් වන අරමුදල් වලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පිලිවෙලින් රු.මිලියන 222.9ක් හා රු.මිලියන 75.86ක් පමණක් උපයෝජනය කර තිබුණි. | කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් වැඩ බිම් වල ශ්‍රමිකයන් හිඟ වීම, අමුද්‍රව්‍ය සැපයීම ප්‍රමාද වීම් වැනි සාධක හේතුවෙන් අපේක්ෂිත අරමුදල් උපයෝජනය සැපිරීමට නොහැකි විය. | ව්‍යාපෘති සඳහා ලැබෙන අරමුදල් සම්පූර්ණයෙන් උපයෝජනය කරන බව සහතික විය යුතු වීම. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | අම්පාර, මොණරාගල හා මඩකලපුව ප්‍රදේශ සඳහා ජල සැපයුම් ලබා දීම සඳහා අම්පාර ජල සම්පාදන (අදියර III) ව්‍යාපෘතිය රු.මිලියන 20,825 ක ඇස්තමේන්තු වටිනාකමකට 2010 නොවැම්බර් මස ආරම්භ කර 2015 දෙසැම්බර් නිම කළ යුතුව තිබුණි. ව්‍යාපෘතියේ සංරචක II යටතේ 2014 අගෝස්තු හා 2015 මාර්තු නිම කිරීමේ සැලසුම් සහිතව ජල කුළුණු 06ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර 2013 ජනවාරි සහ මාර්තු කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. කෙසේ නමුත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 අගෝස්තු 24 දින එය අවලංගු කර තිබුණි. ඒ අනුව රු.30,351,710ක පිරිවැයක් දරා අඩක් නිම කළ ජල කුළුණු 06 හා රු.15,790,210ක් වටිනා ඩීඅයි නල හා උපාංග 2022 පෙබරවාරි අවසානය වන විටත් නිශ්කාර්යව පැවතුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ අරමුණු නිසි කලට ලඟා කර ගැනීමට නොහැකිව පැවතුනි. | මෙම වැඩබිම් 06 දිගු කාලයක් තිස්සේ දුර්වල කාර්යසාධනයක් පෙන්වූ බැවින් හා කොන්ත්‍රාත්කරු ලබා දී ඇති කාලයට ඉලක්ක ලඟා කර ගැනීමට අපොහොසත් වූ බැවින් මෙම කොන්ත්‍රාත්තු අවලංගු කරන ලදී. ඉහත ජල කුළුණු වල ඉතිරි වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවට 2021 මාර්තු 10 දින නව කොන්ත්‍රාත් ලෙස ලංසු කැඳවා ඇති අතර රටේ වත්මන් ආර්ථික තත්වය හේතුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ පිරිනැමීම අපේක්ෂාවෙන් සිටී. තවද, ඍජු පොම්ප කිරීම නිසා පීඩනය වැඩි වීම හේතුවෙන් නිතර පුපුරා යාම්, ආදායම් නොලබන ජලය ඉහළ යාම් ආදී නිසා මෙහෙයුම් හා නඩත්තු අංශය නොයෙකුත් අපහසුතා වලට මුහුණ දේ. එබැවින් මෙම ජල කුළුණු 06 ඉදි කිරීම වැදගත් වේ. | ව්‍යාපෘතියේ අරමුණු සඵලදායීව ඉටු කර ගැනීම සඳහා අඩක් ඉදි කල ජල කුළුණු හා ඩීඅයි නල හා උපාංග භාවිතයට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතු වීම. |
| ii. | දමන ජල සම්පාදන ක්‍රමය, ඉරක්කමන් ජල සම්පාදන ක්‍රමය, සාගම්ම ජල සම්පාදන ක්‍රමය හා මඳන ජල සම්පාදන ක්‍රමයෙහි රු.33,148,739 ක පිරිවැයක් දරා ඉදිකර තිබූ නිල නිවාස 13ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිෂ්කාර්යව පැවතුනි. තවද අක්කරෙයිපත්තුව හා අම්පාර කළමණාකරු කාර්යාල හා කොන්ඩුවට්ටුවාන ජල සම්පාදන ක්‍රමයට අදාලව නිල නිවාස 91ක කිසිඳු නිලධාරියෙකු පදිංචි වී නොසිටි අතර විගණන පරීක්ෂාව සිදු කරන ලද 2022 ජනවාරි 28 දින වන විට නිශ්කාර්යව පැවතුනි. | නිල නිවාස ඉල්ලුම් කල විට ඒවා වෙන් කරනු ලැබේ. | නිල නිවාස පූර්ණ උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iii. | ඉගිනියාගල හා වඩිනාගල ජල සම්පාදන යෝජනා ක්‍රමයට සහ දමන ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාළ පිළිවෙලින් රු.5,585,337 | සටහන් කර ගන්නා ලදී. | අත්හරින ලද ජල සම්පාදන ක්‍රමයන්වල නිශ්කාර්යව පවතින |

| | | | |
|---|---|---|---|
| | ක් සහ රු. 84,235,632 ක් වටිනා සියලුම ඉදිකිරීම්, බෙදාහැරීමේ මාර්ග පරගහකැලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය සහ හිඟුරාන ජල සම්පාදන යෝජනා ක්‍රමය දක්වා වෙනස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී අක්‍රියව පැවතුණි. | | ඉදිකිරීම් සඳහා විකල්ප භාවිතයන් සෙවීමට ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| iv. | ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දුන් ණය සඳහා සහන කාලයෙන් පසුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 37.5 ක් වන ණය වාරික පහක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එදිනට චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය මුදලින් රු.මිලියන 11,828.23 ට සමාන එක්සත් ජනපද ඩොලර් 58,267,381.31 ක මුදලක් හෙවත් ණය මුදලින් සියයට 30 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකර එස්ක්‍රෝ ගිණුමේ රඳවා ගෙන තිබුණි. | සීඩීබී බැංකුව ණය ගිවිසුමට ප්‍රතිව්‍යුහගත කිරීමට එකඟ නොවූ නමුත් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලබා නොගත් ශේෂ අවශ්‍ය බැවින් එය එස්ක්‍රෝ ගිණුමක තැන්පත් කර ඇත. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ ගිවිසුමගත කාල සීමාවට හා මූල්‍ය ගිවිසුම් වලට පෙර ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| v. | ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් නොකර අක්කරෙයිපත්තු වැඩභාර නිලධාරී කාර්යාලයේ තිබූ කිලෝවොට් ඇම්පියර් 800 ක ධාරිතාවයකින් යුත් විදුලි ජනක යන්ත්‍රය 2019 ජූලි 08 වන දින ඇස්තමේන්තුගත අලුත්වැඩියා පිරිවැය රු.10,466,352 කට එහි සැපයුම්කරු වෙත භාර දී තිබුණි. පසුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලැබූ තීරණය මත අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 16 වන දින රු.9,960,575 ක කොන්ත්‍රාත් මුදලකට වෙනත් ලංසුකරුවෙකුට නැවත ප්‍රදානය කොට තිබුණි. අනතුරුව මුල් කොන්ත්‍රාත් මිලෙන් නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් මිල රු.12,625,465 ක් සඳහා හෙවත් සියයට 27කින් සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, මුල් සැපයුම්කරු විසින් ප්‍රවාහනය සහ පරීක්ෂා කිරීම සඳහා රු.195,975 ක මුදලක් වැය කර තිබුණද, 2022 ජනවාරි මස අවසානය වන විට විදුලි ජනක යන්ත්‍රය නිෂ්කාර්යයව වසර 2 1/2 ක් ගතවී ඇතත් එය අලුත්වැඩියා කිරීමට කළමනාකාරීත්වය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නිශ්ක්‍රීය වත්කම් ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| vi. | කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතියේ අරමුදල්වලින් රු. මිලියන 22.3ක් වැය කරමින් බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ භාවිතය සඳහා 2018 වර්ෂය තුළ කැණීම් යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, එය 2021 දෙසැම්බර් වන විටත් පැය 60.5ක් පමණක් භාවිත කර තිබූ අතර 2021 අප්‍රේල් 28 දින සිට (බටහිර නිෂ්පාදන) ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| vii. | පොතුවිල් වැඩභාර නිලධාරී කාර්යාලයේ තබා තිබූ රු. මිලියන 10ක් වටිනා බූබල් කැමරා පද්ධතියක් 2017 ජූලි 03 දින අක්කරෙයිපත්තු කළමණාකාර කාර්යාලයට යවා තිබුණි. කෙසේවෙතත්, 2022 ජනවාරි මාසය අවසන් වන විටත් එය අලුත්වැඩියා කර නොතිබුණි. | එය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | -එම- |
| viii. | පොතුවිල් වැඩභාර නිලධාරී කාර්යාලයේ රු.මිලියන 4ක් වටිනා රොන් මඩ ගබඩා කිරීමේ ප්‍රදේශය හා රොන් මඩ ආරක්ෂිත ටැංකිය 2007 වසරේ සිට නිශ්කාර්යව පැවතුනි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| ix. | ඇමරිකානු එක්සත් ජනපද ආධාර ලෙස ලැබුණු පොතුවිල් උල්ල ජල පවිත්‍රාගාරයේ පැවති රු. මිලියන 8ක් වටිනා ජල පවිත්‍රාගාර ඒකකය (පෙරහන් මාධ්‍ය තැන්පත් කළ) මලබැඳීම හේතුවෙන් හානි වී තිබුණි. තවද ඝන මීටර් 5600ක ධාරිතාවයකින් යුතු ජල පවිත්‍රාගාරයෙන් 2022 ජනවාරි අවසන් වන විටත් උපයෝජනය කර තිබුනේ ඝන මීටර් 1300ක් හෙවත් සියයට 23ක් පමණි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| x. | වසර අවසාන වන විට මණ්ඩලයේ ගබඩා වල පැවති චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග වටිනාකම් පිළිවෙලින් රු.632,408,899ක් හා රු.683,130,578ක් වූ අතර එය මණ්ඩලයේ මුළු තොග වටිනාකමෙන් සියයට 6ක් හා සියයට 8ක් නියෝජනය කරයි. | චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග ලෙස වර්ග කර තිබුණද ඒවා මණ්ඩලයේ අවශ්‍යතාවය සඳහා භාවිතා කරනු ලැබේ. | චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග ඇතිවීම වැලැක්වීම සඳහා තොග පාලන මට්ටම් සැලකිල්ලට ගනිමින් අනාගතයේදී තොග අයිතම ඇණවුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | කොන්ත්‍රාත්කරුවන්ගේ දූර්වල කාර්යසාධනය ,ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය ,පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදය ආදිය හේතුවෙන් විදේශ මූල්‍යාන ව්‍යාපෘති දහසයකට සහ දේශීය මූල්‍යාන ව්‍යාපෘති හයකට අදාලව අවස්ථා 01 සිට 09 දක්වා පරාසයක කාල දිගුවන් ලබා දීමෙන් පසුවද, දින 184 සිට දින 1779 දක්වා කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය. | මෙම ප්‍රමාදයන් සඳහා හේතු වී ඇත්තේ ජල මූලාශ්‍රය සම්බන්ධයෙන් ගොවි විරෝධතා, කොවිඩ්-19 වසංගතය, ඉදිකිරීම් සඳහා රජය විසින් පනවා ඇති සීමාවන්, ණය ශ්‍රේණිගත කිරීම පහල දැමීම, සහ අන්තර් කාලීන බිල්පත් ගෙවීම් අත්හිටුවීම, ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු, උපයෝගිතා මාරු කිරීම, බාහිර ආයතනවලින් අදාළ අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය අර්බුදය, අයහපත් කාලගුණික තත්ත්වය, මූල්‍ය ප්‍රතිපාදන හිඟය, ප්‍රසම්පාදන ප්‍රමාදයන් (කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාදය), වත්මන් ආර්ථික අර්බුදය, ආනයන සීමා කිරීම්, උප කොන්ත්‍රාත්කරුවන් පත්කිරීමේ ප්‍රමාදය යනාදිය මෙම ප්‍රමාදයන්ට හේතු විය. | • ව්‍යාපෘති ප්‍රමාදයන් වැලැක්වීමට සහ එමගින් කොන්ත්‍රාත්කරුවන්ට කාල දිගුවන් ලබා දීම වළක්වා ගැනීමටත්, කොන්ත්‍රාත්කරුවෙකුට දිගුවක් ලබා දී ඇති අවස්ථාවක කොන්ත්‍රාත් ගිවිසුමෙ විධිවිධාන අනුව ප්‍රමාද ගාස්තු අඩු කිරීම සහතික වීමටත් ක්‍රියා මාර්ග ගත යුතු වීම.<br>• ක්‍රියාත්මක කිරීමේදී මණ්ඩලීය කාර්ය මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සමීපව අධීක්ෂණය කල යුතු වීම. |
| ii. | රත්නපුර රෝහලේ ජල පවිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා අවශ්‍ය අරමුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2015 සහ 2016 වර්ෂයන්හිදී ලබා දී තිබුණද, එය වසර 3ක ප්‍රමාදයකින් පසුව 2018 ඔක්තෝම්බර් 17 වැනි දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දූර්වල කාර්ය සාධනය හේතුවෙන්, 2021 නොවැම්බර් අවසානය වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. තවද, අත්තිකාරම් බැඳුම්කරයේ වලංගු කාලය ඉක්මවන තුරු වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව පැවතුනි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| iii. | විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව ඉරක්කාමන්, අක්කරෙයිපත්තු සහ පොතුවිල් ජල සම්පාදන යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මක කරන ලද පිරිවැය | අදහස් දක්වා නොතිබුණි. | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු. 4,528,678 ක් වන යලි අයකරගැනීමේ ව්‍යාපෘති හතරක් සම්බන්ධයෙන් ව්‍යාපෘති නිම කිරීමේ දී වසර 1 සිට වසර 5 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | | |
| iv. | සයිදමරුදූ වැඩභාර නිලධාරී කාර්යාලය සහ සහකාර සාමාන්‍යාධිකාරී කාර්යාලය (නැගෙනහිර) පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුවන් එකතු වටිනාකම රු.මිලියන 15.85 ක කොන්ත්‍රාත්තු වටිනාකමක් සහිතව පිළිවෙළින් 2021 දෙසැම්බර් සහ 2021 නොවැම්බර් මාසයේ දී නිම කිරීමට නියමිත දිනයන් සහිතව ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත්, 2021 ජනවාරි 25 දින සිදු කරන ලද භෞතික විගණනයට අනුව අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර නොමැති බවත් පිළිවෙළින් රු.1,531,942 ක් වටිනා කොන්ත්‍රාත් ක්‍රියාකාරකම් 08 ක් සහ රු. 11,146,120 ක් වටිනා කොන්ත්‍රාත් ක්‍රියාකාරකම් 26 ක් සම්බන්ධයෙන් කිසිදු භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| v. | සගම්ම භූගත ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 7.04 ක කොන්ත්‍රාත් මුදලකට දින 63 කින් සම්පූර්ණ කිරීමේ කාල සීමාවක් සහිතව 2021 ජූලි 14 වන දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්,ප්‍රතිග්‍රහණ ලිපියෙන් දින 14ක් ඇතුළත කොන්ත්‍රාත්තුවේ කටයුතු ආරම්භ කළ යුතු වුවද 2021 සැප්තැම්බර් 03 දිනට දින 38ක් ගතවී ඇතත් කොන්ත්‍රාත්කරු ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි. තවද, ප්‍රතිගහණ ලිපියෙන් දින 14ක් ඇතුළත කාර්ය සාධන බැඳුම්කරය ඉදිරිපත් කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී ඇති අතර ඒ වෙනුවට එය ඉදිරිපත් කර ඇත්තේ සම්පූර්ණ කිරීමට නියමිතව තිබූ කාල සීමාවෙන් මාස තුනකට පසුවය. තවද, 2022 ජනවාරි මස අවසන් වන විටත් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තු කටයුතු සම්පූර්ණ කිරීමට අපොහොසත්ව පැවති අතර 2022 ජනවාරි 28 වන විටත් භෞතික ප්‍රගතිය සියයට 7 කට පමණක් සීමා වී තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | -එම- |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. කළුතර අල්විස් පෙදෙසේ භූගත ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා එකම ප්‍රමාණපත්‍ර අයිතම වෙනුවෙන් අවස්ථා දෙකකදී සකස් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තු දෙක අතර සියයට 18.3 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තු සකස්කිරීමේ විශ්වසවන්තභාවය සැකසහිත වේ. තවද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණි. ඊට අමතරව කොන්ත්‍රාත්තුවේ විෂය පථය නිසියාකාරව හඳුනා නොගැනීම හේතුවෙන් විචල්‍යතා නියෝග සඳහා රු. 3,736,057ක අතිරේක ගෙවීම් සිදු කර තිබුණි. තවද, ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් 15 වන දින ප්‍රදානය කර තිබූ අතර මාස තුනක් ඇතුළත අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2021 ඔක්තෝබර් 20 වන විටත් අපේක්ෂා කළ පරිදි කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මණ්ඩලය විසින් කාලදිගුවන් දෙකක් ලබා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය විසින් ලබා දී තිබූ රු. මිලියන 14.8 ක අත්තිකාරම් මුදලින් 2021 ජූලි 31 වන විටත් රු. මිලියන 3.8 ට සමාන මුදලක් පමණක් අය කර ගෙන තිබුණි. | මෙම නිශ්චිත කාර්යයේ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් රේටයන් සංශෝධනය කරන ලදී.ඉංජිනේරු ඇස්තමේන්තුව නැවත සලකා බැලීමේ තීරණය 2020 ජනවාරි 28 දින ලැබී ඇති අතර කොන්ත්‍රාත්තුව 2020 සැප්තැම්බර් 15 දින ප්‍රදානය කරන ලදී. තවද ප්‍රසම්පාදන ප්‍රමාදයට කොවිඩ් 19 ද බලපාන ලදී. මෙය මැදිරි 2 කින් සමන්විත මීටර් 6,800 ක ධාරිතාවයකින් යුත් ජලාශයක් වන අතර සීමිත කාල රාමුවක් තුළ සවිස්තරාත්මක විමර්ශනයක් සිදු කිරීම ඉතා අපහසු වේ. ප්‍රායෝගික බාධාවන් සමඟ, අධි පීඩන ජල ජෙට් මගින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිරිසිදු කිරීමේදී අනපේක්ෂිත දෝෂ ඇතිවිය හැකිය. | • ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වීම.<br>• කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර, සවිස්තරාත්මක විමර්ශනයක් මගින් කාර්යයේ විෂය පථය හඳුනාගත යුතු වීම.<br>• ලංසු දැන්වීම් පළ කිරීමට පෙර වඩාත් විශ්වාසදායක ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |
| ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 වගන්තියට අනුව, ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර සහ වන්දි, උපයෝගිතා නැවත ස්ථානගත කිරීම ඇතුළුව නැවත පදිංචි කිරීමේ ගැටළු සහ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් කරුණු සම්පූර්ණ කර ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්විය යුතුව තිබුණි. කෙසේ වෙතත්, ගම්පහ අත්තනගල්ල සහ මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය සඳහා නැවත පදිංචි කිරීම් සහ ජල කුළුණු ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම් අත්පත් කර ගැනීම, ලබා දී ඇති 2 වැනි කාල දිගුවේ කාලය ඉකුත් වී ඇතත් සම්පූර්ණ කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අරමුදල් අවසාන වශයෙන් 2020 පෙබරවාරි මාසයේදී අනුමත කරන ලදී. බලපෑමට ලක් වූ පවුල්වල දුක්ගැනවිලි, රාජකීය කොටස් හිමිකම් නිදහස් කිරීම ප්‍රමාද වීම මෙන්ම කොවිඩ් 19 හේතුවෙන් එය තවමත් ප්‍රමාදයක් සහිතව අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර වර්තමාන ඉදිකිරීම් ද්‍රව්‍යවල වේගවත් වර්ධනය හේතුවෙන් එය තවදුරටත් ප්‍රමාද විය හැකිය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. |

| | | |
|---|---|---|
| iii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.3.3(ආ) වගන්තියට පටහැනිව, කාර්තිව් වැඩභාර නිලධාරී කාර්යාලය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු විවෘත කිරීමට දින 48ක කාලයක් ගත කර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.8.6 වගන්තියට පටහැනිව සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |
| iv. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 වගන්තියට පටහැනිව, වලංගු ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව 2021 ජනවාරි 01 දින සිට 2021 ජුනි 30 දක්වා රුපියල් 1,417,515 ක මුදලක් ගාල්ල කළමනාකාර කාර්යාලය සෘජුවම සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි. එසේම ඒ අතරින් අවස්ථා 6කදී නිදහස් කරන ලද රු. 223,000 කට සමාන මුදලක් 2021 ජුනි 30 වන විටත් අදාළ සැපයුම්කරු විසින් පියවා නොතිබුණි. | මෑත කාලීන කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම සහ කාර්යාලයට වාර්තා කිරීම අඩු කිරීම හේතුවෙන් ඇති වූ ප්‍රමාදයක් නිසා ඉහත ප්‍රමාණය පසුව නිරවුල් කරන ලදී. අත්තිකාරම් දැන් සම්පූර්ණයෙන්ම පියවා ඇත. | -එම- |

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **3.8.1 කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1)** | | |
| ව්‍යාපෘතිය එහි කටයුතු 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ කල අතර 2025 අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට නියමිතය. කළුගඟ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම සහ ජලය බෙදාහැරීමේ ජාල ප්‍රතිව්‍යුහගත කිරීම මගින් බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ සුරක්ෂිත ජලය සැපයීම සහ ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් එමගින් එහි ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට දායකවීමත් ව්‍යාපෘතියේ අරමුණ වේ. ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් පැකේජ දහයකින් සහ එක් උපදේශන සේවා පැකේජයකින් ව්‍යාපෘතිය සමන්විත වේ. කොන්ත්‍රාත්තු දහයෙන්, ව්‍යාපෘතිය-1 හි කොන්ත්‍රාත් පහේ සවිස්තරාත්මක සැලසුම් සහ ඉදිකිරීම් කටයුතුද ව්‍යාපෘතිය -2 හි ඉතිරි කොන්ත්‍රාත් පැකේජ පහ සම්බන්ධයෙන් පමණක් | මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකා රජය අතුරු ණය ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාගශීලීන්ගේ මුදල් ලබා ගැනීම වැළැක්විය. එබැවින් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇනහිටිණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ වේ. | කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

විස්තරාත්මක සැලසුම් කිරීමේ කටයුතු ද ව්‍යාපෘතිය යටතේ නිම කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, උපදේශන කොන්ත්‍රාත්තුව පමණක් ප්‍රදානය කර සවිස්තරාත්මක සැලසුම් ආරම්භ කර ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහාය ලබා දී තිබුණි. එබැවින් 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

**<u>3.8.2 කැළණි දකුණු ඉවුර ජලසම්පාදන ව්‍යාපෘතිය (අදියර 02)</u>**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| i. | ව්‍යාපෘතියේ කටයුතු 2020 ජනවාරි 23 දිනට නිම කිරීමට නියමිතව 2017 ජනවාරි 23 දින ආරම්භ කොට තිබුණි. කෙසේ වෙතත් එය 2020 නොවැම්බර් 07 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, කැලණි ගඟේ ජලයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම යටතේ බියගම අපනයන කලාපයේ පිරිපහදු කළ අපජලය, ජල තුළුමුවට පහළින් කැළණි ගඟට මුදා හැරීම ව්‍යාපෘතියේ මූලික අරමුණුවලින් එකක් විය. කෙසේ වෙතත්, 2022 ජනවාරි මාසය අවසන් වන විටත් කාර්ය නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | මහජන විරෝධතා හේතුවෙන් ගඟ පිටාර ගැලීමේ ස්ථානය දෙවරක් වෙනස් කර තවදුරටත් ගඟෙන් පහළට (තල්වත්ත ඇලෙහි පිටවාන දක්වා) විතැන් කොට බියගම ප්‍රාදේශීය සභාවේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ගත් තීරණය අනුව සමථයකට පත් කිරීමට සිදු විය. | කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| ii. | මණ්ඩලය විසින් ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේ නොසැලකිලිමත්කම සහ නිසි සැලසුමක් සහ අධීක්ෂණයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට දේශීය අරමුදල්වලින් රු. 80,848,773 ක අමතර වියදමක් ද තාවකාලික ගබඩාවලින් පයිප්ප සහ උපාංග නැවත ගබඩා කිරීම සඳහා විචලා නියෝගයක් යටතේ රු. 15,803,377ක්ද දැරීමට සිදු ව තිබුණි. | මණ්ඩලය සතුව නිසි ගබඩා පහසුකම් නොතිබූ බැවින් ගබඩා ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියේ දේශීය අරමුදල් යොදා ගැනීමට තීරණය කරන ලදී. එහෙත් පයිප්ප පැමිණීමේ කාලය වන විටත් ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් ජා.ස.ම.ඛ.උ හට ගබඩා ඉදිකිරීම සම්පූර්ණ කිරීමට නොහැකි විය. එබැවින් ලැබුණු නල, බහාලුම්වල ගබඩා කර නව ස්ථාන වෙත මාරු කර අදාළ ප්‍රවාහන / බෑමේ පිරිවැය කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත. | ප්‍රසම්පාදනය කිරීමට පෙර පයිප්ප සහ උපාංග ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩක් ඇති බවට සහතික විය යුතු වීම. |
| iii. | ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව ව්‍යාපෘති ඉතුරුම්වලින් මණ්ඩලයේ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන සඳහා උපකරණ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ රු. 27,054,000 ක මුදලක් වැය කර තිබූ බව නිරීක්ෂණය විය. | ඉහත මුදල නව සම්බන්ධතා වල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු පහසු කිරීම සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ගෙවීම සඳහා ව්‍යාපෘතියේ පවතින අරමුදල්වලින් භාවිතා කරන ලදී. | ව්‍යාපෘතියේ අරමුදල් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොදා නොගන්නා බවට සහතික විය යුතු වීම. |

**<u>3.8.3 නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය</u>**

මීගමුව මහනගර සභා බල ප්‍රදේශයේ 73,000 ක ජනතාවකට අපජල එකතු කිරීමේ හා පිරිපහදු කිරීමේ පද්ධති ව්‍යාප්ත කිරීම සහ සනීපාරක්ෂක සේවා සඳහා ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම, ජල සහ සනීපාරක්ෂක අංශයේ ව්‍යුහය වැඩිදියුණු කිරීම, දරිද්‍රතාවයට පිටු දැකීම සඳහා අවැසි දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මගින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සැලසීම , වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂාව සහ ජෛව විවිධත්වය නඩත්තුව සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීමට ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය 2016 ජුනි 01 දින සිය කටයුතු ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිතව ඇත.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| i. | ප්‍රතිපත්ති හා ආයතනික වැඩදියුණුකිරීමේ උපදේශන කොන්ත්‍රාත්තුව විසින් **2020** වර්ෂයේදී මණ්ඩලයේ ගිණුම්කරණ පද්ධතිය වර්ධනය කිරීමට ඩිලිවරබල් **3,** ඩිලිවරබල් **4,** ඩිලිවරබල් **5** ලෙසත් මණ්ඩලයේ මලාපවහන කළමණාකරණ කුසලතා වර්ධනය කිරීමට ඩිලිවරබල් **7** හා ඩිලිවරබල් **8** ලෙසත් රු.මිලියන **54**,667,356 ක් වැය කර වාර්තා ඉදිරිපත් කර තිබුණි**.** කෙසේ වුවද, එම වාර්තාවල අඩංගු නිර්දේශ මණ්ඩලය විසින් **2022** මැයි **25** වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි**.** | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මණ්ඩලයේ අදාළ අංශය සමඟ සම්බන්ධීකරණය කර ඩිලිවරබල් 3,4,5 ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දී ඇත. ඩිලිවරබල් **7** සහ 8 - ඩිලිවරබල්හි නිමවුම භාවිතා කර හා ඇතුලත් කර එස්එම්එස්ඩීසී පැකේජ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ඩිලිවරබල් 7,8 හි ප්‍රතිඵලයන් , ජල පිළිසැකසුම් අංශයේ ධාරිතා සංවර්ධනය සඳහා භාවිතා කරනු ලැබේ. | උපදේශන කොන්ත්‍රාත්තුවල ප්‍රතිදානයන් ඵලදායී ලෙස භාවිතා කරන බවට සහතික විය යුතු වීම. |
| ii. | ප්‍රතිපත්ති සහ ආයතනික වැඩිදියුණු කිරීමේ උපදේශන කොන්ත්‍රාත්තුවේ ව්‍යාපෘති විෂය පථය අඩු කිරීමෙන් වන ඉතිරි කිරීම් භාවිතා කොට මණ්ඩලය සඳහා මානව සම්පත් උපදේශකයකු බඳවා ගැනීමට ව්‍යාපෘතිය විසින් විචලාතා නියෝග අංක 03 අනුමත කර තිබුණි. | විචලාතා කමිටු අනුමැතිය ඇතිව මාසයක් පමණක් විචලාතා නියෝගය ගෙවා ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘතියේ අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතා කරන බවට සහතික විය යුතු වීම. |

**<u>3.8.4 මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය</u>**

ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර 2017 සැප්තැම්බර් වන විට නිමකිරීමට නියමිතව තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| i. | ප්‍රධාන අපවහන ජාලය, ශාඛා අපවහන ජාලය සහ මනුබිල් පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ වූ කාර්යය සැලසුම් කිරීම ව්‍යාපෘතිය විසින් නිසි පරිදි පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කොන්ත්‍රාත්කරු විසින් රු. මිලියන 1,750 ක විචල්‍යතා නියෝග ඉදිරිපත් කර තිබූ අතර එයින් රු.මිලියන 52.12 ක් අතිරේක සැලසුම් පිරිවැයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය ගෙවා තිබුණි. | ඉදිකිරීම, ප්‍රමාදයන් සහ අමතර වියදම්වලට ලක් විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු රු. මිලියන 5,056 ක් ඉල්ලුම් කර තිබූ අතර සුපරීක්ෂාකාරී ඇගයීමකින් එය රු. මිලියන. 1,750 ක් දක්වා අඩු විය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර මනාව සැලසුම් කර ඇති බවටත් වගකිවයුතු නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් දඬ අය කර ඇති බවටත් සහතික විය යුතු වීම. |
| ii. | ව්‍යාපෘති විෂය පථයට ඇතුළත් නොවන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අපජල අපහරණ පිරියත ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියේ දැනට සිටින ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සේවයේ යොදවා ඇති අතර දේපල සම්බන්ධතා ලබාදීමේ කොන්ත්‍රාත්තුව යටතේ රු.මිලියන 13.02 ක් වැය කර ඇත. තවද, සමාලෝචිත වර්ෂය තුළ මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද මහනුවර අපජල පවිත්‍රාගාරය විවෘත කිරීමේ උත්සවය සඳහා රු. මිලියන 2.6 ක් වැය කර තිබුණි. | පේරාදෙණිය විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ පිරිපහදු පද්ධතියට සම්බන්ධ කිරීමට නියමිත බැවින් සහ ව්‍යාපෘති අත්දැකීම් සැලකිල්ලට ගනිමින්, තාක්ෂණික සහ වාණිජ අවශ්‍යතා වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා එම ව්‍යාපෘති කණ්ඩායමට මෙම ව්‍යාපෘතිය කළමනාකරණය කිරීමට අවසර දෙන ලදී. | ව්‍යාපෘතියේ අරමුදල් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොදා නොගන්නා බවට සහතික විය යුතු වීම. |

**<u>3.8.5 ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය</u>**

| | | | |
|---|---|---|---|
| i. | ව්‍යාපෘතිය 2017 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2020 පෙබරවාරි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව ණය දෙන ආයතනයට බැඳීම් ගාස්තුව ලෙස රජය රු. මිලියන 16.91ක් වැය කොට තිබුණි. | නලවල අමුද්‍රව්‍ය සහ එච්ඩීපීඊ වර්ණය පිළිබඳ සමථයකට පැමිණීමට ප්‍රමාද වීම, නල බහලුම් නිදහස් කර ගැනීමේ ප්‍රමාදය, තුළුමුව ස්ථානය වෙනස් කිරීම, ගෙවූ වැට් බදු, එන්බීටී,හානි ගෙවීම් ප්‍රතිපූරණය ප්‍රමාද වීම, කොවිඩ් වසංගත තත්ත්වය ආදිය හේතුවෙන් ව්‍යාපෘතිය දීර්ඝ කර ඇත. | ණය දෙන ආයතනය විසින් පනවනු ලබන බැඳීම් ගාස්තු වලක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| ii. | ෆිඩික් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක **19.4** ට පටහැනි ලෙස කොන්ත්‍රාත්කරු විසින් | බැඳුම්කර දීර්ඝ කිරීමේදී දරන ලද පිරිවැය (කාර්ය සාධන සහ | ෆිඩික් මාර්ගෝපදේශයෙහි විධිවිධානවලට අනුකූල වන |

| | | | |
|---|---|---|---|
| | දරා ගත යුතු, කොන්ත්රාත්කරුගේ දුර්වල කාර්යසාධනය මත සිදුකල දීර්ඝ කල කාල පරිච්ඡේදය සඳහාද රු. **3,010,929** ක් හා යුරෝ **330,183.98** ක් අතිරේක මූල්‍ය ගාස්තු ලෙස (බැඳුම්කර දීර්ඝ කිරීමට දැරූ පිරිවැය) මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | අත්තිකාරම් බැඳුම්කරය) සහ රක්ෂණ පමණක් විචල්‍යතා නියෝග හරහා ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදී | බවට සහතික විය යුතු වීම. |
| iii. | කොන්ත්‍රාත් ගිවිසුමේ 8.5.4 වගන්තියට අනුව කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියට වූ වීල් ඩබල් කැබ් රථ 6ක් ලබා දිය යුතු විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය අවසානයේ ලබා දී තිබුණේ ඩබල් කැබ් රථ තුනක සංඛ්‍යාවක් පමණි. එබැවින් ප්‍රමාණ බිල්පතෙහි වෙන් කර ඇති යුරෝ 3,365.70 ඉක්මවන රු. මිලියන 14.99 ක මුදල ව්‍යාපෘතියට වාහන කුලියට ගැනීමේදී දරා තිබූ අතර එය අනාර්ථික බවට පත්ව තිබුණි. | 2019 වසරේදී වාහනය ආනයනය කිරීමට අනුමැතිය ලැබී ඇති අතර කොන්ත්‍රාත්කරු 2020 වර්ෂය අවසානයේ වාහන 03 ක සංඛ්‍යාවක් ආනයනය කර ආනයනය සීමා කිරීම හේතුවෙන් නිෂ්කාශන ක්‍රියාවලියේ විශාල ප්‍රමාදයක් ඇතිව 2022 දෙසැම්බර් ව්‍යාපෘතියට භාර දෙන ලදී. එබැවින් ව්‍යාපෘති කටයුතු සඳහා ඩබල් කැබ් රථ මිලදී ගන්නා තෙක් වාහන කුලියට ගැනීමට සිදු විය. | කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වලට අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| | **3.8.6 මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිය**<br>පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | |
| i. | 2030 දී අපේක්ෂා කරන ජනගහනයෙන් 321,954 කට පානීය ජලය ලබා දීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එය 2017 ඔක්තෝබර් 11 දින සිට ආරම්භ කර තිබූ අතර 2020 ඔක්තෝබර් 10 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය, ඇදීම් අනුමත කිරීම ප්‍රමාද වීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය යනාදී හේතුවෙන් 2022 සැප්තැම්බර් 30 දක්වා අවස්ථා තුනකදී කාල දිගුවන් තුනක් ලබා දී තිබුණි. කෙසේවෙතත්, 2022 ජූලි අවසානය වන විටත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 92 ක් පමණක් විය. | ජල පිරිපහදු මධ්‍යස්ථානයේ ඉඩම් හිමියාට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය, ඇදීම් අනුමත කිරීම ප්‍රමාද වීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය යනාදී හේතූන් මත 2022 සැප්තැම්බර් 30 දක්වා අවස්ථා තුනකදී කාල දිගුවන් තුනක් ලබා දී තිබුණි. | • කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br>• ව්‍යාපෘතිය ආරම්භයට පෙර සියළු ඉඩම් අත්පත් කර ගෙන ඇති බවටත් සියළු නිර්මාණ චිත්‍ර අනුමත කර ඇති බවටත් සහතික විය යුතු වීම. |
| ii. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ලවණ බාධකය ඉදිකිරීම් කාලපරිච්ඡේදයේදී ගංවතුර හේතුවෙන් එම ප්‍රදේශවල කුඹුරුවලට දැඩි බලපෑම් එල්ල වී ඇති බවත් එම නිසා එම ඉදිකිරීමට ගොවීන් විරෝධය පළ කළ බවත් නිරීක්ෂණය විය. මෙම ගැටළුව විසඳීම සඳහා 2022 මාර්තු 10 වන දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු. 7,223,924.60 ක | ලවණ බාධකයක් ඉදිකිරීමේදී ඇති වූ අනපේක්ෂිත කාලගුණික තත්ත්වය හේතුවෙන් වූ ගංවතුර හේතුවෙන් එම ප්‍රදේශවල කුඹුරුවලට දැඩි බලපෑම් එල්ල වී ඇති අතර එම නිසා එම ඉදිකිරීමට ගොවිහු විරෝධය පළ කළහ. ගැටළුව විසඳීම සඳහා මණ්ඩලයට ඔවුන්ට වන්දි | අනාගතයේදී සිදුවිය හැකි පාරිසරික ආපදා හඳුනා ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සහ පාරිසරික ඇගයීම් නිසි ලෙස සිදු කරන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වන්දියක් ගෙවීමට මණ්ඩලයට සිදු වූ අතර 2022 ජූලි මස අවසානයේදී තවත් රු. 697,967 ක් මණ්ඩලය විසින් ගෙවිය යුතු විය. | ගෙවීමට සිදු විය. | |
| iii. | කොන්ත්‍රාත් ලේඛනයේ 10.එෆ් වගන්තියට අනුව කොන්ත්‍රාත්තුව බලාත්මක කිරීම සඳහා, කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් භූමියට ඇතුළුවීමට ඉඩ දිය යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.3.1 වගන්තියට අනුව ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම, උපයෝගිතා නැවත ස්ථානගත කිරීම සහ අනෙකුත් කරුණු ඇතුලත්ව නැවත පදිංචි කිරීමේ ගැටළු විසඳා ඇති බවට මණ්ඩලය සෑහීමකට පත් විය යුතු වේ. තවද පිඩික් මාර්ගෝපදේශයේ 11.7 වගන්තියට අනුව කාර්යසාධන බැඳුම්කරය ලබා ගැනීමෙන් පසුව කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් භූමියට ඇතුළුවීමට ඉඩ දිය යුතු වේ. කෙසේ වෙතත්, මාලිම්බඩ ඇතුළු ඉදිකිරීම් පරිශ්‍ර කිහිපයක් සහ තවත් ඉඩම් කිහිපයකට මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුට ඇතුළුවීමට අවසර දීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය.තවද, කරගොඩ, උයන්ගොඩ ප්‍රදේශයේ කොටසක එළීමේ කටයුතු සඳහා 2022 ජූලි මාසය අවසන් වන විටත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ජල පිරිපහදු මධ්‍යස්ථාන ඉඩමේ නීතිමය ක්‍රියාමාර්ග අවසන් වන තුරු සහ මාලිම්බඩ ජලාශ වැඩබිමේ සහ තවත් ඉඩම් කිහිපයක අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය මණ්ඩලය විසින් අවසන් කරන තුරු සමහර ඉදිකිරීම් පරිශ්‍රවලට ඇතුළුවීමට කොන්ත්‍රාත්කරුට අවසර දීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කටයුතු ආරම්භයට පෙර සියළු ඉඩම් අත්පත් කර ගෙන ඇති බවටත් සියළු නිර්මාණ චිත්‍ර අනුමත කර ඇති බවටත් සහතික විය යුතු වීම. |
| iv. | පිඩික් මාර්ගෝපදේශයේ 14.7(ආ) වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු අතුරු ගෙවීම් සහතිකය මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් දින 56ක් ඇතුළත ගෙවීම් කල යුතුවේ. කෙසේ වෙතත්, 2022 මාර්තු 31 වන දිනට 14 වන අතුරු ගෙවීම් සහතිකය කොන්ත්‍රාත්කරු වෙත පියවීමේදී දින 182 ක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. එබැවින් කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන අනුව කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාද ගාස්තු අයකිරීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක. | ජාතික සංවර්ධන බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් ගැටළුව මීට හේතු විය. | පිඩික් මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල වන බව සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| v. | මූලික සැලැස්ම සහ මිල ලේඛනයට අනුව කි.මී 200 ක බෙදාහැරීමේ නල එළීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2020 ජූලි 01 දින ලබා දුන් කාල දිගුව අනුව එය කි.මී 105 දක්වා හෙවත් සියයට 50 කින් අඩු කර තිබූ හෙයින් මුලින් සැලසුම් කළ පරිදි මුළු ප්‍රදේශයම ආවරණය කිරීමෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කරගත හැකිද යන්න අවිනිශ්චිත වේ. එසේ වුවද, ලබා දී ඇති දෙවන දිගුව අවසන් වීමෙන් පසුව 2022 ජූලි 31 වන දින වන විටත් එලා තිබුණේ සම්ප්‍රේෂණ මාර්ගයෙන් කිලෝමීටර් 58.3 ක් හෙවත් සියයට 83 ක් සහ බෙදාහැරීමේ මාර්ගයෙන් කිලෝමීටර් 101 ක් හෙවත් සියයට 96 ක් පමණි. එබැවින් අනෙකුත් සියලු ඉදිකිරීම් අවසන් වුවද නල සහ උපාංග එලීමේ ප්‍රමාදය හේතුවෙන් නියමිත කාලය අවසන් වීමෙන් පසු පානීය ජලය සැපයීමේ අවසාන අරමුණ සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත. | කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ලිපිය මගින් කොන්ත්‍රාත්තුවේ මුල් විෂය පථයේ සිට සැලසුම් වෙනස් කිරීම් හේතුවෙන් බෙදා හැරීමේ විෂය පථය අඩු කොට තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ අධීක්ෂණයක් සිදු වන බවට සහතික විය යුතු වීම. |
| vi. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මීරිස්වත්ත පොම්පාගාර පරිශ්‍රයේ නිල නිවාස ඉදිකිරීම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | නි.සා (දකුණ) ගේ ඉල්ලීම පරිදි වැඩබාර නිලධාරී කාර්යාල ගොඩනැගිලි දෙකක සැලසුම් වෙනස් කිරීම මෙයට හේතු වූ අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සැලසුම් වෙනස්වීම් සම්බන්ධ ගිවිසුම්මය ගැටලු විසඳී නොමැත. | කොන්ත්රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| vii. | ලංසු ලේඛනවල 8.3.1.3 වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියට වාහන 11 ක් ලබා දිය යුතු වේ. කෙසේ වෙතත් 2022 මැයි මාසය අවසන් වන විටත් ලබා දී තිබුණේ වාහන 04ක් පමණි. | ඩබල් කැබ් රථ 07 න් ඩබල් කැබ් රථ 03 ක් ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය, සැලසුම් සහ නිර්මාණ අංශය සහ ප්‍රා.සේ.ම (දකුණ) වෙත මාරු කරන ලදී. | කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වලට අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| viii. | මාතර අදියර (iv) ව්‍යාපෘතියට අදාළව මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු. 43,172,397 ක මාර්ග අධීක්ෂණ ගාස්තුව 2019 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු සුපරීක්ෂණ ගාස්තු පියවීමට කටයුතු කළ යුතු වීම. |

**<u>3.8.7 මහකොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩ සටහන - ව්‍යාපෘතිය 01,02 සහ 03</u>**

| | | | |
|---|---|---|---|
| i. | ඉහත වැඩසටහන යටතේ, නාගරික පරිසරය සහ කොළඹ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට 2012 වසරේ සිට කොළඹ නගරයේ සියයට 49ක් වූ ආදායම් නොලබන ජල අනුපාතය 2020 වනවිට සියයට 18 දක්වා පහත හෙළීම, කොළඹ නගරයේ අඛණ්ඩව පැය 24 පුරා ගුණාත්මක ජල සැපයුමක් ලබාදීම, තිරසාර අපජල සේවාවක් සැපයීම ඇතුළු ආයතනික කටයුතු ශක්තිමත් කිරීම ප්‍රධාන ක්‍රියාකාරකම් අතර විය. ඒ යටතේ 2012 වන විට කොළඹ නගරයේ සියයට 49ක් වූ ආදායම් නොලබන ජල අනුපාතය 2020 වන විට සියයට 18 දක්වා අඩු කිරීම සඳහා පිළිවෙලින් ව්‍යාපෘති I, II සහ III ලෙස මහා පරිමාණ ව්‍යාපෘති තුනක් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ 2016, 2019 සහ 2020 වන විට අවසන් කිරීමට නියමිතව 2013 ,2014 සහ 2016 දී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, නියමිත දින තුළ සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් පිළිවෙලින් 2021 ජුනි 30 සහ 2022 ඔක්තෝබර් 24 දක්වා කාල දිගුවන් ලබා දී තිබුණි. | නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් මුල් විෂය පථයෙන් නල එලීමේ දුර වැඩි වීම, වෙනත් බලධාරීන්ගෙන් කැණීම් අවසර ලබා ගැනීමේ දුෂ්කරතා, අයහපත් කාලගුණය, පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් 19 වසංගතය යනාදිය සැලකිල්ලට ගනිමින් කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කිරීමට සිදු විය. | • ව්‍යාපෘති අරමුණ වූ ආදායම් නොලබන ජලය අවම කිරීම ලගා කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br>• කාල දිගුවන් ලබා දීම වෙනුවට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට පියවර ගත යුතු වීම. |
| ii. | මෙම වැඩසටහන යටතේ මුළු ආයෝජන වටිනාකම එජඩො 201.95 කට සමාන රු. මිලියන 26,422 ක් වේ. 2021 දෙසැම්බර් 31 දිනට වසර 08ක් ගත වීමෙන් පසු ඇමෙරිකානු ඩොලර් මිලියන 161ක් හෙවත් මුළු ආයෝජනයෙන් 80ක් උපයෝජනය කොට තිබුණි. කෙසේ වෙතත්, ආදායම් නොලබන ජල අනුපාතය සියයට 18 දක්වා අඩු කර කිසිදු ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් නිම කර භාර දී නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය 1 හි සමස්ත ප්‍රගතිය සියයට 96.52 ක් වන අතර ව්‍යාපෘතිය 02 හි සියයට 72.90 කි. | -එම- |
| iii. | තවද, කොළඹ නගරයේ දිස්ත්‍රික් මනු කියවීම් ඒකක 77ක් හඳුනාගෙන, එම පද්ධති පුනුරුත්ථාපනය කර, ඉහත පරිදි ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18 දක්වා අඩු කිරීමෙන් පසු මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාරදීම ප්‍රධාන වශයෙන් ඉලක්ක කර තිබුණි. | තවත් 14ක ප්‍රමාණයක් මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දීමට සූදානම්ව සිටී. | දිස්ත්‍රික් මනු කියවීමේ ප්‍රදේශ සැලසුම් කර ඇති පරිදි නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv. | තවද, ව්‍යාපෘති අංක 1 හි ණය උපයෝජනය 2022 ජනවාරි 31 වන විට අවසන් වී ඇති අතර, මෙම වැඩසටහන යටතේ ඉතිරි ව්‍යාපෘති සඳහා ණය කාලය 2022 ඔක්තෝම්බර් 24 වන විට අවසන් කිරීමට නියමිතය. ඒ අනුව, මෙම වැඩසටහන අවසන් කිරීමට මාස 10 ක් තිබියදී මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව, 2021 දෙසැම්බර් 31 වන දිනට කොළඹ නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 34.75ක් ලෙස ඉහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. තවද විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව මණ්ඩලයට කොළඹ නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 1 කින් අඩු කිරීමට හැකි වූයේ එහි ආදායම රු.මිලියන 40.03 කින් වැඩි කර ගැනීමට හැකියාව තිබුණි. කෙසේ වෙතත්, එසේ කිරීමට අපොහොසත්වීම හේතුවෙන් මණ්ඩලයට රු. මිලියන 37.43ක මෙහෙයුම් වියදමක් දැරීමට සිදුව තිබුණි. ඒ අනුව ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18 ක අපේක්ෂිත මට්ටමට අඩු කිරීමට කළමනාකාරීත්වයට නොහැකි වීම හේතුවෙන් රු. මිලියන 670.60 ක ආදායම් අහිමි වීමක් සිදුවී තිබුණි. | 2021 නොවැම්බර් 16 සිට දෙසැම්බර් 16 දක්වා කාලය සඳහා ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 30.6 කි. | ව්‍යාපෘති අරමුණ වූ ආදායම් නොලබන ජලය අවම කිරීම ලඟා කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| v. | මෙම ව්‍යාපෘති කාලය තුළ මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ සම්පූර්ණයෙන් ලබා ගැනීමට අපොහොසත් වුවද, රජය විසින් දරන ලද පොලී වියදම සහ බැඳීම් ගාස්තු වටිනාකම පිළිවෙලින් රු. මිලියන 1,124.39 ක් සහ රු. මිලියන 203.97 කි. ඊට අමතරව කිසිදු ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණද, ඉහත ව්‍යාපෘති 1, 2 සහ 3 හි ණය වාරික ගෙවීම ද රජය විසින් ආරම්භ කර තිබුණි. | (i) හි දක්වා ඇති ප්‍රධාන හේතු කාර්යසාධනයේ වේගය සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. කෙසේ වෙතත්, කොළඹ නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශත අගය මේ වන විට 22% දක්වා ළඟා වී ඇත. | බැඳීම් ගාස්තු වැලැක්වීමට ඉලක්කගත දිනයන් තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |
| | **<u>3.8.8 අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය</u>** | | |
| i. | මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ අඹතලේ ජල පවිත්‍රාගාරවල රු. මිලියන 67 කට වඩා පවතින සාමාන්‍ය මාසික බලශක්ති පිරිවැය අඩු කිරීමට අඩු කාර්යක්ෂමතාවයෙන් යුතු පැරණි පොම්ප නව පොම්ප මගින් ප්‍රතිස්ථාපනය කිරීමත් වසර 70 ත් 100 ත් අතර වන පැරණි කුඩා සම්ප්‍රේෂණ නල පද්ධතිය සඳහා ඉහළ ධාරිතාවයකින් යුත් | ජලාශය අඹතලේ ජල පවිත්‍රාගාර පරිශ්‍රයට විතැන් කිරීම, රට තුල පවතින විදේශ මුදල් හිඟය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වීම, කින්ද ඇළ පාලම ඉදිකිරීමට එරෙහිව ජනතා විරෝධය, මුදල් ලබාදීම | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පයිප්ප ප්‍රතිස්ථාපනය කිරීමෙන් සර්ෂණ පිරිවැය අවම කිරීමත්ය.ව්‍යාපෘතියේ ආයෝජන වියදම එජඩො මිලියන 70 ට සමාන රු.මිලියන 9,100 ක් වන අතර ව්‍යාපෘති කටයුතු 2014 සැප්තැම්බර් මාසයේ ආරම්භ කර වසර 4 ½ කින් 2019 ජුනි මාසය වන විට අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය එම දිනය වන විට සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් , 2023 ජුනි දක්වා මූලික සම්පූර්ණ කිරීමේ කාල සීමාවට සමාන කාල සීමාවක් සඳහා කාලය දීර්ඝ කර ගෙන තිබුණි. | තාවකාලිකව නතර කිරීම, මා.සං.අ. සීමා කිරීම්, කොවිඩ් 19 වසංගතය ආදිය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. | |
| ii. | සෑම වසරකම ප්‍රගතිය සලකා බැලීමේදී 2015දී සියයට 1.5ක්ද, 2016දී සියයට 1.82ක්ද, 2017දී සියයට 4.38ක්ද, 2018දී සියයට 3.14ක්ද, 2019දී සියයට 12.24ක්ද, 2020දී සියයට 15.38ක් සහ 2021 දී සියයට 18.57ක් ලෙස පහල ප්‍රගතියක් ලගා කර ගෙන තිබුණි. ඒ අනුව වසර 07ක් ගෙවී ගිය පසු 2021 දෙසැම්බර් 31 වන විට ලබා ගෙන තිබූ සමුච්චිත ප්‍රගතිය සියයට 56.83ක් පමණක් විය. 2021 දෙසැම්බර් 31 වන විට ප්‍රධාන කොන්ත්‍රාත්තු කිසිවක් අවසන් කර නොතිබූ බැවින්, ඉතිරි සියයට 43.17 ප්‍රගතිය වසර 1 ½ කින් 2023 ජුනි වන විට ළඟා කර ගත හැකිද යන්න සැක සහිත වේ. 2021 දෙසැම්බර් 31 දිනට මූලික සැලසුම් කල කාලයෙන් ඔබ්බට වසර 7ක් සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණය සහ මෙහෙයුම් වියදම් සඳහා වෙන් කරන ලද එජඩො මිලියන 4.19 ක ප්‍රතිපාදන ඉක්මවා එජඩො මිලියන 5.04 ක් වැය කොට තිබුණි. | ව්‍යාපෘතිය විවිධ හේතු නිසා ප්‍රමාද විය. ඒ අනුව ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කළමනාකරණය සහ මෙහෙයුම් පිරිවැය මුලින් ඇස්තමේන්තු කළ මුදලට වඩා වැඩි වී තිබුණි. | අතිරේක ව්‍යාපෘති කළමනාකරණ සහ මෙහෙයුම් වියදම් වළක්වා ගැනීමට ඉලක්කගත දිනයන් තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iii. | මීට අමතරව, ව්‍යාපෘතියේ මෙම දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සියයට 15 කට පමණක් සීමා වී තිබූ ණය මුදලේ ඌන උපයෝජනය සඳහා බැඳීම් ගාස්තු ලෙස පමණක් එජඩො මිලියන 2.19 කට සමාන රු. මිලියන 358.71 ක් රජය විසින් දරා තිබුණි. | ඉහත (i) හේතූන් මත සැලසුම් කර ඇති පුරෝකථනය අනුව කොන්ත්‍රාත්කරුවන් වෙත අරමුදල් ලබා දීමට ව්‍යාපෘතියට නොහැකි වුවද, ණය ගිවිසුමේ කොන්දේසි අනුව රජයට බැඳීම් ගාස්තු ගෙවීමට සිදුව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ ඇති ප්‍රතිපාදන තුළ මෙම අතිරේක කාර්යයේ බලපෑම අවම කිරීමට ව්‍යාපෘතිය උපරිම උත්සාහයක් ගෙන ඇත. | බැඳීම් ගාස්තු වැළැක්වීම සඳහා ඉලක්කගත දිනයන් තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv. | ව්‍යාපෘති උපදේශන සහ කළමනාකරණ පිරිවැය ඇස්තමේන්තුගත අගය ඉක්මවා තිබුණද, ව්‍යාපෘති උපදේශන සේවාව සහ ව්‍යාපෘති කළමනාකරණය ව්‍යාපෘතියේ කාර්යසාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන ආකාරයෙන් සිදු කර තිබේද යන්න විගණනයට ගැටලුකාරී වේ. | සංචලනය නොවූ ප්‍රධාන විශේෂඥයින්ගේ ඉතුරුම් වලින් උපදේශන සේවා කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදී. | උපදේශන කොන්ත්‍රාත්තු ව්‍යාපෘතියේ කාර්යසාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන බවට සහතික විය යුතු වීම. |
| | **<u>3.8.9 අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර -01</u>** | | |
| | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘති අදියර - 01 මැදවච්චිය සහ රබාව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ ආවරණය කරයි.මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකර සුරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සම්පාදන ආවරණය වැඩි කිරීම මගින් දන්ත හා දන්ත රෝග ඇති කරන මෙන්ම අස්ථි ෆ්ලෝරෝසිස් මෙන්ම නිදන්ගත වකුගඩු රෝග පැතිරීමේ ප්‍රධාන අන්තරායකර සාධකයක් වන මෙම ප්‍රදේශවල වාර්තා වන රෝගීන්ගේ ඉහළ සංඛ්‍යාවකට හේතුවන අනාරක්ෂිත දූෂිත භූගත ජලයෙන් යැපෙන ප්‍රදේශයේ මිනිසුන්ගේ සනීපාරක්ෂක තත්ත්වය සහ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා දායක වීමයි.එබැවින් සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇත. ඒ අනුව ජනතාවට ප්‍රමාදයකින් තොරව සහන සැලසීම සඳහා මෙම ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කළ යුතු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මාසයේ ආරම්භ කළ අතර එය 2018 පෙබරවාරි වන විට වසර 5ක් ඇතුළත අවසන් කිරීමට නියමිතව තිබුණි. පසුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය වසර 9කින් 2022 ජූලි 05 දක්වා දීර්ඝ කර තිබුණි. එසේ වුවද, 2022 ජූනි 30 වන විට සියයට 97.46ක භෞතික ප්‍රගතියක් පමණක් නිරීක්ෂණය වූ අතර කැබලි අක්ෂර බී ප්‍රධාන නල එලීමේ කොන්ත්‍රාත්තුවේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් එය 2022 ජූලි 31 වන දින වන විටත් නිම කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකඟ වූ ණය මුදල ඌන උපයෝජනය | 2022 ඔක්තෝම්බර් 31 වන දින කැබලි අක්ෂර බී අවසන් වනු ඇත. ප්‍රදානය කිරීමේ ප්‍රමාදයට අමතරව, ගෙවීම් කිරීමේ ගැටළු, කොවිඩ් 19, පාස්කු ඉරිදා ප්‍රහාරය ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීමට බලපෑවේය. තවද, ජයිකා විසින් ආපසු ගෙවීමේ කොන්දේසි වෙනස් නොකර ණය ලබා දීමේ කාලය 2022 ජූලි දක්වා දීර්ඝ කර ඇත. | • ව්‍යාපෘතියේ අරමුණ ලගා කර ගැනීම සඳහා නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br>• කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සම්පූර්ණයෙන්ම උපයෝජනය කර ඇති බවට සහතික විය යුතු වීම.<br>. |

හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 45.68 ක් ගෙවා තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත රජයේ සහ මහජන අරමුණු ලගා කර ගැනීමකින් තොරව මෙන්ම ව්‍යාපෘතිය අවසන් කිරීමට හා එකඟ වූ ණය මුදල සම්පූර්ණයෙන් භාවිතා කිරීමට පෙර 2021 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 994.38 ක ණය මුදල ආපසු ගෙවා තිබුණි.

**3.8.10 සැමට ජලය ව්‍යාපෘතිය**

ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සැමට ප්‍රවේශ විය හැකි පිරිසිදු ජල ආවරණය ඉහළ නැංවීම සඳහා සැමට ජලය වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් "සමස්ත ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු" සහ වෙනම කාර්ය මණ්ඩලයක් සහිත වෙනම ඒකකයක් ස්ථාපිත කර තිබුණි. ඔවුන්ගෙන් සමහරෙක් කොන්ත්‍රාත් පදනම මත අලුතින් බඳවා ගත් අය වන අතර ඔවුන්ගෙන් සමහරක් මණ්ඩලයේ දැනට සිටින කාර්ය මණ්ඩලයෙන් නිදහස් කර තිබුණි. 2022 ජූලි මස අවසන් වන විට සිදු කරන ලද විගණන පරීක්ෂාවට අනුව, පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

i. 02/2020 දරන 2020 ඔක්තෝබර් 26 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කිසිදු අනුමැතියකින් තොරව 2021 සැප්තැම්බර් 13 වැනි දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පමණක් පදනම්ව 2021 සැප්තැම්බර් 27 සිට ආරම්භ වන වසරක කොන්ත්‍රාත් කාලයකට මණ්ඩලයේ විශ්‍රාමික අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු ඔහුගේ විශ්‍රාම යාමේදී මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස පත් කර තිබුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ කිසිදු අනුමැතියකින් තොරව අංක 01/2019 දරන හා 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 3.2 ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකුට හිමිවන පුද්ගල පඩිනඩි ප්‍රමාණයද ඉක්මවා යමින් ඔහු විසින් දරන ලද අවසන් තනතුරේ

මෙම ව්‍යාපෘතිය සඳහා, ඉදිකිරීම් අධීක්ෂණ පිරිවැය අවම කිරීමට මණ්ඩලය විශේෂ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ස්ථාපිත කර නැත. නමුත් ව්‍යාපෘතිය නිර්මාණය කිරීමට සම්බන්ධ විශ්‍රාමික අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු බඳවා ගන්නා ලදී. ව්‍යාපෘතිය අධීක්ෂණය, පාලනය සහ පරිපාලනය අතරතුර සැලසුම් සහ ටෙන්ඩර් ලේඛන සම්පූර්ණ කරවා ගැනීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම, ඉල්ලූ මුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම, අධීක්ෂණය කිරීමේදී අදාළ සියළුම පාර්ශ්වකරුවන් සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය කිරීමට ඔහුට වගකීමක් ඇත. ව්‍යාපෘතියේ වටිනාකම 3,060 ක් පමණ වන

බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගෙන ඇති බවට සහතික විය යුතු වීම.

| | | | |
|---|---|---|---|
| | මාසික වැටුපට සමාන මාසික වැටුපක් සහ අනෙකුත් දීමනා ගෙවීමට ඉහත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව එවැනි අනුමත නොකළ තනතුරක් සඳහා 2022 ජූනි මස අවසානය වන විට රු. 4,395,955 ට සමාන මුදලක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියේ සමස්ත ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට මණ්ඩලයේ අනෙකුත් සමාන ස්වභාවයේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට පැවරී ඇති රාජකාරි සහ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය නොවූ බවත් සම්බන්ධීකාරක ලෙස පමණක් කටයුතු කොට ඇති බවත් විගණනයේදී අනාවරණය විය. එබැවින් මණ්ඩලය විසින් දරන ලද වියදමට ඉහත නිලධාරියාගේ අගය එකතු කිරීම විගණනයේදී මතභේදකාරී වේ. | බැවින් ඉහළ අතිරේක සාමාන්‍යාධිකාරී පළපුරුද්දක් ඇති අයෙකු බඳවා ගැනීම ඉතා යෝග්‍ය වන අතර ඉහත සමස්ත ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා එම වැටුපටම ඔහුව බඳවා ගැනීමට මණ්ඩලය තීරණය කරන ලදී. | |
| ii. | විගණනයට ලද තොරතුරුවලට අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා මණ්ඩලයේ දැනට සිටින ස්ථිර කාර්යමණ්ඩලයේ නිලධාරීන් 6 දෙනෙකු අනුයුක්ත කර ඇති අතර, මණ්ඩලයේ තවත් නිලධාරීන් හත් දෙනෙකු ආවරණ පදනම ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඊට අමතරව, අනුමත කාර්යමණ්ඩයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට/ පිරවීමට අනුකූලව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2020 ඔක්තෝබර් 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 හි 02 (ii) වගන්තියට පටහැනිව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 176ක් මෙම ව්‍යාපෘතියට බඳවාගෙන තිබූ අතර 2022 ජූලි 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 211.88 ක මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| iii. | වරාය වෙත ආනයනය කරන ලද එච්ඩීපීඊ, ඩීඅයි සහ පීවීසී පයිප්ප නිදහස් කිරීමට අරමුදල් තිබේදැයි සහතික කිරීමට හෝ සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කර නැව්ගත කිරීම ප්‍රමාද කිරීමට මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වය අපොහොසත් වීම හේතුවෙන් 2022 ජූනි මස අවසානය වන විට භාණ්ඩාගාර අනුමැතියයකින් තොරව ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 33.3ක් මණ්ඩලයට දැරීමට සිදුව තිබුණි. ඊට අමතරව 2022 ජූලි මාසය අවසන් වන විටත් වරායට පැමිණ තිබූ තවත් බහලුම් 207ක් මුදා හැරීමට | සැමට ජලය ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රවාහය භාණ්ඩාගාරය විසින් තහවුරු කරන ලදී. නමුත් රටේ පවතින වත්මන් මූල්‍ය හා ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 පෙබරවාරි මාසයේ සිට අරමුදල් සැපයීමට භාණ්ඩාගාරයට නොහැකි විය. එම නිසා දේශීය හා විදේශීය මුදල් රට තුළ නොතිබීම හේතුවෙන් වරායෙන් පයිප්ප නිදහස් කර ගැනීමට මණ්ඩලයට | ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු වලට එළඹීමට පෙර අරමුදල් ඇති බව සහතික කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඉහළ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. විගණනයට ලද තොරතුරුවලට අනුව ඒවා නිදහස් කර ගැනීම සඳහා ප්‍රමාද ගාස්තු ලෙස 2022 ජුලි මස අවසානය වන විට රු. මිලියන 813.12 (ආසන්න වශයෙන්) ගෙවීමට සිදුවේ. කෙසේ වෙතත්, එසේ ආනයනය කරන ලද කිසිදු ඩීඅයි පයිප්පයක් 2022 ජුලි මාසය අවසන් වන විටත් එළිමේ කටයුතු සඳහා භාවිතා කර නොතිබූ බවත්, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන දහයක් (10) යටතේ වූ ගබඩා සඳහා නිකුත් කර ඇති එච්ඩීපීඊ පයිප්පවලින් සියයට 40කට වැඩි ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන 2022 ජුලි මස අවසන් වන විටත් ඉතිරිව තිබූ බවත් නිරීක්ෂණය විය.ෙ ඒ හා සමානව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන හයකට ලබා දී තිබූ වර්ග 12 ක විෂ්කම්භයෙන් යුතු එච්ඩීපීඊ පයිප්ප මීටර් 173087 ක් 2022 ජුලි මාසය අවසන් වන විටත් උපයෝජනය කර නොතිබුණි. | නොහැකි විය. එබැවින් මණ්ඩලයට ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු විය. නල සැපයීම ප්‍රමාද වීම නිසාත්, භාණ්ඩාගාරය එකඟ වූ පරිදි අරමුදල් ලබා නොදීම නිසාත්, නළ එළීමේ කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගෙවීමට හා බිල්පත් ගෙවීමට මණ්ඩලයට නොහැකි වූ අතර, සැලසුම් කළ පරිදි නළ එළීමේ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට නොහැකි විය. | |
| iv. | තවද අහඹු විගණන පරීක්ෂාවන්ට අනුව, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කොට ඇති බොහෝ එළිමේ කොන්ත්‍රාත්තු 2022 ජුනි මාසය අවසන් වන විටත් ආරම්භ කර නොතිබූ බවත් දැනටමත් ප්‍රදානය කොට ඇති කොන්ත්‍රාත්තුවල කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොමැති බවත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | • ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ අධීක්ෂණය සහතික කල යුතු වීම.<br>• ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

### 3.9 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දින අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය හා 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන අත්පොතෙහි 3.5 වගන්ති වල විධිවිධානයන්ට පටහැනිව 2021 දෙසැම්බර් 31 දින වන විට සේවකයින් විසි එක් දෙනෙකු (21) රේඛීය අමාත්‍යාංශයට මුදා හැර ඇති අතර ඔවුන් වෙනුවෙන් මණ්ඩලය විසින් | අමාත්‍යාංශයේ ඉල්ලීම්ද සැලකිල්ලට ගෙන මණ්ඩලයේ සේවකයන් කිහිප දෙනෙකු අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇත. මෙම සේවකයින් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ඔවුන්ගේ වැටුප් ප්‍රතිපූර්ණය කළ නොහැකි බව අමාත්‍යාංශය විසින් දැනුම් දෙන ලදී. | වෙනත් ආයතන වල සම්පත් නිදහස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ වලට අනුකූල වන බවට සහතික විය යුතු වීම. |

සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 28.73ක් වැය කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2021 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද සේවකයින් සඳහා රු.මිලියන 216.12ක් ජල සම්පාදන අමාත්‍යංශය විසින් ප්‍රතිපූර්ණය කරනු ඇත. තවද, උක්ත සඳහන් කාල පරිච්ඡේදය තුලදී මෝටර් වාහන හයක්ද (6) රේඛීය අමාත්‍යංශය වෙත නිදහස් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී එම වාහන වල ආදායම් බලපත්‍ර හා රක්ෂණය සඳහා රු.245,848ක වියදමක් දරා තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය මෙහෙයුම් අත්පොතෙහි 3.4 (ii) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03ක අනාගත සේවා ධාරිතාවයක් ඇති ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කිරීමට හැකි වන පරිදි මණ්ඩලයව විසින් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි. | මානව සම්පත් කළමනාකරණය අංශය විසින් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කොට කාල පරිච්ඡේදය අවසානයේදී එහි ප්‍රගතිය වාර්තා කරනු ඇත. | ප්‍රධාන විධායක නිලධාරීන් පත් කිරීමට හැකි වන පරිදි අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ වලට අනුකූල වන බවට සහතික විය යුතු වීම. |
| ii. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාක්ෂණික නොවන) සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් යන උපායමාර්ගික මට්ටමේ තනතුරු ද කළමනාකරුවන්, ප්‍රධාන ගණකාධිකාරීවරුන්, ඉංජිනේරු (යාන්ත්‍රික), ඉංජිනේරු (විදුලි), ඉංජිනේරු (සිවිල්) ආදි ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරු ද මධ්‍යම මට්ටමේ තාක්ෂණික (එම්.එල්.ටී.) ලිපිකරු සහ වෙනත් පුහුණු ශ්‍රේණි ආදී ඇතුළත්ව පුරප්පාඩු 1739 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි. | සහකාර සාමාන්‍යාධිකාරී (විගණන) තනතුර සඳහා බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය සකස් කොට අනුමැතියට ඉදිරිපත් කර ඇත. කළමණාකරු (මානව සම්පත්) තනතුර නුදුරේදීම පුරවනු ලැබේ. ප්‍රධාන ගණකාධිකාරී තනතුරු උසාවි තීරණයෙන් පසුව පුරවනු ලැබේ. අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මඟින් ප්‍රාථමික මට්ටමේ තනතුරු බඳවා ගැනීම් තහනම් කර ඇති බැවින් දිගු කාලයක් යන තුරු ප්‍රාථමික මට්ටමේ තනතුරු පිරවිය නොහැක. | මණ්ඩලයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හෝ සේවා අවශ්‍යතාවය නිසි ලෙස ඇගයීමෙන් පසු අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම. |
| iii. ප්‍රාථමික මට්ටමේ අනුමත නොවන තනතුරු තුනක් සඳහා ස්ථිර පදනම මත සේවකයින් 23 දෙනෙකු බඳවාගෙන ඇති අතර අනුමත තනතුරු | 2025 දී සැමට ජලය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ | අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | 18 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා යමින් සමාලෝචිත වර්ෂයේදී සිවිල් ඉංජිනේරුවන් 14ක්, ප්‍රමාණ සමීක්ෂක 17 ක් ඉංජිනේරු සහකාර 45ක් බඳවා ගෙන තිබුණි. | ඉංජිනේරු හා කාර්මික අංශයේ සේවය කරන නිලධාරීන් ප්‍රමාණවත් නොවන බැවින් ඉංජිනේරු හා කාර්මික අංශයේ නිලධාරීන් කිහිප දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ දක්වා ලැබී නොමැත. | ක්‍රියාමාර්ග ගත යුතු වීම හා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීමේදී කාර්ය මණ්ඩල අනුමැතීන් ලබා ගත යුතු වීම. |
| iv. | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.2(i) වගන්තියෙහි දක්වා ඇති පරිදි බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මේ වන විට වෘත්තීය සමිති විසින් ඉදිරිපත් කරන ලද කරුණු ඇතුලත් කර අවසන් පෝරමය සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අමාත්‍යාංශය විසින් 2022 ජුනි 06 දින ලබා ගෙන ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා පියවර ගත යුතු වීම. |
| v. | මණ්ඩලයේ පවත්නා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනිව 2018 මණ්ඩල ගණකාධිකරී (මණ්ඩල ශ්‍රේණි 07) සඳහා අභ්‍යන්තර බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට අතිරේක සමාන්‍යාධිකාරී (මානව සම්පත්) විසින් 2015 දෙසැම්බර් 07 දින පළ කරන ලද දැන්වීමේ බාහිර සුදුසුකමක් වන වාණිජවේදී උපාධිය සමඟ පිලිගත් ගණකාධිකරණ ආයතනයක ගණකාධිකරණය පිලිබඳව වසර දෙකක පළපුරුද්ද තිබීම අවශ්‍ය සුදුසුකමක් ලෙස ඇතුලත් කර තිබුණි. එබැවින් දැනටමත් අවශ්‍ය කරන සුදුසුකම් සපුරා ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම තනතුර සඳහා තෝරා ගැනීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | සේවකයන් අධෛර්යයට පත් විය හැකි අතර සේවකයින්ගේ අභිප්‍රේරණය බිඳී යා හැකි බැවින් 2015 දී අයදුම්පත් කැඳවීමේදී බාහිර සුදුසුකම අභ්‍යන්තරව සලකා බැලීමට තීරණය කර ඇත. | සියලුම බඳවා ගැනීම් හා උසස් කිරීම් මණ්ඩලයේ පවත්නා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය මත පදනම්ව ක්‍රියාත්මක වන බවට සහතික විය යුතු වීම. |
| vi. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත පදනම්ව මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරක් වන සමාජ විද්‍යාඥ (මණ්ඩල ශ්‍රේණි VIII) තනතුර සඳහා සාමාන්‍ය උපාධියක් සහිත වර්තමානයේ සමාජ විද්‍යාඥ (මණ්ඩල ශ්‍රේණි VI) තනතුර දරන සේවක අංක 2023334 දරන නිලධාරිනිය 2006 අප්‍රේල් 03 දින මුලින්ම පත් කර තිබුණි. කෙසේ නමුත් මණ්ඩලයේ පවත්නා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව සමාජ විද්‍යාඥ | මෙම නිලධාරිනියට සාමාන්‍ය උපාධියක් ඇති බැවින් මණ්ඩල ශ්‍රේණි 08 සඳහා බඳවා ගෙන ඇත. කෙසේ නමුත් මණ්ඩලයේ පවත්නා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව ශ්‍රේණි උසස් වීම් ලබා දිය නොහැක. තවද සානුකම්පිතව සලකා බලා ඇයට පුද්ගලික වන සේ | සේවකයන් බඳවා ගැනීමේ දී අවශ්‍ය සුදුසුකම් සපුරාලන බවට සහතික විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | (මණ්ඩල ශ්‍රේණි 07) තනතුර සමාජ විද්‍යාව පිලිබඳ විශේෂ උපාධියක් සහිත බාහිර බඳවා ගැනීමක් විය යුතුය. පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සලකා බැලීමකින් තොරව ජල සම්පාදන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම්වරයා කරන ලද ඉල්ලීමකට අනුව ඉහළ කළමනාකරණයේ පක්ෂග්‍රාහී තීරණයන් හුවා දක්වමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියෝග හා මණ්ඩලයේ පවත්නා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනිව මෙම නිලධාරිනියට පුද්ගලික වන සේ MM-1 (ii පන්තිය) යටතේ මණ්ඩල ශ්‍රේණි VI සමාජ විද්‍යාඥ I තනතුර සඳහා උසස් කර තිබුණි. | JM 1-2 වැටුප් කාණ්ඩය යටතේ මණ්ඩල ශ්‍රේණි VII හා VI සඳහා උසස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබා දී ඇත. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති නමුත් මේ වන තෙක් ලැබී නොමැත. | |
| vii. | සේවක අංක 2066581(රාජකාරි ආවරණ) හා 2076640 දරණ මනුසටහන් කරුවන් දෙදෙනා මනුසටහන් රාජකාරි අතරතුර සිදු කරන ලද විෂමාචාර ක්‍රියා හේතුවෙන් මූලික විමර්ශනයෙන් පසුව ඔවුන් පිළිවෙලින් මනුසටහන් රාජකාරි වලින් ඉවත් කිරීම හා වැඩ තහනම් කිරීම සිදු කොට ඇත. කෙසේ වෙතත් මණ්ඩලයේ විනය සංග්‍රහයේ 3.1.1. වගන්තියට පටහැනිව ජල සම්පාදන අමාත්‍යවරයාගේ ඉල්ලීම මත පදනම්ව මනුසටහන් විෂමාචාර හේතුවෙන් මණ්ඩලයට සිදු වූ අලාභ අය කර ගැනීමකින් තොරව ඔවුන් නැවත සේවයේ පිහිටුවා තිබුණි. | නොසැලකිලිමත් ලෙස බිල්පත් සටහන් කිරීම සම්බන්ධයෙන් ආවරණ රාජකාරි සඳහා පත් කර ඇති නිලධාරියාට සමාව දී ඇත. ඔහු සම්බන්ධයෙන් මේ වන තෙක් පැමිණිලි ලැබී නොමැත. අනෙක් නිලධාරියාගේ ඉල්ලීම සානුකම්පිතව සලකා බලා ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමේ තීරණයට යටත්ව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම) යටතේ නැවත සේවයේ පිහිටුවා ඇත. | මණ්ඩලයේ විනය සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව වැරදි සිදු කළ මනුසටහන් කරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| viii. | පසුගිය වසර පහ තුළ එක් සේවකයෙකුගේ මුළු පිරිවැය පහත පරිදි වේ. | අදහස් දක්වා නොතිබුණි. | කාර්යමණ්ඩල පිරිවැය හැකිතාක් පාලනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |

| **වර්ෂය** | **මුළු සේවක සංඛ්‍යාව** | **මුළු සේවක පිරිවැය රු. මි.** | **එක් සේවකයෙකු සඳහා පිරිවැය රු.මි.** |
|---|---|---|---|
| 2017 | 10338 | 11,575.10 | 1.12 |

| | | | |
|---|---|---|---|
| 2018 | 10022 | 12,863.07 | 1.28 |
| 2019 | 10104 | 12,862.19 | 1.27 |
| 2020 | 9736 | 12,841.0 | 1.31 |
| 2021 | 9336 | 16,416.85 | 1.76 |

ඒ අනුව පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී ඒකක සේවක පිරිවැය සියයට 34කින් ක්‍රමිකව වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2020-2025 සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ "සැමට ජලය" සංකල්පය සමඟ ඒකාබද්ධව වසර සඳහා 301,762 ක නව සම්බන්ධතා ඉලක්කයක් ස්ථාපිත කර තිබූ අතර පසුව එම ඉලක්කය වසර තුළදී 215,000 දක්වා සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළ නව සම්බන්ධතා 192,087ක් ලබා දී තිබුණි. එසේ වුවද, පෙර වසරට සාපේක්ෂව නව සම්බන්ධතා සංඛ්‍යාව සියයට 56 කින් වැඩි වී තිබුණද. 2019 සිට 2020 දක්වා වර්ධනයට සාපේක්ෂව 0.06 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරන පෙර වසරට සාපේක්ෂව මනුගත අලෙවි ආදායම වැඩි වී ඇත්තේ සියයට 0.1 කින් පමණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය තුළ විශාල මලාපවහන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක වන අතර, ඒ වන විටත් මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘති තුනක් අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, වසර අවසානයේදී මුළු ජනගහනයෙන් සියයට 2.08 ක ආවරණයක් පමණක් සැපයීමට මණ්ඩලයට හැකි වූ අතර සියයට 2.1 ක පෙර වසරේ ඉලක්කය පවා සපුරා ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබූ බව එයින් පෙන්නුම් කරයි. | එක් සම්බන්ධතාවකට ගෘහස්ථ පරිභෝජනය අඩු මට්ටමක තිබීම හේතුවෙන් බිල්පත් ආදායම වැඩි වී නොමැත. වසංගත තත්ත්වය හේතුවෙන් ගෘහස්ථ නොවන ආයතන බොහොමයක් ජලය අඩුවෙන් පරිභෝජනය කර හෝ පරිභෝජනය කර නොමැති අතර 2021 වසර අග භාගයේදී නව සම්බන්ධතා වලින් 50% කට වඩා ලබා දී ඇත. තවද, සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් නොමැතිකම සහ කොවිඩ් වසංගතය හේතුවෙන් මලාපවහන ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | සංයුක්ත සැලැස්මට ඇතුළත් ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | සංයුක්ත සැලැස්මට අනුව කොළඹ දිස්ත්‍රික්කයෙන් පිට මලාපවහන ව්‍යාපෘති නවයක් (09) ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වු අතර වර්ෂය සඳහා රු. බිලියන 790 කට සමාන මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු මලාපවහන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් අපේක්ෂිත මලාපවහන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | වර්ෂය ආරම්භයට පෙර අනුමැතිය ලබා ගත යුතුව තිබුණද, 2021 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර තිබුණේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කර මාසයකට පසු 2022 පෙබරවාරි 01 දිනදීය. | වර්ෂය සඳහා අනුමත අයවැය ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ලැබුණේ 2020 දෙසැම්බර් 21 වැනි දිනදීය. අනුමත අයවැය ලැබී දින දහයක් ඇතුළත ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලසුම් 2022 පෙබරවාරි 01 වන දින ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර ඇත. | වර්ෂය ආරම්භ කිරීමට පෙර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමත කළ යුතු වීම. |
| ii. | මණ්ඩලය විසින් සපයනු ලබූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ විදේශීය මූල්‍යාන ජල සම්පාදන ව්‍යාපෘති විසි දෙකක් (22) ක්, දේශීය මූල්‍යාන ජල සම්පාදන ව්‍යාපෘති එකොළොස් (11) ක් සහ මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘති තුනක් (03) ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත්, ඒ අතරින් ව්‍යාපෘති විසිපහකින් (25) අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | කොවිඩ්-19 වසංගතය, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ගැටලු, ආනයන සීමා කිරීම්, අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් යනාදිය හේතුවෙන් ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වී ඇත. | සමාලෝචිත වර්ෂය අවසානයේ දී අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| iii. | 2021 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, මහා පරිමාණ විදේශ අරමුදල් ව්‍යාපෘති පහක්, බිලියන 3.5 ක ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඇතුළුව දේශීය | කොවිඩ් 19 වසංගත ව්‍යාප්තය, පවතින ජල නල වල නිවැරදි ඉදිකිරීම් සැලසුම් නොමැති වීම, අනපේක්ෂිත භූගත උපයෝගිතා සහ කොළඹ මාර්ගවල අධික වාහන තදබදය, ගොවි විරෝධයන්, | -එම- |

| | | | |
|---|---|---|---|
| | බැංකු අරමුදල් ව්‍යාපෘති හයක් සහ උපයෝගිතා මාරු කිරීමේ වැඩසටහන යටතේ උතුරු, මධ්‍යම සහ ඌව පළාත්වල ක්‍රියාත්මක ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | අනපේක්ෂිත ගල්, අහිතකර කාලගුණික තත්ත්වයන්, මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ගැටළු සහ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය යනාදිය මෙම ප්‍රමාදයන්ට හේතු විය. | |
| iv. | සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති නවයක් (09) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. | මූල්‍ය සීමාවන් හේතුවෙන් 2021 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වූ ඉහත ව්‍යාපෘති ආරම්භ කර නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

**4.3 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | අභ්‍යන්තර විගණන අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් හතර (4) සහ ඉංජිනේරුවරයෙකු ඇතුළු පුරප්පාඩු දාහතක් (17) 2022 ජූලි 31 වන විටත් පුරවා නොතිබුණි. | අධිකරණයේ පවතින නඩු නිසා ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුරු පිරවීමට නොහැකි විය. සහකාර සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සහ උසස්වීම් පටිපාටිය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ප්‍රමාණ සමීක්ෂක පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. | පුරප්පාඩු නොපමාව පිරවීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | දේශීය හා විදේශීය අරමුදල් යොදවන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි. තවද, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන, අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර –ii, කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය, මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ විදේශ මූල්‍යාන ව්‍යාපෘති කිහිපයක ගනුදෙනු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛයේ අවශ්‍යතා පරිදි වර්ෂය තුළ මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් වී නොතිබුණි. | ගෙවීම් සහ තත්ත්ව පාලනය, ජල පවිත්‍රාගාර සහ බෙදාහැරීමේ ජාල ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ ප්‍රාදේශීය මට්ටමින් අනෙකුත් මාර්ගගත ක්‍රියාකාරකම් අනුව නව ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ තාක්ෂණික විගණනයන් සිදු කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන අංශයට සහ ප්‍රා.සේ.ම. වලට ඉංජිනේරු සහකාරවරුන් 10 දෙනෙකු දැනටමත් පත් කර ඇත. | මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශයට ප්‍රමාණවත් විගණන කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතු අතර කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුගත විය යුතු වීම. |

**4.4** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය සහ සත්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 13 සිට සියයට 214 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එබැවින් අයවැය කළමනාකරණයේ ඵලදායී මෙවලමක් ලෙස භාවිත කර නොමැති බව නිරීක්ෂණය විය. | පසුගිය වසරේ පැවති කලබලකාරී ආර්ථික තත්ත්වය හේතුවෙන් වෙනස විශාල විය. කෙසේ වෙතත්, ලබන වසරේ අයවැය සකස් කිරීමේදී ඒවායේ වෙනස්කම් සැලකිල්ලට ගනු ලැබේ. | අයවැය ඵලදායී පාලන යාන්ත්‍රණයක් ලෙස භාවිතා කිරීම සඳහා අයවැයගත සහ සැබෑ ආදායම සහ වියදම් අතර සැලකිය යුතු විචලනයන් අවම කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

**4.5** **තිරසාර සංවර්ධන අරමුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත් වීමෙන් අනතුරුව විශ්වීය හා | 2020 – 2025 සංයුක්ත සැලැස්ම සැමදෙනාටම සුරක්ෂිත පානීය නල ජලය සඳහා ප්‍රවේශ වීමේ අයිතිය සහතික කිරීම සඳහා වූ රජයේ පෙරොන්දුවට සමාන්තර | අදාල ඉලක්ක කරා ළඟා වීමට මෙන්ම කාර්ය සාධනය ඇගයීම සඳහාත් තිරසර සංවර්ධන අරමුණු |

| | | | |
|---|---|---|---|
| | සාධාරණ ලෙස සැමට සුරක්ෂිත හා දැරිය හැකි ලෙස පානීය ජලය සඳහා ප්‍රවේශ වීම සහ ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා දීම, කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ හා අවදානමට ලක්විය හැකි තත්ත්වයන්හි සිටින අයගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම 2030 තිරසාර සංවර්ධන අරමුණු ලෙස මණ්ඩලය හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, කාර්යසාධනය ඇගයීම මෙන්ම ඊට අදාල ඉලක්ක ළඟා කර ගැනීමේදී එහි විෂය පථයට අයත් අනෙකුත් අරමුණු, ඉලක්ක සහ සංඛ්‍යාන දත්ත හඳුනා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තව ද, 2021 වර්ෂය අවසාන වන විටත් තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මාර්ගෝපදේශයක් නිකුත්කර නොතිබුණි. | ලෙස සකස් කර ඇත. 2020 – 2025 සංයුක්ත සැලැස්මට අනුව මණ්ඩලය විසින් සියයට 79 ක පානීය නල ජල සැපයුම් ආවරණයක් ලබා දීමට සැලසුම් කර තිබුණි. තවද, 2021 වසරේදී නව සම්බන්ධතාවල කැපී පෙනෙන ජයග්‍රහණයක් අත්කර ගත් බව සටහන් විය. | විෂය පථය යටතට එන අනෙකුත් අරමුණු, ඉලක්ක හඳුනාගැනීම සඳහා සංඛ්‍යා ලේඛන දත්ත හඳුනාගැනීමටත් තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ හා මග පෙන්වීම් නිකුත් කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| ii. | මණ්ඩලයට අදාල දර්ශක සම්බන්ධයෙන් සියළු පාර්ශවයන් නියෝජනය කරන දත්ත වෙන් කිරීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් 2022 මාර්තු 31 වන විටත් හඳුනාගෙන නොතිබුණි. | සංයුක්ත අභිප්‍රාය ප්‍රකාශය, ආයතනික ප්‍රතිඵල රාමුව, දත්ත සහ තොරතුරු වැනි ප්‍රගති වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ අදාළ අමාත්‍යාංශ වැනි බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා ඉල්ලුම් මත පදනම්ව ලබා දෙන ලදී. | අධීක්ෂණ කාර්යයන් සඳහා අවශ්‍ය සන්දිස්ථාන හඳුනා ගැනීමටත් දත්ත වෙන් කිරීමට සහ දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමටත් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට ක්‍රියා කළ යුතු වීම. |
| iii. | තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලව 2019 දී රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරන ලද ඉලක්කවලට අනුව, 2020 වර්ෂයේදී මලාපවහන ආවරණය සියයට 2.25 දක්වා සහ 2025 වර්ෂයේදී සියයට 4 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සැබෑ මලාපවහන ආවරණය 2.08 ට | ප්‍රධාන ක්ෂේත්‍ර සාක්ෂාත් කර ගැනීම සඳහා සනීපාරක්ෂක ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සිදු වෙමින් පවතී. | ප්‍රමාදයකින් තොරව කලින් තීරණය කළ සනීපාරක්ෂක ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

පමණක් සීමා විය. තවද, 2025 වන විට ජනගහනයෙන් සියයට 90 ක් ආරක්ෂිත කළමණාකරන සනීපාරක්ෂක පහසුකම් භාවිතා කිරීමට සහ 2025 වන විට පළාත් පාලන ආයතනවලින් සියයට 25කට ප්‍රතීක ප්‍රතිකාගාර මධ්‍යස්ථාන පහසුකම් ඇති බව සහතික කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉහත ඉලක්කවලට අනුව මණ්ඩලයේ තාක්ෂණික සහාය අපේක්ෂා කළද,මණ්ඩලය විසින් ඒ සඳහා කිසිදු කැපී පෙනෙන ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.